බෙලොරුසියානු යොවුන් කතා

කොක්කු පරති අහස් තලේ

පරිවර්තනය
මහින්ද සෙනරත් ගමගේ



කොක්කු සරති අහස් තලේ

(බෙලෝරුසියානු යොවුන් කතා)

පරිවර්තකගෙ වෙනත කෘත

සාහිත්‍ය පරිවර්තන

දොන් නදිය නිසලව ගලා බසී - පළමුවැනි කාණ්ඩය - 2000
(හොඳම ප්‍රකාශිත කෘතිය ලෙස 2001 යෞවන සම්මාන)
දොන් නදිය නිසලව ගලා බසී - දෙවැනි කාණ්ඩය - 2002
දොන් නදිය නිසලව ගලා බසී - තෙවැනි කාණ්ඩය - 2006
දොන් නදිය නිසලව ගලා බසී - සිව්වැනි කාණ්ඩය - 2006
චේ- සටන් සගයින්ගේ ඇසින් - 2005
(සුසන්ත රන්ජන් ගමගේ සමඟ)
කලින් නික්මුණු වසන්තය - 2006
නිසල උයන - 2007
කොක්කු සරති අහස් තලේ - 2010

ළමා සහ යොවුන් සාහිත්‍ය පරිවර්තන

පුරු පුරු දඟ කරන්නෙ නෑ - 2003
කොට්ටෝරු පුංචා - 2005
සීයාගේ ගෙදර ගිහින් - 2006
හැංගි මුත්තො හැංගියෝ - 2006
පුංචි පුතුට වැඩ කන්දයි - 2006
පළමු මාළුවා - 2007
පටලැවිල්ල - 2008
රණ්ඩුව හොඳ නැමයි - 2008
ඉත්තැවගෙ අත්මේස් - 2008
මාෂා සහ වලසා - 2008
ඔරලෝසුවෙ කතන්දරේ - 2008
සතුන් දිහා බලා ඉගෙන - 2008
වලස් පුතා දඟකාරයි - 2008
කෝල්යාගෙ දින පොත - 2008
කවුද කවුද ශක්තිමත් ම - 2008
මෙවලම් නැතිව ගෙවල් තනන්නෝ - 2008
යන්තරයට උගන්වන්න - 2008
පුංචි පුංචි පැටව් (සංස්කරණය) - 2008
අලෙයෝනා අක්කයි-ඉවාන් මල්ලියි (සංස්කරණය) - 2008
සුළැඟිලි පුතා - 2009

මිෂ්කාගේ කැඳ හැළිය - 2010
මහ පොළොවේ රහස් සොයන්නෝ - 2010

වෙනත් පරිවර්තන

ඩියෙන් බියෙන් පූ මහ සටන - 2006
සාහිත්‍යය හා කලාව - මාඕ සේතුං - 2007
පක්ෂයේ වැඩ ශෛලිය පිරිපහදු කිරීම - මාඕ සේතුං - 2010

සංස්කරණ

දයලෙක්තික භෞතිකවාදය - 2007
නිෂ්මි - සැඩ සුළඟ සහ මඳ පවන - 2008

කාව්‍ය (ස්වතන්ත්‍ර)

භුගත සහෝදර සංදේශය - 2006

(බෙලෝරුසියානු යොවුන් කතා)

කොක්කු සරති අහස් තලේ

මහින්ද සෙනරත් ගමගේ

සයුරි ප්‍රකාශන
102/176, මත්තෙගොඩ නිවාස සංකීර්ණය පාර,
මත්තෙගොඩ
071 5181421

කොක්කු සරති අහස් තලේ

ප්‍රථම මුද්‍රණය 2010

පරිවර්තනය © මහින්ද සෙනරත් ගමගේ

ISBN 978-955-1889-19-7

මුද්‍රණය

සයුරි මුද්‍රණ

102/176, මත්තෙගොඩ නිවාස සංකීර්ණය පාර,

මත්තෙගොඩ.

ප්‍රකාශනය

සයුරි ප්‍රකාශන

102/176, මත්තෙගොඩ නිවාස සංකීර්ණය පාර,

මත්තෙගොඩ.

පිදුම..

තමන්ගේ රටට,
මුළු මහත් ලෝකයට
සහ
මනුෂ්‍යත්වයට
සම්මානයක් වී
හැදෙන්නට සිටින
දූ දරු පරපුරට. .

නිල් නෙත් ඇති බිමක්

මහ පොළොවේ ඇස් විල් බව මිනිස්සු කියති. සෝවියට් දේශයේ සමූහාණ්ඩු පහළොවෙන් එකක් වන මගේ බෙලෝරුසියාවේ විල් 11,000 ක් තිබේ. ඒවා පිණිබිඳු සේම නිල් පැහැතිය, පැහැදිලිය, එසේම කණ්නාඩියක් සේ සංසුන්ය.

මගේ සමූහාණ්ඩු ලාංඡනයෙහි දිදුලන නිල් පැහැ ජ්ලැක්ස් මල් විදහා දක්වෙයි. මල් පිපුණු අති මහත් ජ්ලැක්ස් යායන් සිතින් මවා ගන්න. බොහෝ ගණනක් නිල් පැහැ ඇස් පැහැදිළි අහස දෙස මගේ බෙලොරුසියාව මතින් බලා සිටී.

ඔබට බෙලෝරුසියානුවෙකු මුණ ගැසුණු විට, ඔහුට නිල් පැහැ ඇස් තිබීමේ අවස්ථාවක් ද තිබේ. සමහරවිට ඒ ඇස් නිල් විල්වල, ගංගාවල, ජ්ලැක්ස් මල්වල හා ෆොගෙට්-මි-නොට් මල්වල, මෘදු නිල් අහසෙහි පරාවර්තනයක්ද? සමහරවිට එය වෙනත් මගකින් විය හැකිය. සමහරවිට ස්වභාව ධර්මයේ සුන්දරත්වය සහ කාරුණිකත්වය කාරුණික මිනිසුන්ගේ උණුසුම් දෑස් වලින් පැමිණෙන්නේද?

එය කෙසේ වුවද, නිල් පැහැය මිනිසුන්ට ප්‍රීතිය දනවයි, ඔවුන් හොඳ මනෝභාවයක තබයි, ඔවුන් සිනා ගන්වයි.

එහෙත් බෙලොරුසියාවට ඉහළින් අහස හැමදාම පැහැදිළි හා නිල් පැහැව තිබුණේ නැත. එය යුද්දයේ ගිනි දැල් වලින් දැවුණි. නිල් විල් සහ ගංගාවන් ලෙයින් රත් පැ ගැන්විණි. අපේ ඇඳුම් තුවාල එතුම් පටි සඳහා ඉරිනි. නාසි ම්ලේච්ඡයෝ මගේ සමූහාණ්ඩුවට විනාශකාරීව පහර දුන්හ. දෙවැනි ලෝක යුද්දය සමයේදී මගේ මිනිසුන් සෑම හතර දෙනෙකුගෙන්ම අයෙක් බැගින් මියැදුනි. නාසි අත්පත් කොට ගැනීමේ හමුදා කුඩා සහ මහ නගර 209ක් ද ගම් 9,200ක් ද දවා හළුකොට සහමුළින් වැනසූහ.

කාටින් නම් බෙලොරුසියානු ගමේ බියකරු සීනු

ලෝකය පුරා යළි යළිත් රැව්දෙයි. 1943 දී නාසීහු එය මුළුමනින් බිමට සමතලා කොට මුළු මහත් ජනගහනයම- මහළු, ගැහැණු, බිළිඳු සියල්ලම- වනසා දැමූහ. 149ක් වූ මරා දැමුණු ඔවුන්ගෙන් 76 දෙනෙක්ම දරුවෝ වූහ. අද කාටින බිම මත නිදහස පෙම් කරන බෙලොරුසියානුවන් වෙනුවෙන් ශෝකය පළකරන සැමරුමක් නැගී සිටියි.

බෙලොරුසියාව සතුව තවත් සමරුවක් වෙයිඃ ඒ අද දක්වාම ප්‍රෞඪව, අපරාජිතව නැගී සිටින වීර බ්‍රෙස්ට් බලකොටුවය. මේ වදන් කෙටූ ගල් කෞතුකාගාරය සතුය. 'අපි මිය යන්නෙමු. එහෙත් කිසිදා යටත් නොවන්නෙමු!'

මිත්‍රත්වයෙන්, පොදු අරමුණු වලින් හා කැක්කුමකින් බැඳී ඇති ජනතාව පරාජය කළ නොහැකිය. අපේ අරමුණ මහ පොළොව මත කාරුණිකම සමාජය ගොඩ නැගීමය, අපේ ප්‍රධාන ඕනෑකම වන්නේ අපේ රටේ ජනතාව සහ ඇත්තවශයෙන්ම, සියළුම රටවල ජනතාව් පැහැදිළි නිල් අහසක් යටින් සාමයෙන් ජීවත් වීමය.

අද, මගේ බෙලෝරුසියාව ඉතා චමත්කාරජනක මල් පොකුරක්ව පිපී තිබේ. තුවාල ලත් මහ පොළොව සනීප වන තුරු ගොවීන්ගේ සැළකිලිමත් අත් විසින් සාත්තු කරනු ලැබ තිබේ. ධාන්‍ය කෙත්වල පැසෙයි. ගෙවතු බොහෝ ගණනක් එළවළු පළතුරු උපද්දයි. පොහොසත් තණබිම්වල ගවයෝ තණ කති. එසේම විල් යළිත් නිල් පැහැය ගෙනය.

බෙලොරුසියානුවෝ, පරම්පරා ගණනාවක ගොවියෝ, ඉහළ ගුණාත්මක බව්න් යුතු පරිඝණකද, බර වැඩ කළ හැකි ලොරි සහ ට්‍රැක්ටර්ද, අත් ඔරලෝසුද, ශීතකරණද, වර්ණ රූපවාහිනී ද සෑදීමට ඉගෙන ගෙන සිටිති.

මහ පොළොවේ ගැඹුර තම අභිරහස් නිරාවරණය කොට තිබේ. මුළුමනින් අලුත් රැකියාවන් සමූහාණ්ඩුව තුළ පෙනී සිටියි. තෙල් නිධි කණින්නන්, ආකර ශිල්පීන් සහ ගෑස් සොයන්නන්....

එහෙත් අපේ ආඩම්බරය හා ප්‍රීතිය වන්නේ ළමුන්ය. ඔවුන් අපේ බලාපොරොත්තුව හා අනාගතයය. සමූහාණ්ඩුවට

පිරිනැමීමට ඇති හොඳ ම දේ ඔවුහු ලබති. හොඳ ම ගොඩනැගිලි ළදරු පාසල්වලට ය, පාසල්වලට ය. එසේ ම තරුණ පුරෝගමීන්ගේ නිවාසයන්ට ය. ඔවුහු හොඳ ම සෙල්ලම් බඩු, පොත් සහ ගී ලබති. අපි ඔවුන්ගෙන් ආපසු බලාපොරොත්තු වන්නේ තමන්ගේ රටට සම්මානයක් ව ලොකු මහත් වීම ය.

මේ පොතේ එන කතා ලියනු ලැබුවේ නවීන බෙලෝරුසියානු ලේඛකයන් විසිනි. ඒවා කියන්නේ බෙලෝරුසියානු ළමුන් ගැන ය. ලේඛකයන් නියෝජනය කරන්නේ වෙනස් වෙනස් පරපුරු ය. යාන්කා බ්‍රිල් බෙලෝරුසියාවේ ප්‍රවීණ ලේඛකයෙකි. වසිල් විත්කාගේ කෘති අන්තර්ජාතික ඇන්ඩර්සන් සම්මානය දිනාගෙන තිබේ. ඇලියෝනා වසිල්යෙවිච් රාජ්‍ය සම්මාන ලබා සිටී.

ඔවුහු තම කෙටිකතා ඉදිරිපත් කරන්නේ ඒවා අනෙක් රටවල තරුණ පාඨකයින්ට සෝවියට් දේශයේ ජීවිතය ගැනත්, සාමය සඳහා සෝවියට් ජනතාවගේ අභිලාෂයත් ඉගෙන ගැනීමට උදව් දෙනු ඇතැයි අවංක අපේක්ෂාවෙනි.

ව්ලැඩිමීර් ලිප්ස්කි
'වියෝසෙල්කා' බෙලොරුසියානු ළමා සඟරාවේ සම්පාදක

වචනයක්..

ලෝකය සුබවාදී සිතින් දකින්නට ළමා පරපුර මෙහෙයැවීමේ වගකීම ඇත්තේ වැඩිහිටි පරපුරටය. හෙට වැඩිහිටියා වන ළමයා අද දවසේ අත්පත් කොට ගන්නා අත්දැකීම් සමුදාය ඔස්සේ පමණක් ලෝකයද, මිනිසා ද දෙස බලනු ඇත්තේ ය.

මිනිස් සමාජය අද පැමිණ ඇති තැනට පැමිණියේ බොහෝ අසීරුතා මැදින් බවද, අද අප අත් විඳින සෑම ජයග්‍රහණයක් පිටුපස ම මුතුන් මිත්තන්ගේ නොමිනිය හැකි තරම් වූ පරිත්‍යාගයන් වැතිරී ඇති බවද, හෙට දිනයේ පරපුර උදෙසා එලෙසම අප විසින් ඉටු කළ යුතු අති මහත් වගකීම් සමුදායක් ඇති බවද ළමයාට කියා දිය යුත්තේ ඒ නිසා ය.

මෙහි එන කතා සියල්ල ම එම පදනමේ සිට ලියැවුණු ඒවා ය. සෝවියට් බෙලෝරුසියාවේ විවිධ කාල වකවානු තුළ ජීවත් වූ ලේඛකයින් විසින් ලියන ලද මේ හැම කතාවකින් ම කියැවෙන්නේ මනුෂ්‍යත්වයේ උත්තරීතර බව ගැනය. මිනිසා පරාජය කළ නොහැකි බවය. ලෝකය සැබැවින් ම හොඳ එකක් කළ හැකි බවය.

විශේෂයෙන් ම පැසිස්ට්වාදයේ රුදුරු හස්තයෙන් පීඩා විඳි බෙලොරුසියාව එයින් මිදී ගත් අයුරුද, ඉන් පසු රට ගොඩ නැගූ අයුරුද කියැවෙන කතා කීපයක් ම මෙහි අඩංගුය. පැසිස්ට්වාදය පරදවා සැබෑ මනුෂ්‍යත්වය ජාති, කුල, ආගම් පටු සීමාවලින් ඔබ්බට ගෙන යා හැකි වැදගත් මෙහෙයක් ඉටු කරනු ඇතැයි සිතමි.

මේ කෘතිය පරිවර්තනය කිරීම සඳහා එහි ඉංග්‍රීසි පිටපත ලබා දෙමින් කොළඹ රුසියානු මධ්‍යස්ථානයත්, එහි පුස්තකාලයාධිපතිනි අමිතා මහත්මියත් ලබා දුන් සහයෝගයද,

සෝවියට් පොත පත යළි සමාජගත කිරීම උදෙසා සමන් ප්‍රියංකර සහෝදරයා සයුරි ප්‍රකාශන ආයතනය බිහි කිරීම ද, මෙහි පිටු සැකසුම් කළ ගයානි නිලංකා ගලගෙදර සොයුරියද මෙහිදී විශේෂයෙන් සිහිපත් කරමි. සයුරි මුද්‍රණ ආයතනයේ සරත් පද්මකුමාර මහතා ඇතුළු සියළු සේවක මඬුල්ලට ද මගේ කෘතඥතාව හිමි වේ.

මහින්ද සෙනරත් ගමගේ
123,
කොස්පොතුගල විලේජ්, පෝරුවදණ්ඩ.
071 5181421

පටුන

ලින්ඩා සහ කුඩා මේපල් ගස 17

අසීරු මිතු දමක් 29

අද්භූත අත්උදව්කාරයෝ 40

බ්‍රෙස්ට් බලකොටුවේ දරුවෝ 49

සීයා සහ අල් 59

විපතේදී මිතුරෙක්.... 65

පත් ඉරුවා 78

යූසික්ගේ මව අතරමං වෙයි... 85

හෙල්මට් තුන 91

අලුත් සෙල්ලමක් 93

අපට හිරු දැකිය හැකිය 98

ගස් වැළපෙන විට.... 106

තැපැල් පෙට්ටියට මල් මිටක් 110

නික් නූඩ්ල් ජනරාල් කෙනෙක් වූ හැටි 115

උපදෙස් 119



යාන්කා බ්‍රිල්

ලින්ඩා සහ කුඩා මේපල් ගස

-මගේ දුව ගාල්යාටයි

මාර්ග පරීක්ෂකගේ කුඩා කොළ පැහැ නිවස මහ මඟට එහායින් නැගී සිටියි.

මෝටර් රියකින් එතැන පසුකොට යන අයෙකුට කොළ පැහැ බිත්තිද, කොළ පැහැයෙන්ම වූ වැටද, විශාල ජනේලය වටකොට ගත් සුදු පැහැයද, දූලි පැහැති උළු වහලද සැනෙකින් දකගත හැකි වෙයි. තව දුරටත් මඟ දිගේ යන විට මඟ බඩ මැතදී සිටවූ කුඩා පැල පේළිද, ටෙලිග්‍රාප් කණුද, ඒවාට එපිටින් කෙත් යායන් හා කැළෑවන්ද හමුවෙයි.

සිව් වසැති කුඩා ලින්ඩා ජීවත් වන්නේ මඟ බඩ නැගී හුන් මේ ආකර්ශනීය නිවසෙහිය.

ලින්ඩා මඟ අයිනේ සිටගෙන සිටින්නට ආශා කරන්නීය. පසුවෙමින් යන සෑම මෝටර් රියකටම අත වනන අ ඇගේ හොඳම මිතුරා වූ තරබාරු බල්ලෙකු වූ රික්ට ඊට බුරන්නට පොළඹවයි. වරක් ලින්ඩා මහත් පෙළඹවීමකට යටත්ව කොල්ලන් කරන්නාක් මෙන් අත්ලට කෙළ ගසා අතුල්ලා පාර හරහා දුවන්නට වූවාය. තාර පාර ඉතා පළල්ය; එහි මතුපිට මේසයක් සේ සියුම්ය. ඈ පාරේ මැදක් යන්නට ද පෙර ඈත සිට මෝටර් රියක් දෙවරක් නළාව හැඬැවීය. ඇගේ කුඩා දෙපා බියෙන් හිරිවැටී ගියේය. ඈ එක්වරම නැවතී කෑ ගැසුවාය. "අම්මා!" මෝටර් රිය නැවැතිනි. රියැදුරා දොර හැර ඇයට බැණ වැදුනේය. එහෙත් රික් ඔහුට නපුරු

ලෙස බුරා පැන්නේය. දොර වසාගත් බියවූ රියදුරු යන්නට ගියේය.

එදායින් පසු නම් පුංචි ලින්ඩා අම්මා හෝ තාත්තා නොමැතිව පාර පනින්ට බිය වූවාය. ඈ දන් පාර අයිනේ සිටගෙන සිටින්නෙද කළාතුරකිනි. ඈ පාර අයිනට එන්නේ ඇගේ කන් රිදවමින් සෝෂා කරන ලොකු මඩ වැකි ට්‍රැක්ටර් යනු ඇසෙන විටය. ඒවා බඩගාන්නේ දළඹුවන් වාගේය.

2

අම්මාත් තාත්තාත් නගරයට ගියහ. සැන්දෑවේ අම්මා ගෙදර ආවේ තනියමය. ලින්ඩා දිගු කාලයක් තිස්සේ බලාපොරොත්තු වූ තෑග්ගක් ඈ ගෙන ආවාය. ඒ පුංචි ලොම් කබායකි.

අම්මා එය ඇයට අන්දවා සියලු බොත්තම් ලෑවාය. ඉන්පසු කුඩා දැරිය ඉහළට ඔසොවා පහන දෙසට හැරවූ ඈ අගයන ලෙසින් හඬ නැගුවාය.

"හෝ... මගේ පුංචි හිම කුමාරි!"

තාත්තා හෙට වන තුරු නොඑන බව දන ගැනීමෙන් වූ කැළඹීම ලින්ඩාට සැනෙකින් අමතක විය. ඇට ඕනෑ වූයේ ලොම් කබාය ඇඳගෙන ඇවිදින්නට යන්නටය. ඒත් අම්මා කීවේ දන් ඊට පමා වැඩි බවය. රැය එළැඹෙමින් තිබූ අතර එය හිම මිදෙන තරම් සීතලක් ගෙන ආවේය. ලින්ඩා ටික වේලාවක් කන්කෙදිරි ගෑ නමුදු ඉන් පසු සන්සුන් වූවාය. හොඳයි... ඉතිං ඈ හෙට එළිවන තුරු බලා සිටිනු ඇත. නමුත් කරුණාකර ඇයට ලොම් කබාය මුළු හැන්දෑ වරුව පුරා ඇඳගෙන සිටින්නට අම්මා ඉඩ දිය යුතුය. අම්මා සිනා පා හොඳයි කීවාය. එහෙත් ගෙතුළ බොහෝ උණුසුම්ය. සීතලට බිය වූ ආත්තම්මා උදුනට ලොකු දර ගොඩක් දමලාය. ඉතිං ලින්ඩා ඉක්මණින්ම කබාය ගලවා දමා ඇඳට ගියේ අලුත් දිනය එනතුරු ඉවසිලිමත්ව බලාපොරොත්තුවෙනි.

ඈ මොහොතකට දිගාවී කල්පනා කොට ඉක්බිති මෙසේ

ඇසුවාය.

"අම්මා, අද පුංචි මේපල් පැලේට හීතල නැද්ද?"

3

ලින්ඩා පතින්නට බලාපොරොත්තු නොවන පාරේ අනිත් පැත්තේ මේපල් පැලය වැඩුණි. එය සිටියේ තනිව නොවේ. පසුගිය සරත් කාලයේ බොහෝ පැල වර්ග පාර අයින දිගට සිටුවනු ලැබ තිබිණි. මේපල්, දෙහි සහ බර්ච් පැල ඒ අතර විය. ඇපල් ගස් හතරක් සහ පෙයාර්ස් පැල පවා තිබිණි. ඒවා වැඩුණේ ලින්ඩා සිටවූ මේපල් පැලය කිට්ටුවමය.

පුංචි ගැහැණු ළමයෙක් තනිවම ගසක් සිටවූයේ කොහොමද? ඉතිං ඈ ඇත්තටම එය සිටවූයේ තනිවම නොවේ. ඈ පැලය උඩු අතට වළේ තබාගෙන සිටියාය. ඒ අතර පිරිමි ළමෝ දෙදෙනෙක් වළට පස් දමා තද කළෝය.

පිරිමි ළමුන් දෙදෙනා වූයේ ව්ලැඩික් හා අලෙක්ස්ය. එහි මිකාස්, මරිල්කා, මායා සහ ඕල්යාද වූහ. මුළු පාසලක ළමයි!

මුලදී ලින්ඩා ගේට්ටුව අසළට වී ඔවුන් ඒවා සිටුවනවා බලා සිටියා පමණකි. ළමුන්ගේ මූණු මූණු හඬට සවන් දෙමින් රික් ඔළුව උස්සා, ඇස් කරකවා බොහෝ ප්‍රීතිමත්ව වළිගයෙන් ගේට්ටුවට ගසන්නට විය. බොහෝ ගණනක් වූ ළමුන් ගොඩට යන්නට ලින්ඩාටද තිබුණේ මහත් ආශාවකි.

ළමුනට ඇගේ ඕනෑකම තේරුණාක් මෙනි. ඔවුහු පාර අද්දරට විත් කෑ ගසන්නට වූහ.

"පුංචි නංගී, ඔයාගේ බල්ලා හපනවද?"

"නෑ, අපේ රික් ළමයින්ව හපන්නෙ නෑ" ලින්ඩා කෑ ගැසුවේ ඇඟිලි තුඩින් එසැවී ගනිමිනි.

"එහෙනං එන්න අපිත් එක් පැල හිටවන්න"

ව්ලැඩික් සහ ඇලෙක්ස් දෙදෙන පාර හරහා දිවැවිත් ලින්ඩාගේ අතින් අල්ලා ගත්හ. ගැහැණු ළමයා පසු පසින් දිව ආ ලොමින් පිරි බල්ලා දෙස මුලදී බියපත් කලබලයෙන්

බැලූ ඔවුහු ඉන්පසු ඕනෑම මොහොතක මෝටර් රියක් මතුවිය හැකි කඳු ගැටය දෙස බලමින් ප්‍රවේශමින් පාර පැන්නහ.

වෙනත් ළමෝ කණ්ඩායමක් හා ඇතින් හුන් ගුරුවරිය ඔවුන්ට කියා තිබුණේ දැරියගේ අම්මාගෙන් හෝ තාත්තාගෙන් නොඅසා ඇය කැඳවාගෙන නොඑන ලෙසය. එහෙත් දැන් ඈ ලින්ඩාව දෑතට ගෙන ඇගේ දෙකපොලම සිම්බාය. හරියටම අම්මා වාගේමය.

ළමෝ ලින්ඩා වෙනුවෙන් තෝරා ගත්තේ කුඩාම හා ලස්සනම මේපල් පැලයය.

දැන් මේ පැලය එළියේ තනිව සිටී. එය තිබෙන්නේ කුඩා කණුවකට තබා බැඳලාය. එසේම එය එම කණුවේ එල්ලීගෙන සිටී. හරියටම තවමත් තනිව ඇවිද ගන්නට බැරි දරුවෙකු මෙනි. එළිමහනේ බොහෝ සීතලය. එසේම බොහෝ හිමය.

"අම්මේ, මට එළියට ගිහින් මේපල් පැලේ බලන්න පුළුවන් කොයි වෙලාවටද?" ලින්ඩා ඇසුවාය.

4

සුළඟින් ගසාගෙන විත් රැඳී තිබූ හිම මතින් හාවෙක් පාන්දරින්ම ප්‍රවේශමින් පැන පැන ගියේය. කොරිඩෝවේ නිදා සිටි රික් හාවාගේ ඉව දැනී දෙකන් උස්සා කෝපයෙන් ගොරවා අන්තිමේ මහ හඬින් බුරන්නට විය. "බුහ්! බුහ්!බුහ්!"

බියපත් වූ හාවා උඩ වීසි වී හිම ගොඩට උඩින් ඊයක් සේ පැන දිවීය.

එළි වූ විට රික් හාවාගේ ඇද වෙමින් ගිය පා ලකුණු මඟ දිගේ ඉව අල්ලමින් ගෙය වටේත්, වත්තේත් ඇවිද ගොස් නොපෙනී ගියේය. ඌ ආපසු එන විට සුදු ලොම් කබාය හැඳගත් ලින්ඩා හිම කුමරිය ඇර දමා තිබූ ගේට්ටුව ළඟ සිටගෙන උන්නාය. ඈ ප්‍රීතියෙන් ඇස් කරකවමින්, බැබලෙන හිරු දෙස බැලුවාය.

හිම කුමරිය වෙත ආ රික් වෙනදා වාගේම ඇගේ ඇඟේ ඇතිල්ලී ඇගේ කුඩා අත යටින් උගේ හොම්බ

ඇන්නේය. හරියටම "පුංචි ලින්ඩා! කරුණාකරලා මගේ පිටට තට්ටු කරලා, මගේ කන් අතුල්ලන්න" කියන්නාක් වාගේය.

"යනවා යන්න එහාට" ලින්ඩා කීවේ දෙතොල් හකුළුවමින්. "නුඹ මගේ කබාය කිළිටි කරාවි. යනවා එහාට"

ලෝම වැස්මෙන් ඉවතට ගත් අතින් ඈ රික්ව ඉවතට තල්ලු කළාය.

"එහෙනං එහෙමයි ඔයාට දැනෙන්නේ?" රික් එසේ කීවේ කොහෙත්ම තරහකින් නම් නොවේ. "මට ඕනෑ ඔයාට දෙයක් පෙන්නන්නයි"

ඌ පමණක් දන්නා වූ ප්‍රීතියකින් උඩ පිනූ රික් ලින්ඩා වටා කරකැවෙන්නට විය. ඉන්පසු පොළොවේ දිගා වූ ඌ බුරන්නට විය. "බුහ්! බුහ්! බුහ්!"

ලින්ඩා මහ හඬින් සිනාසී පිරිසිදු, දිස්නය දෙන හිම අතරින් ඌ පසු පස්සේ දිව්වාය.

5

අම්මාටත්, තාත්තාටත් අකීකරුව මෙවර ඈ මහපාර පැනීමේ වරද රික්ගේය. ඌ පාර අනෙක් පැත්තට පැන ඈයට අඬ ගසන්නට විය. "බුහ්! බුහ්! බුහ්!"

හිරු, අලුත් ලොම් කබාය සහ හිමද ඊට බැඳුණු ඇසිය යුතුය. ඈයට එතරම්ම ප්‍රීතියක්, උණුසුමක් හා හොඳ හැඟීමක් දැනිනි! ලින්ඩා මොහොතකට කල්පනා කළාය. ආපසු බැලුවාය, ඉන්පසු ලෝම වැස්මෙන් අත් පිටතට ගත් ඈ දුවන්නට වූවාය. තදින් හිම වැටී තිබූ මඟ හරහා දුවද්දී ඈ ඇද වැටුණි. මුලින්ම හිමේ වැදුනේ ඈගේ උණුසුම් අත්ය. මුලදී ඈ බිය වූවාය... හිම ඈ කිති කවමින් දවාලන්නට විය... එවිට ඈය සිනාසී කෑ ගැසුවාය. "රික්! ඔහොම ඉන්න බලු පැටියෝ! මං එනවා!"

රික් තම පුංචි යෙහෙළිය එනතුරු සිටිනවා වෙනුවට ඈ වෙතට දිව ආවේය. ඉන්පසු දෙදෙනාම එකට පිම්මේ

දුවන්නට වූහ. පාර පැන ආ ඔවුහු පැල සිටුවා තිබූ අයින වෙත ආවෝය. කිසිවක් සිහි වූ ලින්ඩා මෙසේ කීවාය.

"රික්... පුංචි මේපල් පැලේ අතන! ආන් අතන! මෝඩ බලු පැංචා.. ඔයා දන්නෙවත් නෑ....."

ලින්ඩා සිටගෙන සිටි පාර අසු කුර වලින් පෑගී තද වෙලාය. රික් සිටියේ ගස් වලට පිටුපසින් හිම ගොඩේය.

"බලු පැංචෝ අපි මෙහෙන් යමු, මෙහෙන්!" හිම කුමරිය කීවාය. එහෙත් රික් මෙවරද සිටියේ කුමක්දෝ දඟකාරකමකට සැරසෙමිනි.

සිත වශීකරන, සිත කළඹන හාවාගේ අඩි පාර තිබුණේ රික්ට පිටුපසිනි. උද්‍යසන රික් ඉව අල්ලමින් කැලෑව දක්වාම ගියේ හාවාගේ මේ අඩි ලකුණු දිගේමය.

"බුහ්! බුහ්! බුහ්!" රික් බිරුවේය. බලු භාෂාවෙන් එහි තේරුම "මේ පැත්තෙන් යන එකයි වඩා හොඳ" යන්නය.

ඌ සිටින තැන ලින්ඩාට නොපෙනුනත් ඈ පාර දිගේ දිව්වාය. මේපල් පැලය සිටවූ තැනට ළඟා වූ ඈ පාරෙන් හැරී හිම තට්ටුව මතින් අඩිය තැබුවාය. එවිට ඈ වැටුණාය. ඇගේ උණුසුම් දෑත් යළිත් හිමේ එරිණි. ඒත් ඈ මෙවරද නැඬුවාය.. නැගිට ගත් ඈ මෙසේ ඇසුවාය.

"පුංචි මේපල් පැලේ ඉතිං කොහොමද?"

6

මුතු ඇට තරම් ලොකු කඳුළු කැට එක පිට එක හිම කුමරියගේ නිල් ඇස් වලින් මතු වී ගැලීය. ඒවා තව තවත් ගැලීය.

සාමාන්‍යයෙන් නම් ලින්ඩා අඬන්නේ නැත. ඈ අඬන බබෙක් නොවේ! එහෙත් කවුදෝ නපුරු අයෙක් පැල දෙකක් කඩා දමා තිබිණි. ඒ මේපල් පැලය නොවේ, ඇපල් පැල දෙකකි. ඒවා සිටුවා තිබුණේ ඕල්යා සහ අලෙක්ස්ය. ඇත්තටම ඒවා කඩා දමා තිබුණේ නැත. ඒවායේ කඳෙන් පොතු සූරා දමා කුඩා රිකිලි සියල්ල කඩා ගෙන තිබිණි.

ලින්ඩා සනසන්නට රික් වළිගය වැනීය. ඌ එක්

කකුලකින් තව කකුලකට බර වෙමින් උඩු බිරුවේය. එහෙත් මෙයට වගකිව යුත්තේ අර නරක, නීච හාවා බව රික් කෙසේ කියන්නද... ලින්ඩාගේ අත්තම්මා පවා මෙයට වගකිව යුතු බව රික් කෙසේ නම් ඇයට අවබෝධ කරවන්නද....! ආත්තම්මා වගකිව යුත්තේ ඇයි? ඇය ඊයේ රාත්‍රියේ රික්ට එළියට යන්නට දොර හැරීමට අවදි නොවූවාය. ඒ වෙනුවට ඈ කළේ රික්ගේ බිරුම නැවැත්වීමට බිත්තියට තඩි බෑමය.

මුලදී රික් ගෙරුවීය, ඉන්පසු හාවා කෙරෙහි කෝපයෙන් ඌ බුරන්නට විය: "බුහ්! බුහ්! ඔහොම හිටු දිග කනා! මං උඹව අල්ලා ගන්නං!" රික් බලු භාෂාවෙන් බැණ වැදුණේය. ඒත් ලින්ඩාට උගේ බස තේරුණේ නැත.

අන්තිමේදී ඈ හැඬුම නවත්වා, සීතල වූ අත් වලින් දෑස් පිස දැමුවාය. ඉන්පසු අත්වැසුම් යටින් දැත් සඟවාගත් ඈ තාත්තා කරන්නාක් මෙන්, වැඩිහිටියකු මෙන් මෙසේ කීවාය.

"රික්, මා පස්සෙන් එනවා!"

ඈ ප්‍රවේශමින් හිමෙන් පිටතට අඩි තබා පාරට ආවාය. යළිත් වතාවක් ඇය වටපිට බැලුවාය. අම්මා හෝ අත්තම්මා පෙනෙන්නට නැත. ඉන්පසු කඩිමුඩියේ තොරව ඇය ඇවිද යන්නට ගත්තාය. ඒත් ඒ ගෙදර දෙසට නොවේ; අලුත් ගොවිපළ පාසල දෙසටය.

රික් ලින්ඩා පසුපස ආවේය. මෙවර නම් ඌ හොඳින් හැසිරුණි. ඌ පාරෙන් පිටතට පැන එකවර පෙරට දිව ගියේ නැත.

7

තද සීතල පැහැදිලි රැයක හිම යානයක් සර සර හඬ නඟමින් නැතහොත් මෝටර් රථයක් වේගවත්ව මහ මඟ දිගේ ඇදී යයි. හිම යානයේ බෝන් ලීය මත වූ සීනුව නඟන සිලිං බිලිං හඬ දුර ඈත සිටම අසත හැකි වෙයි. එසේම මෝටර් රියක ඇන්ජිමේ ඝෝෂාව ඊටත් වඩා දුර ඇදී යයි. මෝටර් රථය තුළ හිඳගෙන නැතිනම් හිම යානය පිටුපසින්

දිව යමින් මිනිස්සු උණුසුම් වීමට දුම් උරති, කතා බහ කරති, එසේම සිනාසෙති.

මේ අතරෙහි, ලින්ඩා, හිම කුමරිය මඟ බඩ නිසල කොළ පැහැ නිවසෙහි නින්දෙහිය.

අලුත් ලොම් කබායද, අත් වැස්මද ඇඳුම් අල්මාරියේ එල්ලීගෙනය. රික් කොරිඩෝරයේ නිදි කිරයි. ඌ නින්දෙන්ම කෝපයෙන් ගොරවයි. හරියටම කිසිවක් සිහි වූවා සේය. ඉන්පසු ඌ කන හරවා අසා හිඳියි. සමහරවිට ඇපල් පැල වැනසූ දිගු කන් ඇති තක්කඩියා හිම අතරින් පැමිණෙනවා වන්නට පුළුවන.

ලින්ඩා නිදා හුනි.

අර හාවා යළිත් පැල වෙත යනු ඈ සිහිනෙන් දුටුවාය. ඌට ඕනෑ කළේ විලැඩික් හා මායා සිටැවූ ඇපල් පැල දෙක ලැටි ගෑමටය. එහෙත් ඒවා හැමෙකක්ම සුමුදු පිදුරු වැස්මකින් ඔතා දමලාය. ලින්ඩා එදින පාසලට ගොස් තිබුණාය. ළමෝ පැමිණ ඇපල් ගස් වටා පිදුරු බැන්දෝය. ලින්ඩා පාසලට යාමට දඬුවමක් ලෙස හාවා කල්පනා කළේ ඇගේ මේපල් පැලය ලැටි ගාන්නටය. එහෙත් ලින්ඩා තමාගේ පැලයද ආරක්ෂා කර දෙන ලෙස පාසල් ළමුන්ගෙන් ඉල්ලා තිබිණි. ඉතිං මේපල් පැලයටද පිදුරු කබායක් ලැබිණි. හරියටම පුංචි ලින්ඩාගේ කබාය වාගේමය. හාවා කල්පනා කළේ මේපල් පැලයේ අතු කඩා කෑ යුතු වගය. තවමත් හරියට ඇවිදින්නට බැරි ළමයෙකු මෙන් වූ මේපල් පැලය ලින්ඩාගේ අත් වැනිම අතු වලින් අත් පොළසන් දී සිනා පෑය.

ලින්ඩාද සිනාසුනාය. ඇයව හිම යානයක නංවාගෙන මහ මඟ හරහා රැගෙන එනු ලැබිණි. හරියටම එය දහවලේදී ඇය නැග හුන් හිම රිය වාගේමය. අලෙක්ස් හා ඕල්යා එය ඇදගෙන ආහ. මහා විශාල ළමුන් ගණනකි; මුළු පාසලක්ම! රික් ප්‍රීතියෙන් බුරමින් ඔවුන් හා දිවීය. බුහ්! බුහ්! බුහ්! ඉන්පසු ගුරුවරිය ලින්ඩා ඔසොවා ඇගේ මව අතට දුන්නාය.

"ලින්ඩා ගැන කේන්ති ගන්න එපා! එයා අපිව බලන්න ඇවිත්! අද ලින්ඩා හරිම හොඳ දැරිවියක්!"

පුංචි මේපල් පැලය තවමත් සිනාසෙමින් අත් පොළසන් ගැසීය.

වසිල් වින්කා

අසීරු මිතු දමක්

එවැනි හිතුවක්කාරයෝ සිටිති. ඔහුගේ හිස අල්ලා බිත්තියකට ඇන්නත් ඔහු කරන්නේ විරිත්තීම පමණෙකි.

එවැනි ළමුන්ට කථා කිරීමේ කිසිදු හොඳක් නැතැයි කියති.

එවැනි හිතුවක්කාරයෙක් ගැන මට මගේ උපන් ගම වූ යෙල්නිච් වලදී අසන්නට ලැබිණි.

යෙව්ස්ට්‍රැට් ස්කැවිලියස් දවල් කාලයේදී දකින්නට ලැබුණේ ඉතා කළාතුරෙකිනි. ශාන්ත වැඩිමහල්ලෙකු වූ ඔහු අවුරුදු බොහෝ ගණනක් ගොවිපොළක රෑ මුරකරුවකු සේ වැඩ කොට තිබිණි. උණුසුම් ගිම්හාන රෑවල පවා යෙව්ස්ට්‍රැට් සිසිර කබායක් සහ ලොම් තොප්පියක් හැඳ පැළඳ ගනී. එම තොප්පියේ කන් වැසෙන පියන් පත් දෙකින් එකක් කොළරයට එල්ලා හැළුණු අතර අනෙක ඉහළට එසැවී තිබුණේ හරියටම නිසලතාවයට අවධානයෙන් සවන් දෙන්නාක් සේය. තුවක්කුවක් උරේ එල්ලා ගන්නා ඔහු තම ගෙයින් පිටවී යයි.

ඔහු දොඩමළු අයෙකු නොවේ. එහෙත් කතා බහෙහි යෙදෙන ජන කණ්ඩායමකට ගොස්, සිටගෙන ඔවුන්ට සවන් දීමට යාමේ පුරුද්ද වළකා ගන්නට ඔහුට නොහැකි විය. සමහරවිටෙක තමාගේම වූ වදනක් හෝ දෙකක් ඔහුද ඉදිරිපත් කරයි. ඉක්බිති ආවා සේම නිසලව ඔහු රාත්‍රිය තුළ අතුරුදන්ව යයි.

යෙව්ස්ට්‍රැට් හෝ ඔහුගේ වැඩිමහල් පුතුන් තිදෙනා ගැන කිසිදු නරකක් කීමට යෙල්නිච් ගමේ කිසිවෙකුට හැකි

වූයේ නැත. එහෙත් හතරවැනියා එනම් බාලම පුතු යූසික් කෙතරම් නොසන්ඩාල ගැටයෙකු වී දැයි යත් ඔහු හැදෙන්නේ කවුරු අනුවදැයි කිසිවෙකුට තේරුම් ගත නොහැකි විය.

සමහරවිට ඒ ඔහු බාලයා වීම නිසා පවුලේ සියල්ලන්ගේම වැඩි ආදරය ලැබ නරක්වීම නිසා වන්නට හැකිය. තමා සතුටු දෙයක් කළ යූසික් කිසිවෙකුගේ කීමක් පිළිගත්තේ නැත.

මේ පැංචා යාන්තම් දණිස්සක් තරමට උස් බවක් පෙනිනි. එහෙත් පාසල් යන්නට ගත් විට ඔහු ඔහුටම ආවේනික මැරයෙක් බවට පත් විය. ඔහු පංතියේ මිතුරන්ගේ පිටට තඩි බෑවේය, බෑගයකින් පොතක් උදුරාගෙන කෑලි කෑලි වලට ඉරුවේය, නැතිනම් කුමක් හෝ දඟකාරකමකට පෙළැඹිනි.

මේ කමකට නැති හාදයා ගැන හැම විටම ඇහැ ලාගෙන සිටින්නට සිදුවිය.

කඳුළු හෝ තර්ජන යන දෙකින් එකකින්වත් සහයෝගයක් නොවිණි.

ගුරුවරිය ඔහුගේ පියාට පැමිණිලි කළාය. එහෙත් යෙව්ස්ට්‍රැට් තම බාලයාට මොළොක් විය. පුතු වෙනුවෙන් නිදහසට කරුණු කීමට බොහෝ වතාවක් ඔහුට පාසලට යන්නට සිදුවිය. එහෙත් ඔහු කිසිදා යූසික්ට දඬුවම් කළේ නැත. ඒ වෙනුවට ඔහු කලේ දරුවාට එහි පල විපාක කියා දෙන්නට යත්න දැරීමය. යූසික් පියාට සවන් දෙන්නාක් සේ පෙන්වයි. එහෙත් නිදහස් වූ සැණින් ඔහු යළිත් තම කපටිකම් වලට යොමු වෙයි.

මුළු ගම ඇවිස්සූ එක් සිදුවීමක් නොවිණි නම් මෙය තව කෙතෙක් මෙසේ ඇදෙන්නට තිබිණිදැයි දැන සිටි කිසිවෙක් නොවූහ.

පාසල ගිම්හානය සඳහා නිවාඩු දුන්නා පමණය.

අවුරුද්දේ හොඳම කාලය ඇරඹී තිබිණි. ගස්වල දිගු අතු පතරෙහි පොහොසත් කොළ ගොන්නකි. ඒ කොතරම් දැයි යත් බිම සිට බලන්නෙකුට මුදුනේ කුමක් සිදුවන්නේ දැයි දැකීම අසීරුය.

එම ඉතාමත් වැදගත් සිදුවීම සිදුවූයේ යෙව්ස්ට්‍රැට්ගේ

ගෙදර ඉදිරිපිට පාරෙන් එහා නැගී ගත් පොප්ලර් ගසේ කරටියෙහිය.

වසන්තය ඇරඹෙන්නට යාන්තමට පෙර යෙව්ස්ට්‍රැට්ගේ අසල්වැසි ඇඩම් පැට්රුබෙයිකා සහ ඔහු පුතු තොලික් ගස මුදුනේ කරත්ත රෝදයක් සවි කළහ. තොලික්ට ඕනෑ වූයේ කොකුන් පොප්ලර් ගසට පැමිණ ජීවත් වීමය.

කුරුල්ලෝ තොලික්ගේ බලාපොරොත්තු සුන් කළේ නැත. උහු ගසට පියාඹා විත් කූඩු තනා පැලපදියම් වූහ. මිනිසුන් කෙරේ විශ්වාසය තැබූ උහු නිතරම ගෙවල් මතින් පහතින් කරකැවුනහ, එසේම මිදුල් වලට පවා බැස්සහ.

පාරේ සිට බලද්දී උන් කුකුළු පැටවුන් අතරෙහි උඩගුවෙන් අඩි තබා යන සැටිත් කිසියම් හේතුවක් නිසා සමාගමයක් අනුමත නොකළ කලහකාරී කකුළු නාම්බා දෙස පසෙකින් බැලුම් හෙළන අයුරුද දැකිය හැකිය.

මේ බුද්ධිමත් හා කාරුණික අලුතින් පැමිණියෝ උන්ගේ කූඩු තනද්දී, බිත්තර රකිද්දී සහ උදේ සිට රෑ වෙන තුරු පැටවුනට ආහාර පාන සපයද්දී යූසික් සහ තොලික් අතරෙහි මිතුරු දමක් ඇති වුණි.

මෙය සැබැවින්ම අනපේක්ෂිත එකක් විය. ඒ යූසික් සහ තොලික් පාසලේ විවේක කාලයේදීත්, සීනුව නාදවී පංතියට යද්දීත් රණ්ඩු අල්ලමින් සටන් වැදී තිබුණේ මේ මෑතකදී නිසාය. එවන් අවස්ථාවලදී කමිස වල බොත්තම් ඉරී ගිය අතර සමහරවිට නාස් වලින් ලේ ගැලීය.

දැන් ඔවුනට දවසක් වත් එකිනෙකා නොමැතිව ගත කළ නොහැකි විය. ඔවුන් එකට එකතු කළේ කොකුන්ය.

මේ බුද්ධිමත් කුරුල්ලන් කෙරේ බොහෝ ළබැඳි බවක් ළමුන් දෙදෙන තුළ වැඩිනි. ඔවුහු දවස ගානේම උන් දෙස බලා උන්හ.

මුලදී, පැටවුන් තවමත් කුඩා උන්ව සිටියදී, කොකාත් කෙකීත් වරකට එකා බැගින් කූඩුවෙන් පිටතට ඉගිල ගියහ. එහෙත් පැටව් ටිකින් ටික ලොකු වෙත්දී මහ උන් දෙදෙනම එකට ඉගිල ගියහ. එහෙත් උන්ට පවුලටම ප්‍රමාණවත් තරම් ආහාර ගෙන එන්නට නොහැකි විය.

කූඩුව අද්දට වී සිට ගන්නට යත්න දරමින්, උස නිසා

බියපත්ව එකට තුරුළුව ගුලි ගැසෙන කුරුළු පැටවුන් සතර දෙන දෙස බලමින් ළමෝ දෙදෙන මහත් සේ ප්‍රමුදිත වූහ. දෙමාපියෝ උන්ට අනතුරු හඟවමින් යටිගිරියෙන් හඬ තලති.

දිනක් යූසික් මෙසේ කීය.

"තොලික්, අපි කූඩුව ළඟට නැගලා මට එක කොක් පැටියෙකුයි, ඔයාට එක කොක් පැටියෙකුයි ගනිමු"

තොලික් ඒ අදහසට කැමති වූයේ නැත.

"නෑ අපි එහෙම කරන්ඩ හොඳ නෑ. උන් බඩගින්නේ මැරෙයි"

"අපි උන්ට කවමු"

"කොහොමද උන්ට කවන්නේ?" තොලික් සිනාසුනේය. "ඔයා වගුරෙන් ගෙම්බෝ අල්ලාගෙන එනවද?"

තමාට සිනාසීම තවදුරටත් යූසික්ට ඉවසා ගත නොහැකි විය. ඔහු තොලික් වෙත ඇස් හයා රවා බැලීය.

"මං දන්නවා තමුසෙට ඕන නැත්තේ ඇයි කියලා! තමුසේ හිතන්නේ උන් තමුසෙගෙ කොක්කු කියලද? තමුසෙගෙද උන්? මං දූන් ඔය හෙණ ගහච්ච කරත්ත රෝදෙ ගහෙන් බිමට තල්ලු කරනවා!" යි පුපුරා හැළුණු යූසික් පහසුවෙන් රළු ගස් කඳ දිගේ නැග්ගේය.

"මං ඕකට ඉඩ දෙන්නෙ නෑ!" තොලික් හඬ තැලීය.

දිව ආ ඔහු මුළු වෙර යොදා යූසික්ගේ කමිසයෙන් ඇද්දේය. ගසේ පොත්තට මුහුණ සූරා ගනිමින් යූසික් පහළට ලිස්සා විත් බිම ඇද වැටුණි.

කෝපයෙන් හා වේදනාවෙන් පිරි මුහුණින් යුතුව දෙපයින් නැගී සිටගත් යූසික් අත්මිටි මොළවා ගත්තේ තම හිටපු මිතුරාට පහර දෙන්නටය. එහෙත් ගෙතුළට දිව ගන්නට තොලික් සමත් විය.

දොර අගුල වැටෙන හඬ යූසික්ට කන ළඟින්ම අසා ගන්නට හැකි විය.

"හොඳයි බලාගම්මු පැට්රුබෙයිච්ක්!" කෝපාවිෂ්ඨ යූසික් තොලික්ට තර්ජනය කළේය.

"පට්ටපල් මෝඩයා!" දොර පිටුපස සිට නිර්භයව කෑ ගැසූ තොලික් අට්ටාලයට වූ පියගැට පෙළ නැංගේය.

එහි පාරට මුහුණ ලා කුඩා වටකුරු ජනේලය වෙත

ගිය ඔහු යූසික් කුමක් කරන්නේ දැයි දකින්නට බලා හුනි.

ඔහුට වැඩි වේලා බලා සිටින්නට සිදු වූයේ නැත.

යූසික් ගෙදර බලා දිව්වේය. ඔහු කලබලයෙන් දොර අතරින් රිංගා ගත් සැටිත්, ඒ සැණින්ම මෙන් ආපසු එළියට දිව ආ සැටිත් තොලික් කුඩා ජනේලය තුළින් දුටුවේය.

යූසික්ගේ අතේ තුවක්කුවකි. එය ගරිල්ලා සෙල්ලමේදී ගන්න ලීයෙන් කළ සෙල්ලම් එකක් නොවේ, සැබෑම එකකි! යෙව්ස්ට්‍රැට් ස්කැවිලියස් රැ මුරකරු රැකියාවට ගෙනයන සැබෑ තුවක්කුවය.

මෙය තොලික් මුළුමනින්ම පරාජයට පත් කරවන තරම් අනපේක්ෂිත දෙයක් විය. මේ මෝඩයා කරන්නට යන්නේ කුමක්ද?

ගේට්ටුවෙන් පිටතට ආ යූසික් නතර වී තුවක්කුව එසැවීය. ඔහු එය එල්ල කළේ කොහාටදැයි අනුමාන කළ හැකිද? තොලික් සැඟවී සිටි ජනේලය ඇති වහලයටය.

"හපෝයි!" භීතියෙන් යටිගිරි හඬ නැගූ තොලික් අට්ටාලයෙන් පැන ගෙතුළට දිවීය. "තාත්තේ රත්තරනේ! යූසික් මට වෙඩි තියන්න යනවා!" වෙඩිල්ල පුපුරා යද්දී ඔහු හඬ තැලීය. යූසික්ගේ මව බියපත්ව කෑ ගැවාය.

"මොකද යූසික් උඹ ඒක කළේ? තොලික් උඹට කරදර කළාද? එයා උඹට අව්ව තපින්න දුන්නේ නැද්ද? අනේ මෙහෙමත් දුක් ගින්දරක්!"

කුමක් සිදුවීදැයි තේරුම් ගන්නට නොහැකිව තොලික්ගේ පියා විමතියෙන් තම පුතු දෙස නෙතු හයාගෙන හුනි.

"එයාට වැරදුනා!" ප්‍රීතියෙන් හඬ තැලූ තොලික් නිවෙසින් මිදුලට දිව ගොස් යූසික්ගේ මවට කෑ ගැසුවේය. "එයා මාව මැරුවේ නෑ නාස්තයා නැන්දේ!"

හරියටම ඒ මොහොතේ ඔහු යූසික්ගේ දසුන දුටුවේය. යූසික් සිටියේ වැටට හේත්තු වී ගනිමිනි. ඔහුගේ පෙනුම සුදුමැලිය, හිස එල්ලා වැටෙයි. තුවක්කුව ඔහුගේ දෙපාමුලය. තොලික්ට තම මිතුරා කෙරේ මහත් දුකක් දැනුනි. ඔහුට කිසිවක් කියන්නට ඕනෑ විය.

"යූසික්....." ඔහු නිසලව කතා කළේය.

යූසික් සෙළැවුණේ වත් නැත.

"කොහොමද නුඹ ඔය රස්තියාදුකාරයා ගැන දුක් වෙන්නේ?" අසල්වැසි කාන්තාවක් දොස් පවරන සුළුව කියනු තොලික්ට ඇසිනි. ඔවුන්ගේ නිවෙස අසළ පාරේ මුළු මහත් සෙනඟක් එක් රැස්ව හුන් බව ඔහුට අවබෝධ වූයේ එවිටය.

කෝප සහගත ප්‍රශ්න හා පිළිතුරු තොලික්ට අසාගත හැකිවිය.

"කවුද ඒක කළේ?"

"වෙන කවුද, යෙව්ස්ට්‍රැට්ගේ කොල්ලා මිසක"

"හපොයි බොලේ! ඒකා එච්චර දෙයක් කළේ කොහොමද?"

"ඒකගෙන්ම අහනවා. බලනවා ඒකා හැමෝම දිහා වෘක පැටියෙක් වගේ රවා බලන හැටි"

තොලික් යළිත් වරක් යූසික් දෙස බැලීය.

ඔහුගේ හදවත අනුකම්පාවෙන් රිදුම් දුනි.

මිනිසුන් යූසික් සමඟ එතරම් කෝපව සිටින්නේ මන්දැයි ඔහුට තේරුම් ගත නොහැකි විය. "ඉතිං එයාට මාව මරන්ඩ ඕන වෙන්ඩ ඇත්තේ එයාට කේන්ති ගිය වෙලාවේ වෙන්ඩ ඇති. ඒත් දැන් එයා දැන් ඒක විඳවනවා, පව් දුප්පතා"

තොලික්ට සෙනඟ දෙස හැරී මෙසේ කෑ ගසන්නට ඕනෑ විය. "මේ බලන්න. මේ මං පණ පිටින්!" එහෙත් වචන ඔහුගේ උගුරේ ඇලිනි.

ඔහු දුටු දෑ වදනින් කිව නොහැකි තරම් බියකරු විය. එය ඔහුගේ ඉතාමත් නරකම භීතියටත් වඩා බියකරු එකක් විය.

මිනිස්සු පියවරක් පසෙකට වූහ.

කොකා පාර මැද වැතිර හුනි. දුන් නිල් පැහැව ඇති උගේ දෙපා උගේම සිරුර යටට එබී ගොසිනි. උගේ දිගු ගෙල පිටතට දිගු වී ගෙනය. අත්තටු විහිදී ගොසිනි. හරියටම ඌ ඉහළ නැඟෙන්නට යත්න දරන්නාක් සේය. එහෙත් ඌට එය කළ නොහැකිය.

කුරුල්ලා මිය ගොසිනි.

පාර පැද්දෙන්නාක් සේ තොලික්ට දැනිනි. ලොකු ඇඳිරි කවයන් ඔහුගේ දෑස් ඉදිරිපිටින් පාව ගියේය.

ඇද නොවැටෙනු පිණිස ඔහු සෙනඟ ගොඩට එකතු

විය. තමා ඉතා කුඩා වූවාක් සේද, අසරණ වූවා සේද ඔහුට දැනුනි. එසේම සීතල බවක්ද හැඟිනි. හරියටම මෙය උණුසුම් ගිම්හානය නොව සීතල සිසිරය වූවාක් සේය.

ඔහුගේ පියා ඔහු ගෙතුළට කැඳවාගෙන යනු ඔහුට මතකයක් නැත. යූසික් තුවක්කුවත් රැගෙන ගෙයින් පිටතට එනවිට කුමක් කරන්නට යන්නේ දැයි ඔහුවත් දැන නොසිටි බව මිනිසුන් කී දේ තොලික්ට ඇසුනේ නැත. යූසික්ට ඕනෑ වී තිබුණේ තොලික්ට එකට එක කරන්නට පමණකි. පැට්රුබෙයිචික්ලාගේ ගෙදරට ඉහළින් කොකා පියාඹනු දකිමින් ඔහු ඌට ඉලක්කය අල්ලා සම්පූර්ණ කුරුළු උණ්ඩයෙන් ඌ හිල්කොට දැමීය.

පාර පුරා මී වදයක සේ සූ හඬ නැඟිනි.

මිනිස්සු යෙව්ස්ට්‍රැට්ටත්, නාස්ත්‍යා ස්කැච්ලියස්ටත් දොස් පවරන සුළුව බැණ වැදුනහ. සමහරෙක් විවෘතවම කියා පෑවේ ඔවුන්ගේ පුතා වැනි කරදර කාරයෙකුට යෙල්නිච් ගමේ කිසිදු ඉඩක් නැති බවය, එවන් මැරවරයෙකුගෙන් බලාපොරොත්තු විය හැක්කේ කරදරයක් පමණක් බවය.

මේ අතරෙහි යූසික් අතුරුදහන්ව තිබිණි.

චිත්තවේගයන් කෙතරම් උස්ව නැඟ ආවේදැයි යත්, පැහැදිළි ගිම්හාන අහසෙහි ඇරඹී තිබූ මහත් කැළඹීම මිනිස්සු එක්වරම නොදුටුවහ.

වියෝ දුකින් යුත් එක් කොක් මවක් නොව, මේ ශෝකාන්තය දැනගත් මුළු මහත් කොක් රැනක්ම පැරණි පොප්ලර් ගස ඉහළින් ශෝකයෙන්ද, බලාපොරොත්තු සුන් බවින්ද යටිගිරියෙන් හඬ තලමින් උන්හ.

කුඩා කොක් පැටව් කූඩුවෙහි බියපත්ව එකට ගුලිවී කුසගින්නේ උන්හ.

හිරිහැරයට පත් කොක්කු දැන් මිනිසුන්ගේ හිස් වලට උඩින් පියෑඹූහ. උන් මෙහි පැමිණෙන්නට ඇත්තේ අසල්වැසි සියළු කූඩු වල සිට වන්නට ඇත.

මිනිසුන් ඉවතට ගිය සැණින්ම පාරට පහත් වූ කොක්කු මළ කුරුල්ලා වටකොට ගත්හ. උන්ගේ දුක්බර මොරදීම් දිගු වේලාවක් යනතුරු බැස ගියේ නැත.

මුහුණු ජනෙල් පියන් මතට තද විණි. එය සිදුවෙමින්

තිබුණේ තොලික්ගේ ගේ ඉදිරිපිටය. ඉතා ඉක්මණින්ම ඔහුගේ මවට තව දුරටත් උසුලාගෙන සිටින්නට නොහැකි විය. ඈ එළියට දිවැවිත් වැළපුනාය.

"මිනිස්සුනේ, අසල්වැසියනේ මොනවා හරි කරන්න ඕනෑ..."

යෙව්ස්ට්‍රැට් ස්කැව්ලියස් ඉස්කෝප්පයක් රැගෙන වත්තෙන් පිටතට ආවේය. වැඩිහිටියෝ සහ ළමෝ අනෙක් නිවෙස් වලින් පිටතට ආහ.

මළ කුරුල්ලා අසළට ළං වූ ස්කැව්ලියස් මඟ බඩ තණ ගොල්ලෙහි ඉස්කෝප්පය ඇන වළක් හාරන්නට විය.

නිහඬ යෙව්ස්ට්‍රැට් එය කරන්නේ ඉතා අසීරුවෙන් බව හැම කෙනෙක්ම දුටහ. ඔහු සිටියේ තම පුතු කෙරේ කෝපයෙනි. එසේම ඔහු වෙනුවෙන් මේ අවසාන ශෝක රාජකාරිය ඉටු කරන්නට සූදානමිනි. ඒ දුෂ්ට ක්‍රියාව වෙනුවෙන් අඩු තරමින් කිසියම් පිරිමසා ලීමක් සිදුකරන ලෙසිනි.

"අනේ යෙව්ස්ට්‍රැට්!" තොලික්ගේ මව දෑත් විහිදූවාය." ඔහේ ඔය මොකද කරන්නේ? ඕක කොහෙත්ම අසල්වැසියෙක් කරන දෙයක් නෙවෙයි"

ස්කැව්ලියස් බිම හෑරීම නතර කළේය. තම අසල්වැසිනිය කෝප ගැන්වීමට තමා කළේ කුමක්දැයි ඔහුට තේරුම් ගියේ නැත.

"ඕක අපේ ජනේලේ ඉස්සරහම සදහටම තියේවි. අපි ඒ තරං දඬුවමක් ලබන්නද සුදුසු?" තොලික්ගේ මව හඬන්නට වූවාය.

සියල්ලෝ ඊට එකඟ වූහ. එය අසාධාරණ එකක් වන්නට ඉඩ තිබිණි.

යෙව්ස්ට්‍රැට් මොහොතක් සිතමින් සිටගෙන හුනි. සෙනඟ දෙස බැලූ ඔහු කොකා මතින් නැමී ඌ උස්සාගෙන, ඉස්කෝප්පයද ගෙන තමන්ගේ වත්ත කෙළවර බලා ගමන් ගති.

මිනිස්සු ස්කැව්ලියස් පසු පස්සේ ඔහුගේ වත්ත හරහා ගමන් ගත්හ. යෙව්ස්ට්‍රැට් කොකා චෙරිගස් කීපයක් අසළින් වැළලීය.

මහත් ශෝකයට පත්ව හුන් කුරුල්ලෝ දූන් නිහඬව යෙව්ස්ට්‍රැට්ගේ වත්ත අතරේ දිගු වේලාවක් තිස්සේ නිදැල්ලේ ඇඳුනේ මිනිසුන්ට නොබියව නැවුම් ගොඩැල්ල මත බැස පා වලින් බලාපොරොත්තු සුන් ලෙස එය පහුරු ගාමිනි.

සැන්දෑව වන විට කුඩා කොක් පැටව් දෙදෙනෙක් කුඩුවෙන් පිටට ඇද වැටුණාහ. තවමත් උන්ගේ පිහාටු මුළුමනින් වැඩී නැත.

උන් ඇද වැටුණේ දුක නිසාද, කුසගින්න නිසාදැයි කීම උගහට විය. වැඩිපුරම සිතිය හැක්කේ මුළු පවුලම තනිව ඇති දැඩි කිරීමේ නොහැකියාව අවබෝධ කොට ගනිමින් කොක් මව උන් මියෙන්නට ඉඩ හැර ඇති බවය.

එහෙත් කොක් පැටවුන් තවමත් පණ පිටිනි. උන් ගෙතුළට ගෙන ගිය තොලික් මිලට් කැඳ ටිකක් කවා උඳුන පිටුපසින් තැනෙක තබා කබායකින් වැසුවේය. උහු උද්‍යෝගිමත්ව කුඩා හොට වලින් තොලික්ගේ කමිස අත අදින්නට වූහ.

පැට්රුබෙයිකා නිවැසියෝ සියල්ල නින්දට ගිය විට යූසික්ගේ මව පැමිණ ඔවුන්ගේ ජනේලයට තට්ටු කළාය.

"තොලික්!" ඈ හඬ ගෑවේ හිරිහැරයට පත් කටහඬිනි.

තොලික් ඇඳෙන් බිමට පැන මිදුලට දිව ආවේය.

"තොලික් රත්තරං පුතේ, අපේ යූසික් කොහේදෝ ගිහිල්ලා. අපි දන්නෙ නෑ කොහෙන් එයා හොයන්ඩද කියලා. තාත්තා හැම තැනම බැලුවා...."

ආපසු ගෙතුළට ගිය තොලික් පහන දැල්වීය. යූසික්ගේ මව කලබලයෙන් යළිත් ඇගේ ගෙදරට ගියාය.

පාවහන් නොලෑ දෙපයින්, පෝටිකෝව අසළ වූ විශාල ගල්ගෙඩි වටා ඈ ඇවිද ගියේ නිසලව හඬමින් හා දුක් ගැනවිලි නඟමිනි.

"අනේ... මං දූන් මොනවා කරන්නද? මං හැම කෙනෙක්වම බලන්න ගියා... අනේ මගේ පුතේ, මගේ රත්තරනේ" පහනක් ගත් තොලික් දකින විට ඇය වඩාත් වැඩි හඬින් හඬන්නට වූවාය. "අනේ එයා මොකවත් භයානක දෙයක් හෙම කරගන්න හිතන්න එපා.... මං දූන් ආයෙත් වටපිටේ ගෙවල් වලට ගිහින් බලනවා. සමහර වේලාවට

මොනවා හරි දැන ගන්න පුළුවන් වේවි.." ඈ රාත්‍රිය තුළට නොපෙනී ගියාය.

තොලික් යෙව්ස්ට්‍රැට්ලාගේ මිදුල අතරින් ගමන් කළේය.

යූසික්ගේ අතුරුදන් වීමෙන් තදින් කණස්සල්ලට පත් ඔහුට එදින මිනිසුන් ඉදිරිපිට සිටගෙන සිටි යූසික්ගේ වරදකාරී මුහුණ සිහිපත් විය. ඔවුන්ගේ මිතුදම එතරම් තද වේදනාකාරී පිරික්සීමකට බඳුන් කොට තිබුණේ වුවද, මිතුරෙකු කෙරේ වූ යුතුකමේ හැඟීමක් තොලික්ට මොහොතක් හෝ අපතේ නොයවා රාත්‍රී පිරික්සුමකට පිටත් වීමට බල කළේය.

තොලික් මුලින්ම කළේ යෙව්ස්ට්‍රැට්ලාගේ ගෙදර අට්ටාලයට නැඟ බැලීමය. වහළයට යටින් වූ ජනේලය ළඟ යූසික් පැහැදිළිවම බොහෝ වේලාවක් සිටගෙන සිට තිබිණි. පසුගිය අවුරුද්දේ පිදුරු මිටියක් ඔහුගේ දෙපා යටින් කුඩුවී ගොසිනි.

එසේ නම් පාරේත්, වත්තේත් සිදුවූ සියල්ල යූසික් අසන්නට සහ දකින්නට ඇත.

අට්ටාලයෙන් බිමට බැස ගත් තොලික් පහනෙන් මඟ ආලෝක කොට ගනිමින් මිදුලට ගමන් කළේය.

ඔහු තාප්පය ළඟ මොහොතකට නතර වුණි. අන්ධකාරය තුළට එබී බලන්නට බයාදු කමින් යුතුව ඔහු සැහැල්ලු කඩුල්ල හැර වත්ත කෙළවර දෙසට වැටියක් දිගේ ගමන් ගති.

අර්තාපල් කරටි වලින් සීතල පිණි බිම හෙළමින් ඔහු ඉතා ඉක්මණින්ම යෙව්ස්ට්‍රැට් කොකා වැළලූ තැනට ළඟා විය.

පහනෙහි දීප්තිමත් එළිය චෙරි ගස් අසළ එළිමහනට ඈද වැටිණි.

ඔව්, යූසික් එහි විය.

ඔහු සිටියේ තදබද වූ ඇඳිරි පස් ගොඩැල්ල මත ගුලි ගැසීගෙනය. කොක් මව ඔහුට නොදුරෙහි වැටිය මත සිටගෙන උන්නාය. ඇගේ හිස උස් අර්තාපල් කරටි මතින් දිගුවීගෙනය. කෙකිය ඇගේ දෑස් දීප්තිමත් එළියෙන් එක් මොහොතකට වසා යළිත් විවර කරනු තොලික් දිටීය. ඇගේ දෑස් දුකින්ද, දොස් පවරන සුළු බවින්ද යුතු විය.

යූසික් සෙළැවුණේ නැත.

ඔහු මතින් නැමීගත් තොලික් දුටුවේ ඔහු නොසෙල්වෙන බවය, හරියටම සීතලෙන් ගල් ගැසුනා සේය. සමහරවිට ඔහුට නින්ද ගොසින් වත්ද? එහෙත් කිසිවෙක් හිඳගෙන නිදා සිටිනු කිසිදාක තොලික් දැක නැත.

එය තම මිතුරාගේ ජීවිතයේ ඉතා අසීරු පැයක් විය. ඔහු පළමුවෙන් තම බැල්ම හෙළා තිබුණේ තමාගේම නොමඟ ගිය ආත්මය දෙසටය, එය ඔහු පවා තේරුම් ගෙන තිබුණේ නැත. එය ඔහුට ඉබාගාතේ යන්නට මඟ පෙන්වීය. එසේම තවදුරටත් ඔහුට තම තද වරකාරී හැඟීම් බැහැර ලන්නට හෝ සිදුවූ සියල්ල අමතක කරන්නට නොහැකි විය.

තොලික් මිතුරාගේ උරහිසට අත තැබීය.

යූසික් කිසිවක් කීවේ නැත. ඉක්බිති තොලික් ඔහුගේ වැළමිටෙන් අල්ලා මුළු වැර යොදා ඇද්දේය.

යූසික් නැගිට්ටේය. දෙපා අවිනිශ්චිතව තබමින්, ළදරුවෙක් පළමු වරට පා තබන්නට යන්නා සේ ඔහු කීකරු ලෙස තොලික් පසුපස ගමන් ගති.

ඔවුහු වැටිය දිගේත්, ඉක්බිති ස්කැවිලියස්ගේ ගෙදර මිදුල මැදිනුත් ගමන් ගත්තේ නිහඬවය.

එළිපත්ත මතදී යූසික් යාන්තමින් අසාගත හැකි හඬකින් කතා කළේය.

"දැන් මොකක් වේවිද තොලික්?"

"මං දන් නෑ"

ඔවුහු දිගු වේලාවක් නිහඬව සිටගෙන උන්හ. ඉන්පසු ලාම්පුවේ විමිනිය එසැවූ තොලික් එළිය නිමා දැමීය. හිමිදිරිය චෙරි ගස් අතරින් උදාවෙමින් තිබිණි.

"ඈ මුළු රෑ පුරාම ඈ විදිහට හිටගෙන උන්නද?"

"මුළු රෑ පුරාම" යූසික් ලැජ්ජාවෙන් හිස නැමීය.

"උදුන පිටපස්සෙ මං කොක් පැටව් දෙන්නෙක් තියලා තියෙනවා. උන් කූඩුවෙන් බිමට වැටුණා. ලොකු වෙනකං දැන් අපිට උන්ව බලා කියාගන්න වෙනවා"

"ඔව්, එහෙම තමා" යූසික් එකඟ විය.

යද්විගා බෙගන්ස්කයා

අද්භූත අත්උදව්කාරයෝ

වෙනස් වෙනස් වර්ගයන්ගේ ප්‍රීතිමත් ආලෝකයන් විසුරුවමින් තුෂරය ජනෙල් මත සිත් බඳින රටාවන් ඇඳලාය. මිදුණු ගස් අතු එහා මෙහා වනමින්, දුම් බටය දිගේ හූ හඬ දෙමින් සුළඟ එළියේ හමමින් තිබිණි.

"ආත්තම්මේ අපිට කතාවක් කියන්නකෝ" ආතම්මාගේ උණුසුම් අතට වාරුවෙමින් ඕල්යා කීවාය.

"හැබැයි ආත්තම්මේ සතුට ගේන කතාවක්. හුළඟ හූ කියන එක නවත්තන එකක්. එතකොට අපිට ලස්සන හීන පේන කතාවක් හොඳේ" තොලික් කීවේ ආතම්මාට ළංව තුරුළු වෙමින් සහ ආදරයෙන් ඇගේ දෑස් තුළට එබී බලමිනි.

මැහුම් වැඩ පසෙකට කළ ආත්තම්මා කණ්නාඩි කුට්ටම නළලට එසැවූවාය. ඇගේ රැළි වැටුණු මුහුණේ කරුණාවන්ත සිනාවක් දැල්විණි.

"මං මොන කතාවද කියන්ඩ ඕනෑ?" ඈ ඇසුවේ තොලික්ගේ හිසේ මුරණ්ඩු සහගතව ඇලී තිබූ කෙස් රොදක් අතින් පිරිමදිමිනි. "මං එහෙනං කියන්නංකෝ ඉන්ද්‍රජාලංකාර කුරුමිට්ටි මිනිස්සු ගැන ඔයාලට. දැන් ඉතිං අහගන්නකෝ"

"එකමත් එක කාලෙක ජීවත් වුණා සපත්තු හදන කෙනෙක්..." ආත්තම්මා කතාව කියන්න ගත්තා. "එයා හොඳටම දුප්පත් වුණා. කොච්චර දුප්පත් වුණාද කියනවනං එයා ගාව ඉතුරු වුණේ එකම එක පුංචි හම් කෑල්ලක් විතරයි. 'මං දැන් මේ හම් කෑල්ල කපනවා, සපත්තු ජෝඩුවකට

හරියන විදිහට. හෙට ඒවා මහනවා' එහෙම හිතලා සපත්තු මහත්තා නින්දට ගියා. පහුවදා උදේ එයා නැගිටලා වැඩ කරන්න බැලුවා. එතකොට එයා දැක්කාඑයාගෙ වැඩ මේසේ උඩ හොඳට හදාපු සපත්තු ජෝඩුවක් තියෙනවා. ඒක එයා එතෙක් දැකපු ලස්සනම සපත්තු ජෝඩුවයි. සපත්තු මහත්තා මේක විකුණලා ඒ සල්ලි වලින් වැඩිපුර හම් අරගෙන ආවා. ඊට පස්සේ එයින් සපත්තු හතරකට හරියන විදිහට කෑලි කපලා නිදා ගත්තා. පහුවදා උදේ එයාට දකින්න ලැබුණේ සපත්තු ජෝඩු හතරම මහලා සූදානම් වෙලා තියෙන හැටියි. ඉතිං මේ විදිහට දිගටම දිගටම සිද්ද වුණා. සපත්තු මහත්තා හැන්දෑවට කොච්චර හම් කපලා තිබුණත් උදේට ඒ ගානට හරියන සපත්තු සූදානම් වෙලා තිබුණා. 'මට මේ සපත්තු හැමදාම රෑට මහලා දෙන්නේ කවුදැයි කියලා බලන්න ඕනෑ' කියලා සපත්තු මහත්තා කල්පනා කළා. එදා රෑ එයා උඳුන පිටපස්සේ හැංගිලා බලා උන්නා. මහ රෑ මැදියමේ පුංචි කුරුමිට්ටෝ දෙන්නෙක් මතු වුණා. ඒ අය බංකුවේ ඉඳගෙන සපත්තු මහන්න ගත්තා. මහලා ඉවර වුණු ගමන්ම ඒ දෙන්නා අතුරුදහන් වුණා."

ඉන්ද්‍රජාලමය කුරුමිට්ටන් ගැන සිත් ඇදගන්නා බොහෝ දේ එදින සැඳෑවේ ආතම්මා ඔවුනට කීවාය. ඕල්යා හා තොලික් දෙදෙනා වඩාත් කැමැති වූයේ මේ කුඩා මිනිසුන් නොපෙනී සිට විශාල මිනිසුන්ට උදව් කිරීම ඉකරෙහිය.

"ආත්තම්මේ ඔයාත් ආසද ඒ අය වගේ උදව්කාරයෝ ඔයාටත් ඉන්නවානං?" තොලික් ඇසුවේය.

"මොකෝ නැත්තේ, මං හරි ආසයි රත්තරනේ" එහෙම කියූ ආත්තම්මා යළිත් මහන්නට වූවාය.

"ඒ අය කතන්දර වල විතරක් ඉන්න එක තමා දුක, එහෙම නැත්තං ඒ ගොල්ලෝ මට 'බ' ලියලා දේවි. මං ඒක ලියන කොට එච්චර හොඳට එන්නේ නෑ" තොලික් සුසුම් ලෑය.

"දැන් ඔයාලා නිදා ගන්න යන්න ඕනෑ. ඔය කතාව

අපිව හොඳටෝම පරක්කු කළා" ආත්තම්මා කීවාය.

තමාගේ ඇඳේ වැතිරුණු ඕල්යා සඳ එළියෙන් එළිය වුණු ජනේලය දෙස බලා කුඩා ඉන්ද්‍රජාලමය මිනිස්සු ගැන සිතන්නට ගත්තාය. "මක්වෙයිද තොලිකුයි, මමයි...."

ඕල්යා සිනා පා ඇඳෙන් ඉහළට නැගී සිට සහෝදරයාට සෙමෙන් කතා කළාය.

"තොලික්, ඒයි තොලික් ඔයා නිදිද?"

"නෑ"

"ඔයා දන්නවද මොකක්ද මං හිත හිතා උන්නේ කියලා?"

"මොකක්ද?"

"අපිත් පුංචි කුරුම්ට්ටෝ විදිහට පෙනී හිටිමු"

"ඒ කොහොමද?" තොලික් ඇසුවේ පුදුමයට පත් වෙමින්.

"මෙහාට එන්න, මං කියන්නං. හැබැයි සද්ද නැතුව ආත්තම්මාට ඇහෙන්නෙ නැති වෙන්න"

එක් මොහොතකින් තොලික් තම සහෝදරියගේ ඇඳේ හිඳ ගත්තේය. ඔවුන් කතා කළේ මොනවාදැයි කිසිවෙකු දන්නේ නැත.

අත්තම්මා උදෑසනම නැගිට්ටාය. දර ටිකක් ගෙන එන්නට ඈ එළියට යන්නට සූදානම් වෙත්දීම ඈ දුටුවේ උදුන අසළ දර ගොඩ ගසා ඇති අයුරුය. ඉතිං ඈ වතුර ගෙනෙන්නට ළිඳට යන්නට තීරණය කළාය. එහෙත් දැනටමත් ගෙට වතුර ගෙනැවිත් තිබිණි. වතුරින් පිරීගත් බාල්දියක් නිල් පැහැ ඇසින් බංකුව උඩ සිට ඈ දෙස බැලීය. පෝර්ටිකෝවට ගිය ආත්තම්මා විශ්වාස කොට ගත නොහැකි ලෙසින් ඇස් හයා බැලුවාය. කවුරුන් හෝ පාරේ තිබූ හිම අතු ගා දමා ලිස්සන්නේ නැති ලෙසින් ඒ මත වැලි ඉස තිබිණි. ඉතිං ඈ එළදෙනගෙන් කිරි දොවන්නට ගියාය. ඈ එහි සිටින අතරෙහි කිසිවෙක් මේසය පිරිසිදු කොට පොළොව අතුගා ගොසිනි.

අත්තම්මා විශ්මයෙන් හිස සොළවා සිනා පෑවා

පමණෙකි. ඒ අතරෙහි ඕල්යා හා තොලික් එකිනෙකා දෙස හොරෙන් බලමින් ඉගි මැරූහ. ඇත්තවශයෙන්ම එය අපූරු සෙල්ලමකි!

කුරුම්ටි ඉන්ද්‍රජාලම් මිනිස්සු උදව් කිරීම නිසා ආත්තම්මා ඉතාමත් ප්‍රීතියට පත්ව උන්නාය. එයින් ගෙදර වැඩ ඇයට වඩාත් පහසු විය. අම්මාත් තාත්තාත් ගෙදර ආ පසු ආත්තම්මා ඔවුන්ට සියල්ල කීවාය.

"ඉතිං අපි කොහොමද කුරුම්ටි ඉන්ද්‍රජාලම් මිනිස්සුන්ට ස්තුති කරන්නේ?" අම්මා ඇසුවේ ඕල්යා හා තොලික් දෙස බැල්මක් හෙළමිනි.

"පොඩ්ඩක් ඉන්නකෝ! මා ගාව දොඩම් ගෙඩි දෙකක් තියෙනවා. මං ඒවා ළමයින්ට දෙන්නයි ගෙනාවේ. ඒත් මං හිතන්නේ ඒවා කුරුම්ටි මිනිස්සුන්ට දෙන එකයි වඩා හොඳ කියලා"

තාත්තා කීවේ ලොකු රත්තරං පැහැ දොඩම් ගෙඩි දෙකක් බෑගයෙන් ගනිමිනි.

"ඒත් තාත්තේ..." තොලික් හඬ තලමින් තාත්තා වෙත දිවීය. එහෙත් ඕල්යා කොතරම් තදින් ඇද්දේද යත් ඔහු එක්වරම නැවතිනි. ඒ නොදුටු බවක් පෙන්වමින් තාත්තා " මොකක්ද පුතේ ඔයා කිව්වේ?" යි ඇසීය.

"කුරුම්ටි මිනිස්සු ඉන්නේ කොහේද කියලා දන්නේ නැතුව කොහොමද ඔයා එයාලට ඒවා දෙන්නේ කියලායි එයාට අහන්න ඕන වුණේ?" ඕල්යා මල්ලී බේරා ගැනීමට ඉදිරිපත් වූවාය.

"හොඳා අපි ඒ ගොල්ලෝ හොය හොයා ඉන්න ඕන නෑ. අපි දොඩං ගෙඩි පිඟානක කියලා මේසෙ උඩින් තියමු. කුරු මිනිස්සු ආවහම ඒ ගොල්ලෝ තේරුම් ගනීවි මේක එයාලගෙ වැඩ වලට තෑග්ගක් කියලා" ආත්තම්මා සිනාසෙමින් කීවාය.

දොඩම් ඉතා ප්‍රණීත වූත්, සාරයෙන් පිරුණාවූත්, සුවඳින් යුතු වූත් ඒවා විය. ඕල්යා සහ තොලික් ඒවා රහසින් කා පොතු පිඟානේම තබා යළි මේසය මත තැබූහ. කුරුම්ටි

උදව්කරුවෝ තමන්ට දුන් තෑග්ග කෑ බව ආත්තම්මා සිතුවාය.

"අපි හෙටත් කුරුමිටි ඉන්ද්‍රජාලම් මිනිස්සු වගේ රඟපාමු නේද?" එදින සැන්දෑවේ නින්දට යන අතරෙහි තොලික් ඇසීය.

"ඔව් හැබෑටම කරමු" ඕල්යා කීවාය. "මං නතාෂාටයි, ඊරාටයි, නාදියාටයි, මගේ අනිත් ඔක්කොම යාළුවන්ටයි උගන්නනවා මේ සෙල්ලම කරන හැටි"

"එතකොට මාත් මගේ පංතියේ යාළුවන්ට උගන්නනවා" තොලික් කීවේය.



අලෙස් මහ්නාච්

බ්‍රෙස්ට් බලකොටුවේ දරුවෝ

එය විශාල සහ භයංකර යුද්දයක පළමු සතිය විය. පෙරට එන හිට්ලර්ගේ හමුදා ඒකක දැනටමත් මින්ස්ක්* වෙත වූ මාවත් වෙත ළඟා වී තිබිණි. ඒ අතරෙහි නාසි පාබල හමුදා ඩිවිෂනයන් තවමත් බ්‍රෙස්ට් බලකොටුව අල්ලා ගැනීමට සටන් වදිමින් උන්හ.

සතුරු ජනරාල්වරු හා නිළධරයෝ දෙගිඩියාවෙන් උන්හ. මේ කුඩා දේශ සීමා බලකොටුව වනසා දමන්නේ කෙසේද? ඉන්පසු ඔවුන් තීරණය කළේ කුසගින්නත්, පිපාසයත් රුසියානුවන්ට යටත් වීමට බල කරනු ඇති බවය. ඉතිං වඩාත්ම වැදගත් දෙය වූයේ සෝවියට් සෙබළුන් වතුර නැතිව සිටින්නට සැලැස්වීමය. එහෙයින් බරැති මැෂින් තුවක්කු තවදුරටත් වෙඩි නොතබනු ඇත. බලකොටුවේ ආරක්ෂකයෝ පිපාසයෙන් දුර්වල වනු ඇත. එය ඔවුන් වනසා දැමීමට පහසුවක් වනු ඇත.

සැළසුම කෙරෙහි තදින් විශ්වාසය තැබූ නාසීහු බලකොටුව වටා අගල් හෑරූහ. සෑම ගලකටම, සෑම පඳුරකටම සහ සෑම මැෂින් තුවක්කු පොළකටම ඔවුහු ඔවුන්ගේ බැල්ම යොමු කළහ. විශේෂයෙන් සපද්නි බග් ගඟෙහිත් එහි අතු ගංගාව වූ මුකොවෙට්ස් හිත් ඉවුරු දිගේ

වූ තුවක්කු පොළවලට ඔවුන්ගේ බැල්ම යොමු කළහ. විශාල විශ්කම්භයෙන් යුතු ෂෙල් වෙඩි සහ ලෝහ තහඩු විදගෙන යන, ගිනිගන්නා සුළු හා පුපුර සුළු වෙඩි උණ්ඩ ප්‍රහාරයක් බලකොටුවෙහි විසිර තිබිණි. සතුරා බරැති යුද ටැංකිද, ගුවන් යානාද එවීය. එසේම ගිනිදළ විදිනයන්ද, කඳුළු ගෑස්ද යොදා ගැණිනි. එමගින් නොනැවතී සෝවියට් පිහිටුම් කළඹවා ලීය.

බලකොටුව රැකගන්නවුන් සිටියේ ඉතා අසීරු අඩියකය.

*මින්ස්ක්- බෙලොරුසියාවේ අගනුවරය

ගිලන් හල ප්‍රධානී නතාලියා කොන්ද්‍රොව්ස්කයා මැසිවිලි නැගුවාය.

"අපි ගාව කිසිම බේතක් හේතක් නෑ. එකම වෙළුම් පටියක් වත් නෑ. හැම සටනක් ගානේම තුවාල කාරයෝ වැඩි වෙනවා"

"බලකොටු චතුරස්‍රයේ මිනිස්සු හුඟ ගාණක් මැරිලා වැටිලා ඉන්නවා. ඒ හැමෝම ගාව ප්‍රථමාධාර කට්ටලයක් තියෙන්ඩ පුළුවන්" දේශසීමා මුරපොළ අණදෙන නිළධාරී අන්ද්‍රෙයි කිෂෙවාතොව්ගේ පහළොස් හැවිරිදි දියණිය න්‍යූරා කීවාය.

"එතෙන්ට ළං වෙන්ඩ බෑ. එතන වෙඩි වරුසාවයි"

"වෙඩි වරුසාවක් මාව නවත්තන්නේ නෑ" න්‍යූරාගේ මිතුරිය වාල්යා සෙන්කිනා ප්‍රකාශ කළාය.

ගිලන් හලෙහි වෙළුම් පටි පෙනෙන්නට වූ කල නතාලියාට දෑස් අදහා ගැනීමට පවා නොහැකි විය. පැහැදිළිවම ගැහැණු ළමෝ බිම් ගෙවලින් එළියට බඩ ගා ෂෙල් වෙඩි වලින් පතුරු ගැසුණු, දවල් දවස තිස්සේ රුදුරු ලෙස සටන් ඇවිළුණු චතුරස්‍රයට රාත්‍රියේ ගොස් තිබිණි.

මේ වික්‍රමය පිළිබඳ ආරංචි වූ විට රෙජිමේන්තුව බාරයේ වැඩෙන දරුවෙකු වූ කෝල්යා නොවිකොව්ට නිහඬව සිටිය නොහැකිව තම රහස් හෙළි කළේය.

"ඩොක්ටර්, අපි ඔයාට බොහෝම ඉක්මණින් පැණිරස කෑම වලින් සංග්‍රහ කරනවා"

"අපි ඒවා ටිකක් ගේන්නයි යන්නේ!" පේත්යා වසිලියෙව්

තම මිතුරාගේ වදන් ස්ථිර කළේය.

සියල්ලෝම මෙය සැළකුයේ විහිළුවක් ලෙසිනි. ඔවුන් කොයි ඇන්තෑවකින් පැණිරස කැවිලි සොයන්නද? මිනිස්සු දින ගණනාවකින් පාන් පොත්තක් හෝ දැක නොතිබුණහ.

එහෙත් පාසල් ළමෝ නිසැකවම කළේ විහිළුවක් නොවේ. ඔවුහු වටකුරු බැරැක්ක ගොඩනැගිල්ලේ පළමු මහළට නැංගහ. එතැන සිට ඔවුහු වරෙක වෙළඳ සැළක් තිබූ තැන දෙස පරීක්ෂාකාරීව බැලූහ. යුද්දයට කලින් එහි විවිධාකාර ගේදොර බඩුභාණ්ඩ සහ ආහාර ද්‍රව්‍ය විකිණිනි. දැන් එය නටඹුන්ව වැතිරගෙනය. ඉතා ඉක්මණින් රෙජිමේන්තුවේ ළමෝ මිනිසුන් රහිත වෙඩි පරාසය වෙත ඇදුනෝය. එය පිහිටියේ සෝවියට්වරුන් අල්ලාගෙන සිටි බැරැක්ක සහ නාසි පිහිටුම් අතරෙහිය. ළමෝ හතර ගාතයෙන් බඩගාමින් හා එක් ෂෙල් වෙඩි වළක සිට තවෙකකට වේගයෙන් දුවමින් පෙරට ඇදුනහ.

"ආපහු එනවා!" සෙබළු මොර දුන්හ.

එහෙත් ළමෝ දැනටමත් දුර ඈතින් වූහ. ඔවුනට හඬගෑම් ඇසුනේ නැත. නැතහොත් සමහරවිට එය ඔවුනට ඇසුනා විය යුතුය, එහෙත් ඒ ගැන කිසිදු සැළකිල්ලක් දැක්වීම ඔවුහු ප්‍රතික්ෂේප කළහ.

පැය බාගයක් ගෙවිණි. පාසල් ළමෝ ගිලන් හළෙහි පෙනී සිටියේ ගෑස් මුහුණු ආවරණ පිරැවූ පොට්ටනියක් ද, කපු රෙදි මිටියක්ද සමගිනි.

"නුඹලා මහ දවාලේ එහේ ගියාද?" වාල්යා ඇසුවේ දොස් පවරනසුළුවය.

"අපි රෑ ගියා නං මේවා හොයා ගන්න වෙන්නේ නෑ" කෝලා බිස්කට් සහ පැණිරස කැවිලි මල්ල දක්වමින් පිළිතුරු දුනි.

ඔවුහු ඒවා කුඩා ළමුන්ටත්, ඉතා තදින් තුවාල වූවන්ටත් ඒවායින් සංග්‍රහ කළහ. වෛද්‍යවරියටත්, න්‍යූරාටත්, වාල්යාටත් ඒවා ලැබිණි.

"එතකොට ඔයාලට මොකුත් ඉතුරු වෙලා නැනේ"

වෛද්‍යවරිය කීවාය.

"අපි පුංචි ළමයිවත් තුවාල කාරයෝවත් නෙවෙයිනේ" දාහතර වියැති පේත්‍යා ක්ලීපා සියල්ලන් වෙනුවෙන් පිළිතුරු දුනි.

වෛද්‍යවරියත්, ගැහැණු ළමෝත් තීරණය කළේ තමන්ගේ කොටසත් කුඩා දරුවන්ට දෙන්නටය.

ගැහැණු අයටද තෑග්ගක් විය. ඒ වෙනස් වාතාවරණයකදී නම් ඔවුනට ශෝභන ඇඳුම් සකසා ගත හැකි කපු රෙදිය.

එහෙත් ගැහැණු පිරිස කල්පනා කළ දේ හි ඇඳුම් තිබුණේ අන්තිමටය. එහෙයින් ඔවුහු ඒවා වෙළුම් පටි සඳහා ඉරන්නට වූහ.

අවසර නොගෙන බලකොටුවෙන් පිටවීම පිළිබඳව, රෙජිමේන්තුවේ ඇති දැඩි වූ ළමුන් ගිලන් හළෙහි රඳවා තබන සේ ලෙෆ්ටිනන්ට් කිෂෙවාතොව් නියෝග දුනි. එසේම තවදුරටත්, ළමුන් ගැහැණු පිරිසෙහි අණ යටතට පත් කෙරිණි. එසේ තිබියදී පවා, ළමෝ ගිලන් හලෙන් හොරෙන් පිටට එන්නට සමත් වූහ. විශේෂයෙන්ම ඒ ප්‍රචණ්ඩව සටන් ඇවිළ තිබියදීය. එහෙත් ඔවුහු තමන් කොහේ ගියේද, කුමක් කළේද යනු කිසිවෙකුටත් නොකීහ.

පමණට වඩා සෙනඟින් පිරුණු ගිලන් හල ඇදිරි හා තදබදූති විය. ඉතාමත් තදින් තුවාල වූවෝ නොනැවතී වතුර ඉල්ලූහ.

කුඩා දරුවෝද නිරතුරුව වතුර ඉල්ලා හැඬූහ.

"අම්මා... අම්මා......."

කුඩා වෛද්‍ය සහායකයෝ කුඩා උන්ගේ දොම්නස පහකොට සනසන්නට යත්න දැරූහ.

"රෑට වතුර හම්බ වෙනවා!" කෝල්යා නොවිකොව් පොරොන්දු විය.

සැන්දෑවන විට කෝල්යා පේත්‍යා වසිල්යෙව්ට චින්තාපරව කතා කළේය.

"නුඹට ඇහුනද මං කියාපු දේ? මං පොරොන්දු වුණේ අපි දෙන්නා වෙනුවෙන්"

ජේත්‍යා කිසිවක් නොකීය.

"මං කතා කරන්නේ වතුර ගැනයි" කෝල්යා තදින් කියා සිටියේය. "අපිට අද රෑට මුකොව්ට්ස් ගඟට යන්න වෙනවා...."

"මාත් ඒ ගැන හිත හිතා උන්නේ" ජේත්‍යා හිස නොඔසොවමින් කීය.

ඉතා ඉක්මණින්ම ළමෝ පිරිස වැනසුණු බැරැක්ක බිත්තිය පිටුපස වකගැසී හිඳගෙන උන්හ. කෝල්යා මුලින්ම කතා කළේය.

"ඉවුර වෙඩි වරුසාවලින් වට කරන්න කියලා හිට්ලර් අණ දීලා වගෙයි ජේන්නේ. අපිට වතුර තියෙන්නේ....."

"... හරියට රත්තරං වගේ" වාක්‍යය සම්පූර්ණ කළේ වොලොද්යා ඉස්මයිලොව්ය.

"ඊටත් වඩා වටිනවා!" දොළොස් වියැති ජේත්‍යා කොටෙල්නිකොව් ඔහු නිවැරදි කළේය.

"නිහඬ වෙනවා!" කෝල්යා කීවේ ඔවුන් නිහඬ කරමිනි. "ලෝකෙම තියෙන ඔක්කොම රත්තරං දුන්නත් මෙහේට වතුර ගේන්ඩ බෑ. ජේත්‍යායි මායි ළඟ රත්තරං වටින සැළැස්මක් තියෙනවා. ඒ ගැන ආරංචි වෙන්ඩ කලින් හිට්ලර් මැරිලා යාවි. අපි මැරිච්ච නාසියෝ අස්සෙන් බඩ ගාන්න ඕනෑ. එතකොට උන්ගේ පරීක්ෂණ එළියකට හරි ගිනි එළියකට හරි අපිව අහු වුණොත් අපි පණ පිටින් ඉන්න අය හැටියට උන්ට ජේන එකක් නෑ."

කළ යුතු දේ කෝල්යා ළමුන්ට පෙන්වීය.

"අපි බඩගාන්න ඕනෑ බොහෝම හෙමින්, මටසිළුටුවට ඉබ්බො වගේ" ඔහු ඉගැන්වීය. "එතකොට වතුර බෝතල්වලින් මොන සද්දයක්වත් එන එකක් නෑ. උන් හිතාවි ඉවුරේ මැරිලා ඉන්න තව නාසියෙක් කියලා"

"ළමයිනේ එතකොට කෝ බෝතල්?" නාදූරා කිෂෙවටෝව්වා සිහිපත් කළාය.

"කළුවර වෙන්න කලින් අපි ඒවා හොයා ගන්න ඕනෑ!" වාල්යා සෙන්කිනා එකතු කළාය.

"ඕන තරං වෙලාව තියෙනවා" ඒ පේත්යාය.

"එළිය තියෙන වෙලාවේ අපි ඒවා හොයන්න ඕනෑ" කෝල්යා ගැහැණු ළමුන්ට උදව් දුනි.

"හොඳා එහෙනං, අපි ඒක දන්ම කරමු" පේත්යා වසිල්යෙව් අන්තිමේදී එකඟ විය. "ඒත් ඒවා හොඳට වැහිච්ච, තදට ඇබ ගහපු ඒවා වෙන්ඩ ඕනෑ. මීටර් පණහක් බඩගාන්න අපට පැය බාගයක් වත් යාවි"

ඇඳිරිය වැටුණු විට රෙජිමේන්තුවේ ළමෝ තම අසීරු කාර්යයට පිටත් වූහ. න්‍යූරාත් වාල්යාත් ඔවුන්ට සමුදෙන්නට ආහ.

"කොහොම වුණත් සෙබළුන්ට අපි කීවොත් මොකද? එතකොට ඒ ගොල්ලෝ ඔයාලට වෙඩි නොතියාවි. කළුවරයි, දන්නවද?" න්‍යූරා පිරිමි ළමුන් කැමති කරවා ගන්නට යත්න දැරුවාය.

"පට්ට පල් මෝඩ අදහස්" කෝල්යා කෝපයෙන් පිම්බේය.

"කාටවත් කිසි දෙයක් කියන්නේ නෑ!" වොලෝද්යා ගැහැණු ළමුන්ට අනතුරු හැඟවීය.

"ඔහේලා මේ වැඩේ ගැන මොකවත් දන්නේ නෑ! තේරුණාද?" එසේ කීවේ ස්තෙපාන් අක්සියෝතව්ය.

"මේ වැඩේ ගැන කිසි දෙයක් කියන්නේ නෑ. මේක අන්තිම රහසිගතයි!" පේත්යා වසිල්යෙව් මඳ විරාමයකට පසු අවසන් කළේය.

න්‍යූරාත්, වාල්යාත් ඔවුන් ගැන බිය වූහ. "යාළුවනේ! යන්න එපා! ඔයාලව මරා දාවි!" ගැහැණු ළමෝ මේ වදන් රාත්‍රිය තුළට දමා නොගැසුවා පමණෙකි. එහි අන්ධකාරය ඉඳහිට පිරික්සුම් ආලෝක ධාරාවන්ගෙන් තියුණු ලෙස කැපී යන්නේ දැලි පිහියකින් මෙනි. එසේම ගඟට ඉහළින් ගිනි දළු පුපුරා යමින් එහි ඉවුරු මතින් ආලෝකය ගලා යයි.

එහෙත් බ්‍රෙෂ්ට් බලකොටුවේ ළමුනට දැන් ආපසු හැරෙන්නට නොහැකිය. ඔවුහු දැන් සපථ කොට හමාරය. තරුණ පුරෝගාමින්ගේ සපථ කිරීම, දිය ගෙන එන බවට වූ

සපථ කිරීම කොට හමාරය.

නායූරාගේ දෑස් ඉදිරිපිට මැවුණේ ඇගේ කුඩා සොයුරු වාන්යාත්, කුඩා සොයුරිය ගාල්යාත් ආත්ත්ම්මාටත්, අම්මාටත්, නායූරාටත් ආයාචනා කරන සැටිය.

"මට බොන්න මොකවත් ඕනෑ! වතුර....!"

එසේම ඇයට අද උදේ නාසීන්ගේ රුදුරු ප්‍රහාරයද අමතක කළ නොහැකි විය. දේශසීමා මුරහට ග්‍රීෂා යෙරෙමෙයෙව්ගේ බලාපොරොත්තු සුන් හඬ ගැමද ඇයට තවමත් ඇසිය හැකි විය.

"මිනිස්සුනේ! මැෂින් තුවක්කුවේ අන්තිම වතුර ටික නටනවා!"

නැත! ආපසු පැමිණෙන ලෙස ගැහැණු ළමෝ කෑ නොගැසිය යුතුය. සැබැවින්ම මේ වික්‍රමාන්විත ක්‍රියාව සිදුකොට ඔවුන් ආපසු පැමිණෙන තුරු ඔවුහු බලා සිටිනු ඇත. වාල්යාත්, නායූරාත් දෙදෙනාම විශ්වාස කළේ පිරිමි ළමෝ පණපිටින් ආපසු පැමිණෙනු ඇති බවය.

ඉක්බිති ගැහැණු ළමෝ බෝතල් බිම් ගෙයට රැගෙන ගොස් ඒ පිළිබඳව සියල්ලටම මහත් උනන්දුවෙන් කියනු ඇත.

"ඒගොල්ලෝ ඒවා ගෙනාවේ මුකොවෙට්ස් ගඟෙන්!"

"කවුද මේ වීරයෝ?" ආරක්ෂකයින්ට දැන ගැනීමට ඕනෑ වෙනු ඇත. "කවුද ගඟ ළඟට ගිහින් ආපහු එන්න සමත් වුණේ?"

"අපි දන්නේ නෑ. සෙබළු වගයක් රෑ කාලෙදි ආවා. අන්ධකාරෙ හින්දා ඒ කවුද කියලා අපි දැක්කේ නෑ" නායූරාත් වාල්යාත් එක ලෙස පිළිතුරු දෙනු ඇත.

හිමිදිරියේදී ලෙෆ්ටිනන්ට් කිෂෙවාතොව් වෙනදා සේම පිහිටුම් පරීක්ෂාවට යද්දී ගිලන්හල අසළ නවතිනු ඇත. ඊයේ රාත්‍රියේ සියළු සිදුවීම් අණ දෙන නිළධාරීට වාර්තා කෙරෙනු ඇත. රෙජිමේන්තුවේ පිරිමි ළමෝද වාර්තා කරනු ඇත. සියල්ලෝ වෙනුවෙන් එය කරනු ඇත්තේ වොලොද්යාය.

"ඔබේ නියෝගය ක්‍රියාත්මක කරමින් අපි උන්නේ බිම් ගෙයි ලෙෆ්ටිනන්ට් සහෝදරයා. අපි තුවාල ලබාපු අයවයි, ළමයින්වයි බලාගන්න උදව් කළා!" ඔහු කියනු ඇත.

එවිට කෝල්යාගේ හිසේ ඇති වෙළුම් පටිය දකිමින් ලෙෆ්ටිනන්ට් චින්තාපරව මෙසේ විමසනු ඇත.

"මොකද වුණේ?"

"ආහ්! ඒකේ දෙයක් නෑ!" පිරිමි ළමයා වේදනාව මැඩ ගනිමින්, සිනා පා පිළිතුරු දෙනු ඇත. "මං මේ බිංගෙයි ඇවිදින කොට යකඩ බාල්කෙක වැදුනා"

නොබියව ගඟට ගොස් යළි පණපිටින් පැමිණි කීප දෙනා කවුදැයි ලෙෆ්ටිනන්ට් කිසිදා දැන නොගනු ඇත.

වීරයන් වූයේ රෙජිමේන්තු ළමුන් බව න්‍යූරාත් වාල්යාත් හැර කිසිවක්ම දැන නොගනු ඇත. එසේම කෝල්යාගේ 'යකඩ බාල්කයක' වැදී සැදි තඩිස්සිය සැබැවින්ම පසුගිය රෑ යේ ඔහු ලත් වෙඩි උණ්ඩ පහරක තුවාලයක් බවද කිසිවෙක් දැන නොගනු ඇත.

පාවෙල් මින්කෝ

සීයා සහ අල්

නාස්ත්‍යා අත්තම්මා එළදෙනගෙන් කිරි දොවමින් සිටියාය. ඒ අතර ඔවුහු දෙදෙන බාබර් සාප්පුවේ සිට ආපසු ආහ. දූන් දෙදෙනාම එක ලෙසින් කොණ්ඩය කපා තිබේ. එය නළල් කෙහෙ රැළක් සහිත, නාවිකයින්ගේ මෝස්තරයේ කොණ්ඩ කැපීමකි. සීයාට අවුරුදු හැටක් සහ මුණුපුරාට අවුරුදු හයක් වුවද ඔවුන් දෙදෙනාම එකම උසය.

නාස්ත්‍යා ආත්තම්මා කිරි බාල්දියක් බංකුව උඩ තබා, හිස ලාගෙන හුන් සීයාගේ උස් හෙල්මටය ගැලවූවාය. එළදෙනගෙන් කිරි දොවත්දී ඈ නිතරම එය පැළැන්දාය.

"මේ නුඹද අල්?" ඈ සීයාගේ හිස අත ගෑවාය. "මං නුඹට අලුත් කිරි ටිකක් වත් කරලා දෙන්නංකෝ"

"නෑ! මමයි අල්"" මුණුපුරා ප්‍රීතියෙන් සිනාසුනි. "ඒත් සීයාටත් කිරි ටිකක් වක් කරන්නකෝ!"

ඒ බව විශ්වාස නොකළ බවක් පෙන්වූ ආත්තම්මා අල්ගේ හිස අත ගෑවාය. "ඔව්, හැබෑම තමා. ඒ නුඹ නේන්නං. තව පොඩ්ඩෙන් මට නුඹව අඳුනගන්න බැරි වෙනවා, මගේ පුංචි ඉත්තෑ පැටියා" ඈ මුණුපුරාගේ හිස සිඹ ඔහුට කුඩා කෝප්පයකටත්, සීයාට විශාල කෝප්පයකටත් කිරි වත් කළාය. දෙදෙනාම මහත් සතුටින් කිරි බී, උගුරෙන් හඬක් නගා, කට වටා කිරෙන් සැදුණු රැවුළ පිස දැමූහ. වාස්කා බළලා ඔවුන්ගේ දෙපා වල දැවටෙමින් කොන්ද වක ගසා වළිගය ඉස්සීය. ඌටද කිරි ටිකක් ඕනෑ වෙලාය. ආත්තම්මා ඌට පීරිසයකට පොඩ්ඩක් වත් කළාය.

"නුඹට තව ඩිංගක් ඕනෑද?" ඈ ඇසුවාය.

"නෑ මට ඇති. හොඳා අපි දැන් ඉතිං යමු!" අල් කඩිමුඩියෙන් කීය.

"කොහේද ඔය යන්නේ? දැන් රෑ කෑම වෙලාව* නොවැ!" නාස්තයා අත්තම්මා කේන්ති ගනිමින් කීවාය.

"අපි ඇලේ මාළු අල්ලන්න යනවා!" අල් කීවේ වීදුරු බඳුනක් ගෙන එයට අණ්ඩක් වෙනුවට තූලක් ගැට ගසමිනි.

"කරදර වෙන්ඩ එපා, අපිට හොඳටම බඩගිනි වුණාම අපි රෑ කෑම ගන්න එන්නංකෝ" ආර්කිප් සීයා අත්තම්මාට කීය. "කෝ මගේ බූට් සපත්තු? හෝ අර තියෙන්නේ" සමින් කළ අත්මේස් කුට්ටම බඳ පටිය පිටුපසින් ගත් ඔහු ඒවා තම පුළුල්, රළු අත්වලට පළඳා ගත්තේය.

"ඕන් ඉතිං දුවනවා" යි සුසුම් ලෑ ආත්තම්මා පාන් කැබැල්ලක් සීයාගේ කෝට් සාක්කුවට එබුවාය.

සීයා දොර අතරින් මෑත් වූයේ උළුවහු දෑතින් අල්ලා පෙරට බඩගා ඇදී ගනිමිනි.

"සීයේ අපි අශ්ව පැංචවත් ගෙනියනවද?" පෝටිකෝවේ නොඉවසිලිමත්ව හුන් අල් ඇසීය.

අශ්ව පැංචා යනු බෝල බෙයාරින් හතරක් අල්ලා සෑදූ කුඩා කරත්තයකි. සීයා ඒ මත හිඳගෙන අත් බිම තබා එයා පෙරට තල්ලු කරයි. ඔහුට මෝටරයක් ඇති කුඩා රියක් ද තිබේ. එයට සැබෑ රබර් රෝද සහ එළවුම් රෝදයක් ඇත්තේය.

"ඔව් ගෙනියමු" ආර්කිප් සීයා පිළිතුරු දුනි.

ඔහු කූඩය පිටේ බැඳ ගති. අල් ඉතා ඉක්මණින් අශ්ව පැංචා පෝටිකෝවට තල්ලු කොට ගෙනැවිත් ඉස්තිරික්ක වැනි ලී 'සපත්තු' දෙකක් ඒ දෙපසින් තැබීය.

සීයා පෝටිකෝ පඩිපෙළ බැස්සේ අත් දෙකෙනි. කරත්තය මත හිඳගත් ඔහු එක් අතකට එක බැගින් ලී සපත්තු පැළඳ ගත්තේය.

"ඔයා ඕකෙන් කරන්නේ ඇවිදින එකද, නැත්තං පදින එකද?" අල් මේ පැණය නිමක් නැති තරමින් අසන්නකි.

"මං මේ ඉගිල්ලෙනවා" සීයා පිළිතුරු දෙන්නේ බරපතළ ලෙසිනි.

'සපත්තු' යොදා ගනිමින් ඔහු පෙරට තල්ලු වුණි.

වත්තෙන් පිටවන විට සීයා මහත්සියෙන් හුස්ම හෙළමින් හුනි. පාර පහතට බෑවුම් විය. බෝල බෙයාරින් තෙත් පස තුළට කපාගෙන ගොස් උස් තණකොළ වල පටලැවිණි. ආර්කිප් සීයා නතර වී පහත තණබිම දෙස බලා සුසුම් ලෑය. දොළ පහර ඇල්ඩර් පඳුරු තුළට ඇතුළු වෙමින්, පිටවෙමින් වංගු ගැසුණේ මෙම තණ බිමෙහිය.

"මෙතන ඉඳන් පයින් යන එකයි ලේසි" යි තීරණය කළ ඔහු කරත්තයෙන් බැස්සේය. එය තණ ගොල්ලෙහි තැබූ ඔහු 'සපත්තු' ද එහිම තැබීය.

"හා ඉතිං දැන් නුඹේ සපත්තුත් ගලවලා තියාපන්" ඔහු අල්ට කීය.

ළමයාට පෙරැත්ත කිරීමට ඕනෑ වූයේ නැත. ඔහු සපත්තු හා මේස් ගැලවූයේ මොහොතක් ගෙවෙන්නට ද පෙරය. සපත්තු තම බඳ පටියට බැඳගත් සීයා මේස් සාක්කු වලට ඔබා ගති.

"හරි දැන් දුවමු"

අල් එක්කෝ පාර දිගේ ඉදිරියෙන් දිව්වේ, නැත්නම් සීයා වටා කරකැවුණේ උස් තණ අතර පටලැවෙමින් හා සිනා සෙමිනි. බියපත් සමනළයෝ පවන් සලමින් අත්තටු ගැසූහ. උණුසුම මහත් විය. මී මැස්සෝ ගුමු ගුමු ගෑහ. කහ සහ කළු පැහැ මහත බමර මැස්සෝ නිදිමත ඇති කරවන ඒකාකාරී හඬක් නැඟූහ.

"සීයේ ඔයා ඔය කුඩෙත් එක්ක හරියට ඉබ්බෙක් වගේ" අල් හඬ තැලීය.

සීයා උත්තර දුන්නේ නැත. ඔහු විවේකයක් ගන්නට නතර වී, දැත් එල්ලා හැළෙන්නට හැර මහත්සියෙන් හුස්ම ගති. එහෙත් ඔහු වටපිට බැලුවේ පැහැදිලි සිනා පාන ඇස්වලිනි.

"දුවහන් දුවහන්" ඔහු සුසුම් ලෑය.

"තණ කොළ පතුල් කිති කවනවා නේද? එතකොට උඳුපියලිය මල් කකුලේ ඇඟිලි අස්සේ රෑ දෙනවා. මටත් ඕක වෙලා තියෙනවා. එතකොට මලයි ඇඟිලි තුඩුයි, මලයි ඇඟිලි තුඩුයි.... ඒවා ඇඟිලිවල ඇනෙනවා නේද?" සීයාගේ සිනාව දැන් දුක්බරය. "දොළ

ළඟට කිට්ටුවෙන කොට වතුර පතුල් යටින් කාන්දු වෙනවා. උඩින් බැලුවම වේලිලා වගේ, ඒත් කකුල තිබ්බ හැටියේ වතුර කාන්දු වෙලා එනවා. ඒවා හීතලත් එක්ක..."

ආර්කිප් සීයා තව ටික දුරක් දෑත් වලින් ගමන් කොට යළිත් නැවතුනි.

"නුඹ දන්නව නං පිණි උඩ ඇවිදින කොට කොච්චර හිතට සංතෝසයක් දැනෙනවද කියලා. පින්නේ ඇවිද්දොත් කිසිදාක හෙම්බිරිස්සාවක් හෙම නං හැදෙන්නේ නෑ. මං එඬේරෙක් වෙලා උන්නා. මං රැළ පිටිපස්සේ ගියේ සෙරෙප්පු සපත්තු නැතුව පිණි බිංදු බෝංචි ඇට තරං විසාලයි. එතකොට ඒවා හොඳහැටි පිරිසිදුයි. හැම පිණි බිංදුවකින්ම ඉර දිළිසෙනවා. මගේ පතුල් වලට හීතල දැනෙනවා. ඒත් ඩිංගක් දුවන්න ගත්ත ගමන්ම ඒවා පිච්චෙන්න ගන්නවා. එතකොට දවල් කාලෙදි වේලිච්ච ගොරෝසු තණ කොළ මගේ පතුල් දැවිල්ල ඇති කළා. නුඹට මේ වගේ දේවල් දැන ගන්ඩ විදිහක් නෑ! මං ඒදණ්ඩ ගාවට දුවනවා. එතන සමනල්ලු, බත්කූරෝ ඉන්නවා. තිල්පාට ලොකු එවුන්, රතුපාට එවුන් අව්වේ ලැගලා ඉන්නවා. 'බයවෙන්ඩ එපා, අපි හැමෝටම ඕන හැටියේ ඉඩ තියෙනවා!' මං එහෙම කියනවා. ඒත් උන් ඉගිල්ලිලා යන්න යනවා. මං උණුසුම් කොටයක් උඩ ඉඳගෙන කකුල් වතුරට දානවා. ආහ්.... ඒකනං එහැම පිටින්ම දිව්‍ය ලෝක සැපයි. මං කකුල් එල්ලා වැටෙන්න අරිනවා. ඒවා තවත් නං රිදුං දෙන්නේ නෑ. මම නිදි කිරා වැටෙන්ඩත් ගන්නවා. ඉර වතුරත් එක්ක හැංගි මුත්තං සෙල්ලං කරනවා. පුංචි කුඩ මස්සෝ මගේ කකුල ගාවට පීනගෙන ඇවිත් උන්ගේ තොල් වලින් මට කිති කවනවා. මං ඇඟිලි හොළවනවා. එතකොට උන් හරියට වතුර ඉහිනවා වගේ විහිදිලා යනවා. හීතල වතුර මගේ කකුල් වලට සාත්තු කරනවා. දිව්‍ය ලෝකෙ සනීපයි!"

අන්තිමේදී ඔවුහු දොළ පාරට ළඟා වූහ. දිය පාර ඇස් වටය තරමට ගැඹුරු විය. වැඩිම වුවහොත් දණක් ගැඹුරැති විය. ළංවී බැලුව හොත් කුඩා මාළු සහ හැම වර්ගයකම කුඩා කෘමීන් දැකිය හැකිය. බොහෝ ගණනක් වූ ජලජ පැලෑටි ද විය. පන්ගස් දියෙන් පිටට නෙරා තිබුණේ වක් අසිපත් මෙනි!

"හෝ.. ඕං අපි තැනට ආවා" සීයා කීවේ කුඩය ලෙහමිනි. "ඉතිං එහෙනං වතුරේ ගිලිලා වරෙන්කෝ. මං ඉවුර දිගේ ඇවිදගෙන නුඹේ මාළු උස්සන් එන්නං" ඔහු අල් ගේ අත් වලින් වීදුරු බඳුන ගෙන දිය කිට්ටුවට දණ ගාමින් ගොස් එයට වතුර ටිකක් පිරවීය.

මුලදී අල් දියට බැසීමට අදි මදි කළ නමුදු සීයා ඔහු පෙළැඹවීය.

"වතුරට බැහැලා කකුලේ වතුර ගාගෙන බලාපන්. බය වෙන්ඩ එපා. මුලදී හීතල වගේ දැනේවි. ඊට පස්සේ නුඹ ගොඩට එන එකක්වත් නෑ. නුඹ වතුර ජබු ගහගෙන ජබු ගහගෙන යාවි. පතුලේ තිරිවාන කැට කකුලට දැනෙනවද? බොරළු තදයි, පොඩි වෙනවත් එක්ක. සමහර වෙලාවට රොන්මඩ මුණ ගැහෙනවා. ඒවා ගොහොරුවක්. කකුල ඇතුළට එරෙනවා. සැරයක් මට දැනුනා මොකෙක්දෝ මගේ කකුලේ ඇඟිලි යටින් ඇදෙනවා. මං ඌව අතින් ඇදලා ගත්තා. කාප් මාළුවෙක්! මේන් මෙච්චර විතර!" සීයා ඔහුගේ අත්ල පෙන්වීය. "නැත්තං සමහර වෙලාවට මඩ සෙවල කකුලේ ඇලෙනවා. ඒවා ගොහොරු. ඒ වගේම ලිස්සනවා. කකුල තියද්දී පරිස්සං වෙයන්. ගස් උල් තියෙන්ඩ පුළුවනි. කුඩෙ පරිස්සමට වතුරට පාත් කරාපන්, ඉවුර පැත්තට ඇල කරලා. දැන් කකුලෙන් වතුර කලත්තලා මාළු ඒකට එළවලා ඉක්මණට උස්සාපන්!

"මං ඇල්ලුවා!" දන්නා තරම් උපරිමයෙන් හඬ තැලූ අල් ඉවුරට දිව්වේය.

ලිස්සනසුළු හා ඉක්මණින් එහා මෙහා පනින දණ්ඩීන් මහළු මිනිසාත්, කුඩා පිරිමි ළමයාත් ඩැහැ ගත්හ. ඔවුහු දෙදෙනාම කෑ මොර දෙමින් සිනාසුනහ. දෙදෙනාම සිටියේ මහත් ප්‍රීතියෙනි.

ඔවුහු ආපසු ගෙදර යන්නට හැරුණේ හිරු අවරෙහි වූ විට පමණෙකි. එහෙත් හිරු තවමත් ඔවුන්ගේ නාවුක මෝස්තරයට කැපූ කොණ්ඩ උණුසුම් කළේය. අල් සිටියේ පාත් කැබැල්ලක් සපමිනි. එය සීයා සොයා ගත්තේ ඔහුගේ සාක්කුවේ තිබී මුළුමනින්ම අහම්බෙනි.

"ඉක්මන් වෙන්ට එපා. ඕක හුඟාක් වෙලා හපා හපා

කටේ තියාගෙන ඉඳින්කෝ. පාන් පැණිරස වෙන බවක් දැනෙන්නේ නැද්ද? හරියට සීනි දාලා වගේ!" සීයා කීය.

"හෝ!" අල් කඩිමුඩියේ සැපීය. "මං කවදාවත් හිතුවේ නෑ පාන් ඔච්චර රස වෙන්ඩ පුළුවන් විත්තිය. මේ නිකම්ම රයි පාන්!"

අල් තමා අල්ලාගත් මාළු වීදුරු බඳුනෙහි රැගෙන ගියේය. එහි දණ්ඩීන් දුසිම් කීපයකි. ගමන් ගන්නා අතරතුර ඔහු සිතින් මවා ගත්තේ තණ බිමේ සිට ගව රංචුව ආපසු පැමිණෙන විට තමාත් ආත්තම්මාත් එළදෙන මුණ ගැසෙන සැටි ගැනය, එසේම හෙල්මට් ටැංකිය ගනු පිණිස තමා ගෙතුළට දිව යන අයුරු ගැනය. මඩුවට යන අතරේදී ඔහු මීට පෙර එහි වතුර දමා බලා තිබිණි. එය තරමක් ලොකුය. සීයාගේ හිසේ තරම්ය. ඔහු එය පළඳාගෙන සටන් කොට තිබිණි. එහෙත් එය අත්තම්මාටද හරියටම ගැලපෙයි. ඈ එය පළඳින විට සැබෑම යුද්ධ ටැංකි භටයෙකුගේ පෙනුමය. එසේම එවිට එළදෙන වලිගයෙන් හිසට ගැසීම ගැන බයක් නැත.

තණ අතර තිබී සීයා තම කරත්තය සොයා ගති.

"නුඹට සපත්තු දාගන්ඩ ඕනැද?" ඔහු මුණුපුරාගෙන් ඇසීය.

"නෑ මං අමාරුකං ඉවසාගෙන පුරුදු වෙන්නයි යන්නේ!" අල් පිළිතුරු දුනි.

සීයා තමාගේ දෙපා වලින් ඉතිරි වී ඇති කොටස් වල උදව්වෙන් කරත්තයේ හිඳ ගති. කරත්තයේ නැගී කන්ද උඩට නැගීම වඩාත් අසීරු විය. තෙල් දමා තිබුණත් බෝල බෙයාරින් කිරි කිරි ගෑවේය.

මාළු ටිකකින් සංග්‍රහ කරනු ඇතැයි බලාපොරොත්තුවෙන් පළමුවෙන්ම ගේට්ටුව තුළින් දිව ආවේ වාස්කා බළලාය. නාස්ත්‍යා ආත්තම්මා ඔවුන් වෙත සිනා පාමින් පෝටිකෝවේ සිටගෙන උන්නාය. ඈ සිටියේ චේලෙන්නට වැලේ වනා තිබූ රෙදි ආපසු ගනිමිනි. සීයාගේ යුද කබාය ඈ අතට ගත්තේ ඉතා පරිස්සමිනි. එහි වූ පදක්කම් මහත් බරක් ඇති කළේය. ඒවායේ සිලි සිලිය අල්ට ඇසිනි. එසේම ඔහුට හිරු එළිය එතුළින් පරාවර්තනය වෙනු පෙනුනි.

විතාලි වොල්ස්කි

විපතේදී මිතුරෙක්....

හිරු අවරදිගින් බැස යමින් තිබිණි. ඉතිං මා තීරණය කළේ වන උද්‍යානයෙන් ආපසු ගෙදර යන්නටය.

ඉක්මණින් කැලය අවසන් කිරීමේ බලාපොරොත්තුවෙන් මා ගමන් ගත්තේ වට වංගු මං මඟ හැර මා නිවැරදි යැයි සිතූ දිශාව ගනිමිනි. පැයක් ගෙවිණි. එහෙත් කැලෑව අවසන් නොවිණි. මුලදී මා සිතුවේ මා පසු කරමින් සිටියේ උදයේ මා ගමන් ගත් කොටස අතරින්ම බවය. එහෙත් ඉන්පසු මා තේරුම් ගත්තේ මා සිටින්නේ කැලයේ වැරදි කොටසේ බවය. ගස් එතරම් උස් නොවිණි. එසේම යටින් වැඩුණු මීමන මිත් පෙර මා දැක තිබුණේ නැත.

"මම පාර වරද්දාගත්තා වත්ද?" මම දොම්නස්ව කල්පනා කළෙමි.

විඩාවෙන් මගේ දෙපා රිදෙන්නට විය. මම නැවතුනෙමි. අහසට නෙතු යොමා ගත් මම පැතිරුණු උස් ඕක් ගසක් යට දිගා වූයෙමි. සෙවනැලි දිගු වන්නට විය.

කොට්ටෝරුවෝ මුළු වටපිටාව පුරාම ගස්වලට කෙටූහ. කොළ පැහැ අතු පතරෙහි කෙළින්ම මට ඉහළින් කහ කුරුල්ලෙක් මෘදු ලෙස සිවුරුහම් නැඟීය.

එක්වනම මට තියුණු පහත් ගෙරවුම් හඬක් ඉතාමත් අසළකින්ම ඇසුනි. යළිත් එය ඇසුනි.

මම වහා දෙපයින් නැගුනෙමි. එය වළසෙකුගේ හඬක් මෙනි. එම පහත් ගෙරවිලි හඬ පැහැදිළිවම වළසෙකුගේමය. එහෙත් මා දන්නා සැටියට මේ අසළක කිසිදු වළසෙක්

නැත. එසේ නම් ඒ හඬ කුමක්ද?

මම හඬ එන දෙසට ගමන් ගතිමි. එවිට මම මා ඉදිරියෙන් වූ එළිමහනක් දුටුවෙමි.

"හෝ දැන්නං මගේ එහේ මෙහේ ඇවිදිල්ල ඉවර වෙන්ඩයි යන්නේ" මම සිතුවෙමි.

මා වේගවත්ව ගමන් කළෙමි. මා ඉදිරිපිට වූයේ සැඳෑ හිරු එළියෙන් මෘදු ලෙස ආලෝකිත කැලෑ එළිමහනකි. මුළු එළිමහන පුරාම මල්බෙරි පඳුරු සංකට වැවිලාය. කුඩා පඳුරු මත හරිත පැහැ පත් වලට වඩා වැඩියෙන් ඉදුණු බෙරි ගෙඩි පිරී තිබුණා සේය.

ආගන්තුක පෙනුමින් යුතු දිගු හා නො උස් අටල්ලක් එළිමහන අනෙක් පස නොපැහැදිළිව පෙනෙන්නට විය. මම වඩාත් ළං වීමි. මගේ ශ්‍රවණය මා නොරැවටූ බව මම දුටුවෙමි.

එය පණ පිටින් හුන් වළසුන් සහිත කුඩුවකි. කුඩුව දිගු කොටස් හතරකට බෙදා දොර වලින් සම්බන්ධ කොට තිබිණි.

කොටස් තුනක වළසා බැගින් විය. හතරවැන්න හිස්ය.

කුඩුවල සිට මීටර් පණහක් පමණ ඈතින් උස් දේවදාර ගස් අතරෙහි කුඩා ගෙයක් විය.

ගෙයින් පිටතට ආ මිනිසෙක් මා වෙත ආවේය.

ඔහු මට්සුටාය, කැලෑ පල්ලාය. වළසුන් මුර කළේ ඔහුය. මා ඒ දිනවල නතරවී සිටි බෙලොවෙෂා හි දඩයක්කරුවන්ගේ නවාතැන් පොළට යන්නට තවත් කිලෝමීටර් තුනක් දුර බව කී ඔහු මා ගෙතුළට කැඳැවීය.

අපි කතා බහට වැටුණෙමු.

* * *

කැලෑ පල්ලා වූ මට්සුටා වළසුන් සමඟ තනිව ජීවත් වූයේය. ඔහු මේ ලොමින් පිරි මෘගයිනට කවා පොවා බලා කියා ගත්තේය.

"ඔහේට මෙහේ තනි නැද්ද?" මම ඇසුවෙමි.

"මට තනි වෙන්ඩ වෙලාවක් නෑ" මට්සුටා පිළිතුරු දුනි. ඉන්පසු ඔහු මට වළසුන්ගේ කතාව කිවේය.

"අවුරුදු දෙසීයක කාලෙ ඉඳලා බෙලොවෙෂ්කය පුෂ්චා කැලෑවේ නිදහසේ ඇවිදින වළස්සු නෑ. උන් මේ කොටසේ වඳවෙන්න ඇවිත්. ඉතිං ඒ හින්දා මුංව බෝ කරන්නයි ගෙනැත් තියෙන්නේ"

වළස්සු සාමකාමී හා මහත්මා ගති ඇත්තෝ වූහ. උහු බෙලොවෙෂ්කය පුස්චා වලට පැමිණෙන්ට පෙර දිගු කලක් ජීවත්ව තිබුණේ සත්වෝද්‍යාන වලය. ඉන් එකෙක් සර්කස් කණ්ඩායමක් සමඟ ගමන් කොට පවා තිබිණි. උන් මුළුමණින්ම හීලෑ උන් වූ අතර මට්සුටා නිදහසේ උන්ගේ කූඩු තුළට ගමන් කරන්නට හුරු වුණි.

එක් තරුණ වැළහින්නක පමණක් අසමාන නොරිස්සුමක් පෙන්වූවාය. වනයේ පුසුඹ ඇ නොසන්සුන් කොට නිදහස් කැලෑ මුතුන් මිත්තන්ගෙන් උරුම වූ සහජාශයන් ඇවිස්සීය.

දවස් ගණන් තිස්සේ ඈ සිටගෙන, හොම්බ යකඩ කඳන් අතරින් පෙරට තල්ලු කොට වනයේ පිරිසිදු, නැවුම් වාතය ගිල්ලාය. එහෙත් ඈ පවා වන පල්ලා අතින් කෑම ගන්නට හුරු වූ අතර ඔහුට කූඩුවට ඇතුළු වන්නට ද, තම කණ පිටුපස කසන්නට ද ඉඩ දුන්නාය.

එහෙත් එක් උදෑසනක වන පල්ලා කූඩුවට ළඟා වූ විට දුටුවේ කූඩුව හිස්ව ඇති බවය. රැය තිස්සේ වැළහින්න කූඩුවේ ලී පොළොව ලෑටි ගා මඟක් හාරාගෙන කැලෑ වැදී තිබුණාය. ඒ 1940 ජූනි මස මුළදීය.

මෙසේ ඈ නිදහස් සත්ව, මෘග ජීවිතය ඇරඹූවාය.

මේ අතරෙහි හිරු බොහෝ සේ බැසගොස් තිබිණි. වාතය සිහිල් විය. අඳුර වැටෙන්නට විය. මම නැගිට මට්සුටාගෙන් සමුගතිමි.

වන පල්ලා මා සමඟ මඟට පැමිණ බෙලොවෙෂා වෙත මඟ පෙන්වීය.

මා අන්තිමේදී නවාතැනට පැමිණෙන විට හොඳහැටි කළුවර වී තිබිණි.

* * *

ගෙදර පැමිණියාට පසුව මා කල්පනා කළේ වැළහින්න ගැනය. මගේ වන පාලක මිතුරන්ගෙනුත්, ප්‍රාදේශික මිනිසුන්ගෙනුත් මම ඈ ගැන ඇසුවෙමි.

ඈ නිතරම මෙන් වනයේ වෙනස් වෙනස් තැන්වලදී දකින්නට ලැබී තිබිණි. ඇයට වනයෙහි ජීවිතය පහසු හා නිස්කලංක එකක් විය. වළසෙකුට උවමනා තරම් ආහාර පුස්වා හි විය. බිල්බෙරි සහ කැලෑ ස්ට්‍රෝබෙරි හරිත පැහැ තණකොළ යාය වර්ණවත් පළසකට පෙරළීය. එසේම මිනිසෙකුට වඩා උස් වූ රාස්ප්බෙරි වැවිණි. බිම්මල් හැම තැනම පිපිණි. වැළහින්න මිහිරි මුල් පොළොව හාරා සොයා ගත්තාය. එසේම යුෂයෙන් පිරි පැලෑටි එළිමහන්වල විය.

කුඹි ගුලක් සොයා ගත් විට ඈ එය සාරා පෙර පය ඇතුළට දමා කැළැඹුණු කුඹි ලෙවකන්නීය.

දිරා ගිය පරණ ගස් කඳන් අනෙක් අතට පෙරළන ඈ නිතරම මහත පිළවුන්, පණුවන් හා ගොළුබෙල්ලන් බොහෝ ගණනක් තෙත් පසින් සොයා ගන්නීය.

තම දිගු, තියුණු නියවලින් පැරණි ගස්වල පොතු සූරාලන ඇයට ඒ තුළින්ද කෑමට යමක් සොයා ගත හැකිය. සමහරවිටෙක අත්දැකීම් රහිත වළිකුකුළු පැටවුන්ද වැළහින්නගේ පහසු ගොදුරු වෙති.

සරත් සමයේ සීතල හුස්ම වනය කහ සහ රතු පැහැයෙන් වර්ණ ගන්වන විට වැළහින්න ඕක් ඇටත් වෙනත් ඇට වර්ගත් සොයන්නට ගන්නීය.

ගිම්හානයේදීත්, සරත් සමයේදීත් ඈ ඉතා හොඳින් පෝෂණය වන්නීය. වැළහින්න ඉතා හොඳින් දිළිසෙන ලොමින් පිරී ගන්නේ සිසිරය සඳහා සූදානම් වෙමිනි.

සිසිරය පැළපදියම් වූ විට ඇය ලැහැබක ගසක් ඉදිරුණු තැනෙක සැඟවුම් බිළයක් හාරා ගන්නීය. එය ඈ තෝරා ගන්නේ වසන්ත ජල ධාරාවන්ට අසු නොවන උස්

තැනෙකය. ලැහැබ හැම අතින්ම වටවී තිබෙන්නේ සරුවට විලෝ ගස් වැවුණු වගුරකිනි. මෙහි ඇයට සැම සතුරෙකුගෙන්ම මුළුමනින්ම ආරක්ෂිත හැඟීමක් දැනෙයි. ඇය සීතල සුළං වලින් හා වසන්ත ජල ධාරාවලින් සුරැකෙයි. ඈ කොළද, තණ පත්ද, පෙඳ පාසිද බිළයට ගෙන එන්නීය.

දෙසැම්බරය මුළදී ඌ තම බිළයෙහි සිසිරය සඳහා සූදානම් වූවාය. ඉතා ඉක්මණින්ම බිළය හිමෙන් වැසී ගියේය. සුළං සහ හිම කුණාටු ඒ මතින් බිරුසත් දුනි. ගල් ගැසෙන සීතලෙන් ගස් ඉරි තැලීය. එහෙත් වැළහින්නට ඒ කිසිවක් නොදැනිනා. ඉදිරුණු ගසට එහායින් වූ හිලකින් ඉහළට නැගුණු වාෂ්පය පමණක් හිමට යටින් ජීවමාන සත්වයෙක් නිදන බව පෙන්වීය.

* * *

1941 ජනවාරියේදී, සිසිර තරණ කාලයේදී වැළහින්න පැටවුන් දෙදෙනෙකු වැදූවාය. උහු මවට තුරුළුව, අඳව හා අසරණව මවගෙන් කිරි උරමින් මාස තුනක් තිස්සේ බිළයට වී උන්හ. උන් ඇස් ඇරියේ සති හතරක් වයස් වූ විටය.

මාර්තුව අන්තිමේදී, හිරු උණුසුම් වන්නට වී හිම දියවුණු විට වැළහින්න බිළයෙන් පිටවූවාය. කෙට්ටු වී, ලොම් තීරු තීරු එල්ලා හැළෙමින් කුස ගින්නේ හුන් ඈ කැලෑව පුරා තමන්ටත්, වැඩෙන පැටවුන්ටත් කෑම සොයමින් සරන්නට වූවාය. පැටවුන් උපදින විට උන් මීයන්ට වඩා ලොකු වූයේ නැත. එහෙත් දැන් උහු කුඩා බල්ලෙකුගේ තරමට වැඩී හුන් අතර හැම විටම කෑම ඉල්ලූහ. වැළහින්න මුළු සීත කාලය පුරාම කිසිවක් කා තිබුණේ නැත.

ටික කලෙකට පසු, පරිසරය වඩාත් උණුසුම් වූ විට , පැටවුන්ද බිළයෙන් පිටතට එන්නට වූහ. එහෙත් උන්ගේ මව උන්ට ගෙදරින් වැඩි ඈතකට යන්නට නොදුන්නාය.

1941 මැයි මුළදී වන පාලක මට්සුටාට අහම්බෙන් වැළහින්න මුණ ගැසුනි.

ඔහු පහත් වගුරු බිම හරහා ඇවිද එමින් හුනි. ඔහු එහි පැමිණෙන්නේ කලාතුරෙකිනි. එය පැහැදිළි වූත්, හොඳින් හිරු පායා තිබුණා වූත් දිනෙයකි.

සරුවට වැවුණු විලෝ ගස් ගොන්නක් සහිත කුඩා කැලෑමය වගුරක වූ වැලි කන්දක් අතර වැළහින්න සිටිනු ඔහු දුටුවේය.

ඈ සිටියේ පැත්ත වැටී, ඉදිරි පා විහිදාගෙන අව්ව තපිමිනි.

"හෝ... මේ අපේ වැළහින්න නොවෑ!" යි සිතූ වන පාලක වඩාත් ළං වීය.

වැළහින්න සිටියේ තනිවම නොවේ. කුඩා පැටවෙක් ඒ අසළම වැල්ලෙහි සෙල්ලම් කළේය.

පැටියා තට්ටමෙන් නැගී සිට මවගේ පිටට අසීරුවෙන් බඩගා පිනුම් ගසමින් වැල්ලෙහි සෙල්ලම් කළේය.

අනෙක් පැටවෙක් මවට පියවර දුසිමක් පමණ ඈතින් ගසකට නගින්නට යත්න දැරීය. ඌ තිය පහුරු වලින් ගස් කඳ බදාගෙන පපුව තදින් ඊට තදකොට ගනිමින් උඩට නගින්නට අසීරුවෙන් උත්සාහ කළේ උස් හා වේදනාවට පත් හඬින් ගොරවමිනි.

පැහැදිළි ලෙසම පෙනුනේ මව් වැළහින්න හොඳ මනෝභාවයකින් හුන් බවය. අව්ව තපිමින් හුන් ඈ නිරන්තරව ඈනුම් හරිමින් දෑස් ඉහළට කරකැවූවාය.

කුඩා පැටවුන්ගෙන් එකෙක් මවට තුරුළුව දිගාවිය.

අනෙකා ගසට නැග ගැනීමේ ප්‍රයත්නය අත්හළේ නැත.

මට්සුටා එතැනම සිට ප්‍රීතිමත් පවුල දෙස බලා හුනි.

එක්වරම වැළහින්නට අනතුර ඉව වැටුණි. හිස එසැවූ ඈ සුළං අතට ඉව ඇල්ලුවාය. ඉක්බිති ඈ නැගිට මට්සුටා දෙසට පියවර කීපයක් තැබුවාය. නිසැකවම වැළහින්නට මිනිසෙකුගේ ඉව වැටී තිබිණි.

මට්සුටා නිහඬව හුනි.

ඔහුගේ දෑස් වැළහින්නගේ කුඩා දෑසට මුණ ගැසුනි.

වැළහින්න නැවතුනි.

මිනිත්තු කීපයක් ඈ නිහඬව සිටගෙන හිස ඔසොවා මට්සුටා දෙස අපේක්ෂාවෙන් යුතුව දෑස් හයා බලා හුනි. ඉක්බිති, අනතුරක් නැති බව හඟිමින් ආපසු හැරුණු ඈ පැටවුන් සමඟ සෙමෙන් වගුරු බිමේ අනෙක් පසට ගමන් කළාය.

මිනිත්තුවකට පසු ඔවුහු සණ විලෝ වදුල තුළ නොපෙනී ගියහ.

"ඒකි මාව අඳුනා ගත්තා වෙන්ඩ ඕනෑ. පැටව් එක්ක ඉඳලාත් ඒකි බය වුණේ නෑ" මට්සුටා තනිවම සිතීය.

* * *

අවුරුදු පහක් ගෙවිණි.

1945 වනතුරු මම වන පාලක මට්සුටා නොදුටුවෙමි.

වැළහින්න සමඟ තමාගේ අවසන් මුණ ගැස්ම පිළිබඳව වූ සිත් ගන්නා කතාව ඔහු මට කීවේය.

නාසීන් විසින් බෙලොරුසියාව අල්ලාගෙන සිටි සමයේදී මට්සුටා පාටිසාන් ඒකකයක මඟ පෙන්වන්නෙකු සහ ඔත්තු කරුවෙකු සේ සේවය කළේය.

වරෙක බෙලොවෙෂ්කය පුෂ්චා වලට බටහිරට වන්නට දුර ඈතින් වූ ගමක් කරා ගමන් ගනිද්දී ඔහුව නාසීන් විසින් වටලනු ලැබ වම් උරහිස තුවාල විය.

සතුරාගෙන් බේරී පැනගත් මට්සුටා වනාන්තරයට දිව ගොස් හිමෙන් වැසුණු වදුල තුළ නොපෙනී ගියේය.

භූමි භාගය නොපුරුදු හෙයින් කැලය ඇතුළට වදින්නට නාසීහු බිය වූහ. මැෂින් තුවක්කුවෙන් වෙඩි තැබූ ඔවුහු ආපසු හැරී ගියෝය.

එය පෙබරවාරියේ දිනෙක අවසන් යාමයය. අඩ ඇඳිරිය තුළින් මඟ සොයා යාම මට්සුටාට අසීරු දෙයක් විය.

වනයේ වූ සියල්ල සංසුන් හා නිහඬ විය. හිම කුණාටු

මුළු සතියක් තිස්සේම වියරුවෙන් නැගී සිට තිබූ අතර සියල්ල වැසී තිබුණේ ගැඹුරු හිම වලිනි.

සෑම පියවරක් පාසාම මට්සුටා ඉණක් ගැඹුරට හිම ගොඩවල එරිණි. ඔහු ඉතා ඉක්මණින් විඩාවට පත්විණි. තුවාල ලත් උරය වේදනා දුන් අතර හිස කරකැවිණි.

ඔහුගේ පරණ, වියැකුණු කබාය සීතලට එදිරිව පිරිනැමූයේ ඉතා මඳ ආරක්ෂාවෙකි. මට්සුටා ඉතා ඉක්මණින්ම සීතලෙන් ගල් ගැසිනි. ඔහුට දැනුනේ තමාගේ ශක්තිය පිරිහී යන බවකි.

ඔහුට තව දුරටත් පෙරට යාගත නොහැකි විය. ඔහුගේ ශක්තියේ අවසන් පොද ද යන්නට ගොසිනි. ඉදිරුණු ගසක් අසළ උසට ගොඩ ගැසුණු හිම ගොඩකට ඔහු ඇද වැටුණි. එක්වනම ඔහුට දැනුනේ හිමේ එරී යන බවකි. ඔහු අඳුරු අගාධයකට ඇද වැටෙමින් හුනි. ඔහුගේ සිහිය විසඥ විය.

මට්සුටා මුළුමනින් අන්ධකාරයට පැමිණුනි. ඔහුට දැකගත හැකි වූ කිසිවක් නොවිණි. එහෙත් ඔහුට උණුසුම දැනිනි. ඔහු පොළොව යට දිග ඇදී සිටියේ වියළි තණ හා කොළ මතය.

වාතය දුගඳින් පිරීගෙනය. සතෙකුගේ තියුණු ගඳ ඔහුගේ නැහැයට වැදිනි. අන්ධකාරයේ නහයෙන් පිඹීම්ද, සුසුම් ලෑම්ද, කිසියම් ලෙසක තලු ගැසීමේ හා ගෙරවීමේ හඬ ද ඔහුට අසත හැකි විය.

"මං මේ මොන ඇන්නෑවක ද ඉන්නේ?" මට්සුටා විමතියෙන් සිතීය.

එක්වනම ඔහුගේ සිත අතරින් විදුලියක් කෙටීය."බිළයක්! මං මේ වළහෙක්ගෙ බිළේකට වැටිලා වෙන්ඩ ඕනෑ!"

විනාඩි කීපයක් ඔහු දෑස් විවර කොට ගෙන අන්ධකාරය දෙස බලා දිගාවීගෙන හුනි. ඉන්පසු ඔහු වටපිටාව අතපත ගා බලන්නට ගති.

පහත් මැටි සිවිලිමක් ඔහුට ඉහළින් විය. පැරණි ගසක සණ සහ පැටළුණු මුල් ඔහුගේ අතට දැනුනි.

ඔහු ඉදිරිපිට, තලුමරන හා ගොරවන හඬ ඇසුණු දෙසින් කිසියම් උණුසුම්, ජීවීමය හා ගොරෝසු කෙසින් යුතු යමක් කැළඹී සුසුම් ලෑය.

"ඒ මගේ වැළහින්න වෙන්ඩ ඕනෑ" යි සිතූ මට්සුටා වළසාගේ ලොමින් පිරි හිස පිරිමැදීය.

වන පාලකයා වළසාගේ හිසට තට්ටු කොට කණ පිටුපස කැසීය.

තලුමැරීම සැනෙකින් නතර විය. වළසා හිස ඔසොවා ඉව අල්ලා වන පාලක සිඹ බැලීය. ඊළඟ මොහොතේ ඔහුට දැනුනේ වැලි කඩදාසියක් වන් දිව ඔහුගේ ගෙල ලෙවකන බවය. ඉන්පසු ඈ තම පෙර පිහිටුමේ යළිත් දිගාවී ගත්තාය. බිළයේ ස්වාමිදුව ඇගේ පෙර ආරක්ෂකයා හඳුනාගෙන තිබිණි.

වළස් හැසිරීම් පිළිබඳ අපූරු දැනුමත්, වළසුන් සමඟ වනයෙහි අවුරුදු දෙකක් ජීවත්වීමේ අත්දැකීමත් මට්සුටාට මේ අවදානම් මොහොතෙහි නිවැරදිව හැසිරීමට හැකියාව ඇති කළේය. ඔහු ඉතා නිසලව වැතිර හුනි. වැළහින්න හේතුවකින් තොරව තමාට හානියක් නොකරන බව ඔහු තේරුම් ගති. ඔහු තම බිළයට ඇද වැටුණු මොහොතේ ඈ ඔහුට අත තැබුවේ නැත. දැන් වැළහින්න තමාගේ පැරණි ආරක්ෂකයා පිළිගෙන තිබූ නිසා ඔහුට බිය වන්නට කිසිවක් නොවීය. ඔහු සංසුන් විය. ඔහුගේ දෑස් කෙමෙන් පියැවිණි. වැළහින්නගේ පුළුල්, උණුසුම් ඇලපත මත හිස තබා ගනිමින් ඔහු නින්දට වැටුණි.

එම උණුසුම් බිළය තුළ තමා කොතරම් වේලා නින්දේ හුනි දැයි මට්සුටාට කිසිදු අදහසක් නැත. ඔහු අවදිවන විට පෙර සේම ඇඳිරිය රජයීය. තම ශක්තිය යළි පැමිණ ඇති බවක් ඔහුට හැඟුනෙන් ඔහු බිත්ති හා සිවිලිම සෙමෙන් අතගා බැලුවේ එළියට යාගත හැකි මඟක් වේදැයි සොයා ගන්නටය.

එක්වරම නැවුම් වායු දහරාවක් ඔහුගේ මුහුණට වැදිනි. අළු පැහැති ඇඳිරි ආලෝකයක් බිළයට කඩා වැටුණි. පැටළුණු මුල් අතරෙහි පය සිර කළ මට්සුටා පොළොව මතුපිටට ඇදී බිළයෙන් අඩක් ඉහළට නැඟී ගති.

සියල්ලක්ම නිසලය. සීතල අඩුවී ගොසිනි. අළුපැහැ උදෑසන අහසින් සැහැල්ලු හිම පතනයක් පැමිණුනි.

මට්සුටා මිනිත්තු කීපයක් වටපිටාව බැලීය. ඔහුගේ පෙනහළු ප්‍රබෝධය ගෙන එන සීතල සුළං ඇදගති. ඔහු

සැනසුමෙන් යුතුව සුසුම් හෙළීය.

"ස්තුතියි කෙල්ලේ!" යි මිමිණූ වන පාලකයා තමාට එතරම් උණුසුම් පිළිගැනීමක් දී තිබූ ගැඹුරු හා ඇඳිරි බිළයෙන් පිටතට බඩ ගෑවේය.

සැන්දෑව වන විට ඔහු තම ඒකකයේ විය.

අලෙක්නා වසිලෙවිච්

පත් ඉරුවා

පත් ඉරුවා යනු තරුණ, ගුරු පැහැ අසෙකුගේ නමකි. මෙය ඌට ලැබුණේ උගේ නළලේ හරියටම පත් ඉරුවක් වන් සුදු හතරැස් පුල්ලියක් තිබීම නිසාය. මා මේ කෙටි කතන්දරයෙන් ඔබට කියන්නට යන්නේ ඌ පාටිසාන් වරුන්ට සම්බන්ධ වූයේ කෙසේද කියාය.

යුද්දයේ මුල්ම මාසවලදී අත් බෝම්බයක් පිපිරීමෙන් විසි වූ පතුරකින් පත් ඉරුවාගේ කකුල තුවාල විය. උගේ තුවාලය බරපතළ වූ නමුදු තරුණ අශ්වාරෝහකයෙකු වූ උගේ ස්වාමියා ඌට වෙඩි තබා දමන්නට කැමැති වූයේ නැත. ඔහු කළේ යුද්දය පැවති ගමේ මහළු ගොවියකුට ඌ රැක බලා ගැනීමට දීමය.

"මට බෑ ඌම වෙඩි තියන්න. ඌ මිනිහෙක් වගේමයි. හැම වචනයක්ම ඌට තේරෙනවා" සෙබළා ගොවියාට දුක්බරව කීවේ පත් ඉරුවාගේ පහතට නැමුණු හිසට තට්ටු කරමිනි. "සීයේ මේකාව හොඳින් බලාගන්න. මේකා ගොඩ එන්න පුළුවනි. එතකොට මේකා ඔහේට ප්‍රයෝජනවත් වේවි"

ස්වාමියාට සවන් දුන් පත් ඉරුවා තම සේදමය හිස ඔහුගේ අතෙහි මුදු ලෙස ඇතිල්ලීය. උගේ බුද්ධිමත් දෑස් පලකළේ නිමක් නැති ශෝකයය.

"පණපිටින් සනීපෙන් හිටහන් කොල්ලෝ! අශ්වයා ගැන කරදර වෙන්ඩ එපා. මං ඒකාව රැක බලාගන්නං" ගොවියා අශ්වාරෝහකයාට සහතික විය.

"ස්තුතියි සීයේ" තදින් අතට අත දුන් සෙබළා තම

කණ්ඩායම අල්ලා ගන්නට පිටත් විය.

ඉතිං පත් ඉරුවාට අලුත් ස්වාමියෙක් ලැබිණි. එසේම ඇත්ත වශයෙන්ම ඌ වාසනාවන්ත විය. මහල්ලා කාරුණික හා අනුන් ගැන සැළකිලිමත් අයෙකු විය. පත් ඉරුවා රැකබලා ගත් ඔහු තමාට හැකි උපරිමයෙන් උගේ තුවාලයට සාත්තු කළේය. තුවාලය ඉතා ඉක්මණින් සුවපත් විය. එකම දේ වූයේ පිටුපස දකුණු කකුල මඳක් අද්දමින් ඇවිදීම පමණකි. සරත් සමය වන විට එය ද නැතිව ගියේය.

පත් ඉරුවාගේ ස්වාමියාගේ නිවෙසේ ජනේලයට පාටිසාන්වරු පැමිණ තට්ටු කළේ එක් වැසිබර සරත් රැයකදීය. ඔවුන්ගෙන් අයෙකු හට එහායින් වූ ගමට හැකි ඉක්මණින් යාගත යුතු විය. ඉතිං මහළු මිනිසා පත් ඉරුවා මඩුවෙන් ඉවතට දක්කීය. අසු කන් විනිවිද යන ලෙසින් හේෂාරවය කොට කුරයෙන් පොළොව පහුරු ගෑවේය. එහෙත් තෝන් පට තද අතෙකින් දරාගෙන සිටින බව හඟිමින් ඌ කීකරු ලෙස මිදුලෙන් පිටතට පාටිසාන් භටයා පසුපස ගමන් ගති.

පත් ඉරුවා පාටිසාන් වරුනට එකතු වූයේ එලෙසිනි. අසු ඉතා විශ්මය එළවනසුළු ලෙසින් බුද්ධිමත් වූ නමුදු ඉක්මණින් කිපිණි. ඌ අසරුවාට අකමැති නම් ඔහුව පිට උඩ ගෙන නොයයි, කෝප සහගතව හේෂාරවය කරමින් කටකලියාව සපයි, පසුපසින් නැගී සිට එක තැන කරකැවෙයි. නැතිනම් ගඟ තරණය කරන විට ඌ එක්වරම දියෙහි ලැග ගනී.

වඩාත් තදින් කිපෙන අයගෙන් කීප දෙනෙක් පත් ඉරුවාට නොකැමැති වූ අතර ඔවුන්ගෙන් ඌ ලැබුවේ පා පහරවල්ය. එහෙත් ඌ අවනත වීම ප්‍රතික්ෂේප කරයි. නහයෙන් පිඹින ඌ කුර පොළොවට අනී.

එහෙත් කිසියම් පුද්ගලයෙක් ඌට කාරුණික වී නම් ඌ කොතරම් හොඳින් හා කීකරුව හැසිරුනිද! අන්තිමේදී, කිසියම් නොදන්නා හේතුවක් නිසා පත් ඉරුවා පණිවුඩ ගෙනයන ටානියාට සීමා විය. ටානියාට තිබුණේ දිදුලන අළු පැහැ දෑස්ය. ඇගේ ඝණ කළු වරළස දණහිස තෙක් දිගු විය.

(බොහෝ වතාවක් ඇය අත් බෝම්බ වරළසෙහි සඟවාගෙන ජර්මානුවන් අතරින් සහ පොලිස් මුරපොල අතරින් ඒවා ගෙන ගියාය.) ඇගේ සිනාව රිදී සීනුවක් සැලෙන්නා සේ විය. පත් ඉරුවාට ඇගේ සිනාව ඇසුණු විට ඌ උගේ කෙටි, උල් කන් කෙළින් කොට සවන් දෙයි. ඉක්බිති ඌ ප්‍රීතිමත් පිළිගැනීමකින් හේෂාරවය කරයි.

එය අවංක හා ආත්මාර්ථයෙන් තොර මිතුරු දමකි. අත්‍යාවශ්‍ය මොහොතේදී සැඟවී ගන්නේ කෙසේදැයි පත් ඉරුවා දැන හුනි. නැගිටින්නට අවසරය ලැබෙන තුරු ඌ නොසෙල්වී පොළොවේ දිගාවී සිටියි. ඌට බළලෙකු සේ හඬ නොනඟා පා තබා යා හැකි විය. එසේම ඌ හැල්මේ ගියේ පහසුවෙන් හා ශීඝ්‍ර ලෙසිනි. පත් ඉරුවා එක් වරකට වඩා මේ බියෙන් තොර පාටිසාන් තරුණිය සතුරු වෙඩි උණ්ඩ වලින් ඉවතට ගෙන ගියේය. එසේම ටානියාද පෙරළා නිතරම ඇගේ සටන් සගයාට අන්තිම පාන් පොත්තද දුන්නාය.

ඔවුනට වරක් සිදු වූ දෙය මෙසේය.

පත් ඉරුවා පිට නැඟුණු ටානියා යුද කටයුත්තකින් පසුව කැලෑ මඟක් ඔස්සේ ආපසු එමින් උන්නාය. නිදි නැති රැයකින් පසුව විඩාපත්ව හුන් ටානියා සිටියේ කිරා වැටෙමිනි. කඳවුරට ළඟා වන්නට තවත් කිලෝමීටර ගණනාවක් ගෙවිය යුතුව තිබිණි. එහෙත් බුද්ධිමත් පත් ඉරුවා සියළු පාටිසාන් මං දැන සිටියෙන් මඟ වැරදීමේ බියක් නොවිණි. එක්වරම පත් ඉරුවා නතර වුණි. අවදි වූ ටානියාට අසු නිසලව නැවතී සිටින අයුරු පෙනිණි. ඇ පා පටියෙන් අසු ස්පර්ශ කළාය. ප්‍රතිචාරයක් නැත. පත් ඉරුවා කෙළින් කොටගත් දෙකන් සෙළැවූවා පමණකි. ටානියා තෝන් පට සෙළැවූවාය. පත් ඉරුවා තවමත් චලනය වූයේ නැත. අඩු තරමේ ඌ හිසවත් සෙළැවූයේ නැත, නොසන්සුන්ව පා මාරු කළා පමණෙකි. හරියටම 'මට කරදර කරන්න එපා' කියන්නා සේය.

"මොකක්දෝ වැරැද්දක් තියෙනවා" පත් ඉරුවා තම චින්තාපරතාවය ටානියාට සන්නිවේදනය කළේය. සෑදලය

මතින් නැගී හුන් ටානියා අශ්වයාගේ හිසට තට්ටු කළාය.

පත් ඉරුවා කැළඹුණුසුළුව වෙව්ලා ගොස් කිසිවකට සිතා මතා සවන් දෙමින් යළිත් තම දෙකන් සෙළැවීය. එවිට ටානියා ඌ පිටින් බැස ඌ නෙත් හයා බලමින් හුන් පඳුර දෙසට ගමන් ගත්තාය. අසුද ඈ පසුපස පියවර කීපයක් තැබීය. ටානියාගේ වික්ෂිප්ත බව වැඩිණි. අගේ නිදිබර බව නැතිව ගියේය. දැන් ඇයටද කිසියම් ආගන්තුකමය පුසුඹ මිශ්‍රණයක ඉවක් දැනිනි. එය පිළිස්සුණු සම්, පැට්‍රෝල් හා අනෙක් මොනවා හෝ වල මිශ්‍රණයකි.

පුළුන් පිරවූ ජැකට්ටුවේ වූ පිස්තෝලයට අත තබා ගනිමින් ටානියා ප්‍රවේශමින් පඳුර මෑත් කරමින් පාරේ සිට තවත් ඉදිරියට ඉදිරියට ගමන් කළාය. ටානියා සේම හඬ නොනඟා ගමන් ගත් පත් ඉරුවා ද එක් පියවරක් හෝ පමා වූයේ නැත. එක්වරම ටානියාට දුබල කෙඳිරිල්ලක් ඇසිනි. ඈ විශ්මයෙන් ආපස්සට වූවාය. ඉක්බිති යළිත් කෙඳිරිල්ලකි. ඇයට එකදු වදනක් හෝ තේරුම් ගත නොහැකි විය. කිසිවෙක් උදව් ඉල්ලා හඬ ගාන්නා සේ, නැතහොත් වතුර ඉල්ලා සිටින්නා සේ පෙනේ....

දිරිය උපදවා ගත් ටානියා අසුට කොඳුරමින් අණ කළාය.

"මෙතනින් හිටින් පත් ඉරුවෝ"

දකුණතින් පිස්තෝලය දරාගත් ඈ කෙඳිරිල්ල ඇසුණු දෙසට ගමන් කළාය.

තවත් පඳුරකි. ඉන්පසු තවත් පඳුරකි. ටානියා ගල් ගැසුණාය. කුඩා එළිමහනක දුම් දමමින් තිබුණේ ගුවන් යානයක සුන්බුන්ය. ඒවා අතරෙහි වැතිරගත් මිනිසෙකි. එය සෝවියට් ගුවන් යානයකි.

නියමුවාගේ ඇඳුම් පිළිස්සීලාය. පිළිස්සුම් වලින් සහ තදබල වේදනාවෙන් ඔහු විසඥව ගොසිනි. හිඳගන්වන්නට යත්න දරමින් ටානියා ඔහුව ඇද්දාය. එහෙත් ඔහු කෙඳිරිල්ලක් නගමින් ජීවයෙන් තොරව යළිත් බිමට ඇද වැටුණා පමණෙකි. හැකි ඉක්මණින් කිසිවක් කළ යුතු විය.

ටානියාට තම විශ්වාසී පත් ඉරුවා සිහිපත් විය. ඇගේ හඬ ගෑම ඇසුණු සැණින් ඌ ඈ වෙත පැමිණියේය.



"පත් ඉරුවෝ මට උදව් කරපන් රත්තරනේ!"

ටානියාගේ කාංසාවෙන් යුතු හඬට සවන් දුන් පත් ඉරුවා කීකරු ලෙසින් අණ පිළිපැද්දේය.

බිමට පහත් වූ ඌ නියමුවා වෙත පිට හරවා ටානියාට නියමුවාගේ දෑත් උගේ ගෙලේ බැඳිය හැකි වන සේ ගෙල එසැවීය. ඉන්පසු සෙමෙන් ඉහළට එසැවුණු ඌ ගැහැණු ළමයා තමා පිට නගින තුරු බලා හුනි. ඉක්බිති මහත් ප්‍රවේශම්කාරී පියවරින් කඳවුර බලා ගමන් ගති.

පාටිසාන් පෙරමුණේ සිට ගුවන් නියමුවා ගුවන් යානයකින් පසුමුණේ රෝහලකට යැවිණි. යුද්දයට පසු මොස්කව් හි ත්‍රුෂිනෝ ගුවන් තොටුපළේදී අහම්බෙන් ටානියාට එම නියමුවා මුණ ගැසිනි. ටානියා හඳුනාගත් ඔහු මහත් සේ ප්‍රීතියෙන් පිනාගොස් ඇය තම මිතුරන්ට හඳුන්වා දුනි.

"මේ ඉන්නේ ටානියා, හඳුනා ගන්න, පාටිසාන් සෙබළියක්. යුද්දෙ කාලේ ඈ තමා මගේ ජීවිතේ බේරුවේ" ඔහු කීවේය.

"අනේ ඒ මං නෙවෙයි. ඒක කළේ පත් ඉරුවා. එයාටයි ඇහුනේ..."

"ඒක ඇත්ත... පත් ඉරුවාත් කොටස් කාරයෙක් තමා! කෝ දැන් පත් ඉරුවා, ඔයා දන්නවද?"

"ඔව්, අපේ ඒකකේ රතු හමුදාවට එකතු වුණු වෙලේ ඌව ගොවියන්ට බාර කළා. දැන් සමූහ ගොවිපොළක වැඩ කරනවා"

ඉතිං පාටිසාන් අසු පත් ඉරුවාගේ කතාව එයයි.

<u>මක්සිම් ලූෂනින්</u>

යූසික්ගේ මව අතරමං වෙයි...

අගෝස්තුවේ උදෑසන නිල් පැහැ වූත් පැහැදිලි වූත් එකකි. හරියටම එය විලෙහි සුවදායි දියෙහි නෑවාක් මෙනි. යූසික් සහ ඔහුගේ මව විල පසෙකින් ඇවිද යමින් උන්හ. ඔවුහු මෙහි පැමිණ තිබුණේ නිවාඩුව ගත කරන්නටය.

වැල්ලෙන් පිරි වෙරළ පුරා මිනිස්සු සිටගෙනද, හිඳගෙනද, දිගාවීගෙනද උන්හ. යූසික්ලාට තම පැදුර එළා ආහාර මළු තබා ගැනීමට කිසිදු ඉඩක් නොවීය.

"අපි යං ළමයින්ගේ වෙරළට. හැබැයි මගේ අතේ දුරින් එහාට හෙම විතරක් යන්න එපා. එහේ මෙහේ බලන්නත් කලිං ඔයාව අතරමං වෙයි. එතකොට අපි මොනවා කරන්නද?"

ඔහුගේ මව මේ වදන් එක් වරකට වඩා යළි යළිත් කියා තිබුණාය. යූසික් ඉවසීමෙන් යුතුව සවන් දුනි. ඔහුගේ උණුසුම් හා දියදිය ලෑ අත මවගේ ඇඟිලි වල එල්ලිනි. වැඩි වෙලා යන්නට පෙර යූසික් පිපුණ මල් සේ පෙනෙන කිසිවක් දුටුවේය. පොපි මල්, බ්ලූ බෙල් මල්, බටර් කප් මල්.... ඔහු මින් පෙර එවන් මල් හෝ එපමණ මල් දැක නොතිබිණි. ඒවා දුවමින්ද, ක්‍රීඩා කරමින්ද, ගී ගයමින් පමණක් නොව වැළපෙමින්ද උන්හ. මෙය ළමුන්ගේ වෙරළ බව ඔහුට තේරුම් ගියේ එවිටය. එසේම මේ මල් නොවන බවත්, වෙනස් වෙනස් වර්ණවලින් යුතු කැප් තොප්පි ලෑ ළමුන් බවත් ඔහු දුටුවේය.

එක්වරම යූෂික් දුටුවේ තම නෙත් ඉදිරිපිටින් පාවී යන සමනල අතංගුවකි. ඒ තුළ අති විශාල සමනළයෙකි. ඌ රන්වන් සේදයෙන් සෑදුවාක් වැනිය. ඌ නිශ්චලව සිටින්නේ

කෙසේද? යූසික්ගේ අත මවගේ අතින් ලිස්සීය. ඔහු අතංගුව පසු පස්සේ දිව්වේය.

එහෙත් අතංගුව තව තවත් ඈතට චලනය විය. එය රැගෙන හුන් ගැහැණු ළමයා සිටියේ දුවමිනි. යූසික් ඈ අල්ලා ගන්නටම තරම් ළං වුවද ඈ ළමුන් කණ්ඩායමකට මුසුවී ගත්තාය. එයින් යූසික්ට ඇයගේත් ලස්සන සමනළයාගේත් දෙදෙනාගේම දසුන නොපෙනී ගියේය. තත්ත්වය වඩාත් නරක් කරමින් මව ද කිසිදු තැනෙක සිටිනු ඔහුට දැකගත නොහැකි විය! නැත, ඔහු අතරමං වී නැත. යූසික් එවැන්නක් වීමේ හැකියාව පවා සළකා බැලීම ප්‍රතික්ෂේප කළේය. අතරමං වී ඇත්තේ මවය! පිරිමි ළමයා වෙරළ දිගේ ඉහළටත් පහළටත් දිව්වේය! අම්මා කිසි තැනෙක දකින්නට නොවීය.

ළමෝ බෝල ගැසූහ, ළණු පැන්නහ, දිය විසිරූහ. මේ ප්‍රීතිමත් ළමා බිමෙහි ඔවුන් හැමෙකෙකුටම තමන්ගේම කුඩා තැනක් තිබිණි. එතැන එක්කෝ වැල්ල මත පැදුරක් එළා නැතහොත් සරලව පත්තර කොළයක් එළා මව ඒ මත හිඳගෙන සිටින්නීය. ඇගේ විපරම්කාරී ඇසට ලක්වී සිටීම හොඳය. ඈ බලාගෙන නොසිටින බවක් පෙනුනද දැනෙන්නේ ආරක්ෂාකාරී බවකි.

තනිවී සිටීමට යූසික් බියවූවා නොවේ. කොහොමටත් ඔහුට පිටුපස මිදුලේත්, ළදරු පාසලේත් තනිවී හිඳ හුරු පුරුදුය. ඔහු වරක් අම්මාවද ආරක්ෂා කොට ගත්තේය. වස්සෙකු තරම් විශාල බල්ලෙක් ඉදිරිපිට සිටගත් ඔහු දෑත් විහිදීය. බියපත් වන්නියක නොවූ ඔහුගේ මව වැළපෙමින් දෑත් පපුවට තබා ගත්තාය. එවිට ඔහු සංසුන්ව හා බරපතළ ලෙසින් කතා කළේය. "කරදර වෙන්න එපා අම්මේ, මං බලු කුක්කට කරදරයක් කරන්නෙ නෑ!"

දැන් පවා, ඔහු මෙතැන සිටගෙන සිටිද්දී ඈ සමහරවිට භීතියෙන් වෙව්ලනවා ඇත. නැත! ඔහු ඉතා ඉක්මණින් ඈ සොයා ගැනීම හොඳය!

දහදිය ලමින් හා හුස්ම ගැනීමට මුව හයමින් යූසික් ළමුන් කණ්ඩායමෙන් කණ්ඩායමට දිව්වේය. ඔහුගේ මව මෙහි සිටියේද? අනුකම්පා සහගත වූ වැඩිහිටියෝ අම්මා හැඳ සිටියේ කුමක්ද, ඇගේ කොණ්ඩ මෝස්තරය කෙසේද

යනාදිය ඇසූහ.

ප්‍රශ්න සහ පිළිතුරු කිසිදු ප්‍රතිඵලයක් ගෙන ආවේ නැත. සුදු තිත් ඇති රතු ගවොම් ඇඳි හා හිරු එළියෙන් විරංජනය වූ ලා දුඹුරු පැහැ හිසකේ ඇති ගැහැණු බොහෝ ගණනක් වූහ!

මඳක් හිඳගෙන විවේක ගන්නැයි යූසික්ට කියනු ලැබිණි. ඔහුට පැණිරස කැවිලිද, බනිස්ද පිරිනැමිණි. එසේම කිසිවෙක් ඔහුට සිසිල් බීමක් වත් කොට දුන්හ. ඒ කිසිවක් පිළිගැනීම පිරිමි ළමයා ප්‍රතික්ෂේප කළේය. මෙය සංග්‍රහ පිළිගැනීමට කොහෙත්ම වෙලාව නොවේ! අම්මා කොහේ හෝ නිසැකවම ඔහු සොයා උදව් පතා වියරුවෙන් දුවමින් සිටිනවා ඇත.

එවිට ඔහුට අපූරු අදහසක් ආවේය. ඇය සොයා ගැනීමේ එකම මඟ එපමණක්මය. සෑම අම්මා කෙනෙක්ම සිටියේ ඇගේ දරුවන් සමඟය. එහෙත් ඔහුගේ මව පමණක් තනිවය. ඉතිං යූසික් වෙරළ දිගේ මෙසේ අසමින් යළිත් ඇවිදින්නට විය.

"පුංචි ළමයෙක් ළඟ නැතුව ඉන්න ගෑනු කෙනෙක්ව හෙම දැක්කද?"

මිනිසුන්ට සිනාවක් නොනඟා බැරි විය. එසේම ඔවුනට එවන් ගැහැණු කෙනෙක් සිටියේ කොහේදැයි ඇත්තටම සිහිපත් විය. ඉතා ඉක්මණින්ම යූසික් මව සොයා ගත්තේය.

දෙදෙනාම අති මහත් සේ ප්‍රීතියට පත් වූහ. එහෙත් තමා කෙනෙක් කණස්සල්ලෙන් හුනි දැයි අම්මා පෙන්වූයේ නැත. එසේම යූසික්ද තමා වෙරළ දිගේ කොතෙක් අම්මා සෙව්දැයි පෙන්වූයේ නැත.

පසුව ඉතා සතුට ගෙන දෙන පිහිනීමකින් පසු ඔවුහු හොඳ දිවා ආහාරයක් ගත්හ. හොඳින් තැම්බූ බිත්තරයක් තක්කාලි ගෙඩියක් සමග ඉක්මණින් කා දැමූ යූසික් රාස්ප්බෙරි බීම වීදුරු දෙස බැල්ම හෙළීය. ඔහු එය එසැවීය. එහෙත් එය ඔහු අම්මාට දුනි. ඉක්බිති තම හිස එම හුරු පුරුදු, හිරු එළියෙන් දුඹුරු පැහැ ගැණුනු උරහිස මත තබා ගනිමින් ඔහු දොස් පවරනසුළු ලෙසින් මෙසේ කීය.

"ඇයි ඔයා පාර බලාගෙන යන්නේ නැත්තේ? ඔයා සඳහටම අතරමං වෙන්ඩ තිබ්බා!"



<u>වසිල් කොම්වෙන්කෝ</u>

හෙල්මට් තුන

පුංචි අන්ද්‍රෙයිගේ ගෙදර හෙල්මට් දෙකක් තිබේ. ඒවා රාක්කයක එක ළඟින් තබා ඇත. එකක් සෙබළ හෙල්මටයකි. එය සීයා යුද්දය නිමවී ආපසු එද්දී ගෙන ආවේය. එම හෙල්මටය ඔහුගේ ජීවිතය බේරා ගත්තේය. සීයා වේගයෙන් ප්‍රහාරයට ඇදෙමින් හුනි. ඇත්ත වශයෙන්ම එවකට ඔහු සීයා නොවේ. ඔහු තරුණ සෙබළෙක් විය..... එවිටම ඔහු ඉදිරිපිට බිම් බෝම්බයක් පුපුරා ගියේය. බෝම්බ පතුරු හැම අතකම විහිදිණි.... එකක් එල්මටයේ වැදුනි. එයින් වීසි වී ගිය ඔහු බිම ඇද වැටුණි. එහෙත් හෙල්මටය අව්‍යශ තරම් ශක්තිමත් විය. සීයා පණ පිටින් රැකුනි.

දෙවැන්න අන්ද්‍රෙයිගේ පියාගේය. එය සාමකාමී කාලයේ හෙල්මටයකි. අන්ද්‍රෙයිගේ පියා ගොඩනැගිලි වැඩ බිමක වැඩ මූලිකයෙකි. ඔහුත් ඔහුගේ කණ්ඩායමත් බොහෝ ගණනක් මහල් නිවාස තනා තිබේ. කුඩා අන්ද්‍රෙයි වසන නිවස ඇති තට්ටු නමයේ ගොඩනැගිල්ල ද සෑදුවේ ඔවුන් විසිනි. බසයකින් ගමන් කරමින් සිටිද්දී පියා අන්ද්‍රෙයිට අත දිගු කොට පෙන්වීය. "අර මගේ ඉස්කෝලේ, මගේ ප්‍රජා මධ්‍යස්ථානේ. මං ඔයාගේ ළදරු පාසලත් හැදුවා"

පියාගේ හෙල්මටය සමරුවකි. එයට කියන්නේ රන්වන් හෙල්මටය කියාය. එය පිරිනමන්නේ ගොඩනැගිලි වැඩබිමේ හොඳම සේවකයින්ටය.

ඉතිං මෙසේ මේ හෙල්මට දෙක එකක් ළඟින් අනෙක තබා තිබෙයි. සීයාගේ එක ඇඳිරිය, එහි වෙඩි උණ්ඩ සහ බෝම්බ පතුරු වලින් සැදුණු සීරුම් හා තැලීම්ය. තාත්තාගේ එක දීප්තිමත් තැඹිලි පැහැතිය.

අන්ද්‍රෙයිගේ සිහිනය වන්නේ වැඩුණු විට තමාගේම වූ හෙල්මටයක් පැළඳීමය. එය අජටාකාශගාමියෙකුගේ හෙල්මටයක් වනු ඇති බවට ඔහුට නිසැකය. එසේම ඇත්ත වශයෙන්ම අන්ද්‍රෙයි එය තම පියාගේත්, සීයාගේත් ඒවාට එහායින් තබනු ඇත. එවිට ඒ තුනම එකක් ළඟින් අනෙක තබා තිබෙනු ඇත.

<u>ව්ලැඩිමීර් ලිප්ස්කි</u>

අලුත් සෙල්ලමක්

මරීනා කැමති දවස ඉරිදාය. එදිනට අම්මාත් තාත්තාත් වැඩට යන්නේ නැත. එසේම එදින ඇයට ළදරු පාසලට යන්නට සිදු නොවේ.

මරීනාගේ මිතුරු මිතුරියෝ හැම දෙනම ගෙයි මිදුලේ සෙල්ලම් කරති. ඔංචිලිද, වැලි පෙට්ටියක්ද, මේසද, බංකුද සෙල්ලම් පිට්ටනියේ තිබිණි.

ගැහැණු ළමෝ එක් වූ විට ඔවුන් වෙන් කිරීමට නොහැකිය. ඔවුහු තම බෝනික්කන්ට කෑම කවති, ඇඳුම් අන්දවති, නැළවිලි ගී ගයති, එසේම අලුත් අලුත් සෙල්ලම් සොයා ගනිති.

දිනක් මරීනා සෙල්ලම් පිටියට ආයේ බෝනික්කන්ට වඩා ඉතා විශාල ටෙඩී වළසෙකු සමඟිනි. උගේ දෙකන් පිටතට නෙරා තිබුණේ විහිළුකාරී ලෙසිනි, උගේ ඇඳිරි ඇස් දිළිසිති. උගේ කට ඇතුළේ වූ රතු පැහැ දිව කොන දක ගත හැකිය. වළසා ඇල්ලූ විට ඌ මුමුණනන්ට ගනී. ඌ තම ස්වාමිදුවට කතා කරන්නේද, නැතිනම් මැසිවිලි නඟන්නේද කියා කිසිවෙක් නොදත්හ.

"කෝ ඔයාගෙ වළහා අපට පෙන්නනන්න" ළමෝ කෑ ගැසූහ.

මරීනා වළසා තම පපුවට තද කොට ගනිමින් මෙසේ කීවාය.

"එයාට කරදර කරන්න හොඳ නෑ. එයාට මහන්සියි.

එයා බී.ඒ.එම්.* පාර දිගේ ඈත ඉඳන් ඇවිත් තියෙන්නේ"

"ඒ කොහේද ඒක තියෙන්නේ?" ලේනා ඇසුවාය.

"තාත්තා කියන්නේ ඒක හරිම පුදුම ලස්සන දිහාවක්ලු. මෙහේ ඉඳන් හුඟාක් ඈතලු. එහේ මහා වනාන්තරලු. හිම හැම තැනමලු. ගල්වෙන ගානට හීතලයිලු. හැබෑ වළස්සු පණ පිටින් එහේ ඉන්නවලු"

"ඔයාගෙ ටෙඩී වළහත් කැලේද ජීවත් වුණේ?" කුඩා ස්වේටා විමැසුවාය.

"නෑ එයාව තාත්තා කඩේකින් සල්ලි දීලා අරන්. ඒත් තාත්තා සැරයක් හැබෑ වළහෙක්ව දැක්කා. උෟ තාත්තා නිදා හිටිය ගේ ළඟටම ආවා"

මරීනා බංකුවක හිඳ ගත්තාය. ගැහැණු ළමෝ ඈ වටකොට ගත්හ. බී. ඒ. එම්. හි සිට පැමිණි ටෙඩී වළසා සුරතල් කරන්නට සැම කෙනාටම ඕනෑ විය.

තාත්තා කියා තිබූ දෑ සිහිපත් කළ මරීනා එය තමාගේම වදන් වලින් යෙහෙළියන්ට කීවාය.

"එහේ මීට කලින් කිසිම කෙනෙක් ජීවත් වුණේ නෑ. ඊට පස්සේ දැන ගන්න ලැබුණා එහේ මහා විසාල නිධානයක් තියෙනවා කියලා. වේගෙන් ගලන ගංගා වලට උඩින්, වගුරු උඩින්, කැලෑවල් මැදින්, ගල් පර්වත කඳු අස්සෙන් කෝච්චි පාරක් හදන්න නිර්භීත මිනිස්සු එහේට ගියා. ඒ ගොල්ලෝ ගල් ගැහෙන හීතලටවත්, කළුවර වනාන්තර වලටවත් බය වුණේ නෑ"

"ඇයි ඒ ගොල්ලෝ කෝච්චි පාරක් හදන්නේ?" ඒ ඇසුවේ ටානියාය.

"හැමෝටම ඕන වෙන නිධානය අරන් එන්න" මරීනා පිළිතුරු දුන්නාය.

"අපිටත් ඒක ඕනැද?"වේරා ඇසුවේ පුදුම වෙමිනි.

"තාත්තා කීවේ අලුත් නගර හදන්න, හුඟක් සෙල්ලම්බඩු ජාති හදන්න එතකොට ලස්සන ඇඳුම් හදන්න නිධානය පාවිච්චි කරන්න පුළුවන් කියලා"

---

* බී.ඒ.එම් (B.A.M.) නැගෙනහිර සයිබීරියාවේ ගොඩනැගුම් ව්‍යාපෘතියක් වූ බයිකාල්-අමූර් දුම්රිය මඟට යෙදෙන කෙටි නමය.

දුන්නේ මඳ වේලාවක් කල්පනා කොට වළසාට සුරතල් පහරක් දෙමිනි.

"එතකොට ඔයාගෙ ළඟ ඉන්න වගේ ටෙඩී වළස්සු හදන්නත්...?"

"ටෙඩී වළස්සුන්ව හදන්නත්....... ඔව්!" මරීනා පිළිතුරු

"අනේ මං අලුත් සෙල්ලම් බඩු වලට හරි ආදරෙයි!" පුංචි ස්වේටා කීවාය.

එදා දවසේ අපේ තට්ටු නිවාස පෙළේ ළමෝ අලුත් සෙල්ලමක් සොයා ගත්හ.

"කෝච්චි පාරක් හදනව අපි" යි කියමින් ඔවුහු වැලි පාරක් තැනූහ. සෙල්ලම් කෝච්චි පෙට්ටි පාර දිගේ ඇදී ගියේ අභිරහස් බී.ඒ.එම්. නිධානය කරාය.

බෝනික්කෝ බංකුව උඩ හිඳගෙන උන්හ. එදින ඔවුන් නිදි කරවන්නට කිසිවෙක් නොවූහ.

මිකෝලා ගිල්

අපට හිරු දැකිය හැකිය

ඔහු සෙබළෙකු විය.

ඔහු සෙබළෙකු වූයේ 1941 දී නාසීන් ඔහුගේ රට ආක්‍රමණය කළ විටදීය.

ඔහු සාමාන්‍ය සෙබළෙක් නොවේ. ඔහු ඉංජිනේරුවෙකි.

කාට වුවත් සෙබළ රාජකාරිය අසීරු එකකි. එහෙත් ඉංජිනේරුවෙකුට එය වඩාත් භයානකය, වඩාත් අසීරුය. ඒ යුද ඉංජිනේරුවෙක් නිතරම සිටින්නේ පෙරමුණේම නිසාය. ඉතාම දුෂ්කර දේ ඇත්තේ එහිය. පාබල හමුදාවට ඉදිරියෙන් යන යුද ටැංකි ගමන් කළ යුතු තැන් වලට මුළින්ම යන්නෝ ඉංජිනේරුවෝය.

ඔවුන්ගේ රාජකාරිය වන්නේ සතුරන් වළලා ඇති බෝම්බ ඉවත් කිරීමය.

ඉංජිනේරුවෙක් නිර්භීත විය යුතුමය. ඔහුට වානේ වලින් කළ ස්නායුද සුහුරු දෑත්ද තිබිය යුතුය. ඒ ඉංජිනේරුවෙකුගේ අත් වෙව්ලයි නම් ඔහු ඉවර බව ගණන් ගත හැකි නිසාය. බිම් බෝම්බයක් ඔහුගේ වෙව්ලන අත් තුළදී පුපුරා යනු ඇත.

ඉංජිනේරුවා අත් වැරදි නොකළ යුතුය. ඉංජිනේරුවෙක් ජීවිතයටම අත් වැරැද්දක් කරන්නේ එක් වරක් පමණක් යැයි කීමේ පුදුමයක් නැත.

ඔහු නිර්භීත විය. අපේ සෙබළාහට වානේ වලින් කළ ස්නායුද, සුහුරු දැත් ද තිබිණි. ඔහු කිසිදා අත්වැරැද්දක් කළේ නැත. ඔහු සිය ගණනක්, සමහරවිට දහස් ගණනක් බිම් බෝම්බ නිශ්ක්‍රීය ඒවා කොට ජයග්‍රහණය සඳහා වූ මාවත පෑදීය.

එය සැබැවින්ම දිගු මාවතක් විය. අවුරුදු හතරක් ගෙවුණු එය නිමා වූයේ 1945 මැයි 9 වැනිදාය.

සෙබළා සිතුවේ තම සේවය නිමාවී ඇති බවය. ඔහු ගෙදර ආවේ කෙත හාන, තණකොළ කපන සහ අස්වනු නෙළන බලාපොරොත්තුවෙනි.

එහෙත් ගෙදරදී සිදුවූයේ ඛේදවාචකයකි. නව යොවුන් වියේ සිටි ඔහුගේ පුතු සතුරන් විසින් කලකට පෙර වළලා තිබූ බිම් බෝම්බයක් පුපුරා මිය ගියේය. යුද්දය පැවති කාලය තුළ ඔහු බොහෝ ගණනක් මරණයන් දැක තිබිණි. එහෙත් තම පුතු මිය ගිය විට තිස් තුන්වැනි වියේ සිටි ඔහුගේ කෙස් පැසී ගියේය.

බිම් බෝම්බ වලින් තුවාල ලත් නව යොවුන් තරුණයින්ගෙන් මුළු වාට්ටුවක්ම පිරී ඇති බවක් වරෙක ඔහුට ආරංචි විය. එය නම් කෙරුණේ 'බිම් බෝම්බ වාට්ටුව' ලෙසිනි. එය තිත්ත විහිළුවකි.

සෙබළා වාට්ටුව බලන්නට ගියේය. ඔහු තම පුතුගේ මරණයේදී සේම පීඩාවට පත් විය. විශේෂයෙන්ම දෑස් වෙනුවට හිස් ඇස් කෙවෙණි දෙකක් පමණක් ඉතිරිව තිබූ පිරිමි ළමයා ඔහුගේ සිහියේ රැඳිනි. ඔහුට ළමයාගේ වදන් අමතක කළ නොහැකි විය. "මහත්තයෝ මට ඉර බලාගන්න බෑ..."

ඉතිං සෙබළා යළිත් තම යුද නිළ ඇඳුම ඇඟලා ගති. නාසීන් වළලා ඉතිරිව තිබූ බිම් බෝම්බ සහ ෂෙල් වෙඩි ගොඩ ගැනීම ඔහු යළි ඇරඹීය.

බිම් බෝම්බයක් නිෂ්ක්‍රීය කොට එය මළ විසකුරු

සර්පයෙකු සේ පිළිකුලෙන් ඉවතට වීසි කරන හැම විටෙකම ඔහු සෙමෙන් මෙසේ මුමුණයි. "දැන් ඉතිං උඹ කාගෙන්වත් ඉර වහළා නොදාවි"

මිනිස්සුන්ටත්, සතුන්ටත් නිදහසේ ඇවිදින්නට හා ළමුන්ට තමන් කැමති ඕනෑම තැනෙක සෙල්ලම් කරන්නට හැකි වන සේ ඔහු තම භයානක හා උදාර කටයුත්ත අවුරුදු බොහෝ ගණනක් පුරා කරගෙන ගියේය.

අනෙක් රටවලද යුද්ද තිබිණි. අවුරුදු ගණනාවක් තිස්සේ දුර ඈත අප්‍රිකාවේත්, ඇල්ජීරියාවේ ශුෂ්ක බිම් වලත් යුද්දය ප්‍රචණ්ඩව පැතිරිණි.

මිනිසුන්, සිව්පාවුන්, කුරුල්ලන් මරා දමමින් බිම් බෝම්බද, බෝම්බද, ෂෙල් වෙඩිද එහි ඉතිරි වී තිබිණි. එසේම එහිද 'බිම් බෝම්බ වාට්ටු' තිබිණි.

තමන්ගේ භූමියෙන් බිම් බෝම්බ ඉවත් කොට පිරිසිදු කොට දෙන්නැයි ඇල්ජීරියානු ආණ්ඩුව සෝවියට් දේශයෙන් ඉල්ලා සිටියේය.

එම බිම් බෝම්බ යුද්දයේ භයංකර බීජයන්ය. එවිට සෙබළා නැව් නැඟ එහි ගියේය. ඒ ඔහු සෝවියට් සෙබළෙක් නිසාය, මහ පොළොව මත සියළු අවංක මිනිසුන්ගේ මිතුරෙක් හා ආරක්ෂකයෙක් නිසාය.

අපේ සෙබළා කිසිවිටෙක අත්වැරැද්දක් සිදු කොට නැත. ඔහුගේ දෑත් වෙව්ලුයේ නැත. ඔහු බිම් බෝම්බ සහ ෂෙල් වෙඩි දහස් ගණනක් ගොඩ ගෙන හාතියෙන් තොර ඒවා බවට පෙරළීය. එසේම දුර ඈත ඇල්ජීරියාවේදී, තමන්ගේම මව්බිමේදී සේම ඔහු විස රහිත කළ සර්පයෙකු ඉවත දමද්දී "දැන් ඉතිං උඹ කවදාවත් කාගෙවත් ඉර වහලා නොදාවි"යි කීය.

ඔහුගේ ඉතිරි ජීවිත කාලය පුරාවටම ඇල්ජීරියාවේ එක් කුඩා ගමක් මතකයේ රැඳිනි. මුළු ගමේම වූ වැසියෝ සෝවියට් සෙබළා පිළිගති.

ඔහුට මල් පොකුරක් පිරිනැමූ කුඩා ගැහැණු ළමයා ඔහුට සිහිපත් වෙයි. ඇගේ සම ඇඳිරි පැහැතිය, මුළුමනින්ම මෙන් කළු පැහැයට කිට්ටුය.

ඇගේ සිනහව මුළු වටකුරු මුහුණම එළිය කළේය. ඔහුට කරන්නට තිබුණේ එම ගමේ දනටමත් තණ කොළින් වැසී ගිය කෙත් යායක බිම් බෝම්බ ඉවත් කොට දැමීමය. ගොවීහු එම කුඹුර හාන්නට උත්සාහ කොට තිබිණි. එහෙත් ඉන් කිහිප දෙනෙක්ම ආපසු ගෙදර පැමිණියේ නම් නැත.

දැන් ගම්මු බලාපොරොත්තු වූයේ එක් දෙයකි. ඒ සෝවියට් සෙබළා තමන්ට යළි කෙතට යාමට ඉඩකඩ සාදා දෙනු ඇති බවය.

ඉතිං ඇඳිරි සම ඇති ගැහැණු ළමයා ඔහුට වන මල් මිටියක් පිරිනැමුවාය.

ඔහු කෙත් යායෙන් මුළුමනින්ම මෙන් බිම් බෝම්බ ඉවත් කොට තිබිණි. තවත් ඉතිරිව තිබුණේ ඉතා කුඩා පදාසයක් පමණෙකි. එහෙත් සෙබළා සිටියේ ඉතා තද වෙහෙසකය.

එදින සැඳෑවේ පිපිරුමකින් ගම සසළ විය.

කුමක් සිදුවීදැයි ගැමි ගොවියෝ දැන ගත්හ. ඔවුහු සෝවියට් සෙබළා ගමට ගෙන ආහ. ඔහු සිටියේ පණ පිටිනි. එහෙත් හිරු සඳහටම ඔහුගෙන් වැසී ගොස් තිබිණි. ඔහුට තද උණුසුම් ඇල්ජීරියානු හිරු ඇසුනි, දැනුනි. එහෙත් ඔහුට එය පෙනුනේ නම් නැති.

ඉංජිනේරුවෙක් ජීවිතයටම කරන්නේ එක් අත්වැරැද්දක් පමණෙකි.

ඔහු පිටත්ව යනු දකින්නට දහස් ගණන් ජනයා පැමිණියහ.

ඇඳිරි සමින් යුත් ගැහැණු ළමයා ඔහුට තවත් මල් පොකුරක් පිරිනැමුවාය. ඈ දැකගත හැකි නොවුන ද ඔහු ඇයව හඳුනා ගති. ඔහුගේ ශක්තිමත් අත ඇගේ රළු කෙස් කළඹ අතගෑය. ඔහුගේ අත වෙව්ලූ පළමු වතාව එය වන්නට හැකිය.

ගෙදර පැමිණි ඔහුට දැන ගන්නට ලැබුණේ තමා සීයා කෙනෙකු වී ඇති බවය. ඔහුගේ දියණියට කුඩා දැරියක් ලැබී

තිබිණි. ඔහුගේ මිණිපිරිය නිල් ඇස් සහ රන්වන් පැහැ හිස කෙසැති විය. එහෙත් ඔහුගේ පවුලේ අය මහත් විමතියට පත් කරවමින් ඔහු ඇය ඇමතුයේ කළු කෙල්ල කියාය. සමහරවිට ඒ ඔහු අන්තිම වරට දුටු, නැතිනම් සඳහටම දකින ගැහැණු ළමයා වූයේ අර ඇඳිරි සමින් හා ප්‍රභාවත් සිනාවෙන් යුතු ඇල්ජීරියානු ගැහැණු ළමයා නිසා වන්නට ඇත.

අප සියල්ලන්ටම හිරු දැකිය හැකිය. ඔබට එය දැකිය හැකිය, එසේම මට එය දැකිය හැකිය. එහෙත් අපේ පාර දිගේ සුදු සැරයටියකින් පාර සොයා ගනිමින් ඇවිද යන උස්, හිසකේ පැසුණු මිනිසෙක් සිටී. ඔහු හිටපු යුද සෙබළෙකි, හිටපු යුද ඉංජිනේරුවෙකි.

හිරු එළිය ඔහුගේ මුහුණට වැදී දිළිසෙයි. එහෙත් ඔහුට හිරු දැකිය නොහැකිය.

අපි ඒ මිනිසාට කෘතඥතාවයෙන් යුතුව හිස නමමු!

පාවෙල් කොවාලියොව්

ගස් වැළපෙන විට....

ගස් වැළපෙනු ඔබෙන් කවුරුන් හෝ දැක ඇතිදැයි මම නොදනිමි. ගස් වැළපෙන හැටි මට පෙන්වූයේ මගේ සීයා වූ අක්රෙම්ය.

ඒ පසුගිය ඔක්තෝබරයේදීය. කලින්දා රැයේ වැටුණු වේලාසන හිම පතනය මා කිසිසේත් නොදකින්නට ඉඩ තිබිණි. එහෙත් එදා උදයේ අප දෙදෙන එකට ගෙයින් පිටවූ විගසින්ම අක්රෙම් සීයා මෙසේ කීවේය.

"ඉතිං පේද්යා, මොනවද තුඹට පේන්නේ?"

මම හැම දෙයක් දෙසම පරිස්සමින් බලන්නට වීමි.

ඒ සියල්ලක්ම නොඉඳුල්, කල්පනාවෙන් බර හා තිහඬ බවක් පෙනිනි. හිරු පමණක් දීප්තිමත් වගක් පෙනිනි. මම සීයාට කීවෙමි.

"ඉර හුඟක් දිළිසෙනවා"

"හ්ම්....ම්.. ඔව්" අක්රෙම් සීයා එකඟ විය. "එතකොට තව මොනවද? ටිකක් හොඳට බලාපන්කෝ"

මම එසේ බැලුවෙමි. එහෙත් කිසිදු අසාමාන්‍ය දෙයක් නොදුටුවෙමි.

අක්රෙම් සීයා ඔහුගේ පැසුණු ඝණ රැවුළ අතරින් ලජ්ජාශීලීව සිනාවක් නඟා දැස් ගස් වෙත එසැවීය. මමද

ඔහු අනුව බැලුවෙමි. රැය පුරා කිසිවක් වෙනස් වී ඇතිවාක් මෙනි. ඉතිං මම කීවෙමි.

"චෙරි ගස්වල කහ පාට ගැහුණු කොළ හුඟක් තියෙනවා"

සීයා ලැජ්ජාශීලීව සිනාසුනි. ඔහුගේ නෙත්වල යෞවනමය දිස්නයකි. ඔහු පළමුව එක් ගසක් දෙසද, ඉක්බිතිව තවත් ගසක් දෙසද බැලීය.

"හොඳට කිට්ටුවෙන් බලාපන්කෝ" ඔහු කීය.

මම චෙරි ගස දෙසත්, ළපටි සහ උස් පොප්ලර් ගස දෙසත් බැලුවෙමි. මේවා රියැදුරෙකු වූ මගේ පියා කොහෙන්දෝ අවුරුදු දෙකකට නැත්නම් තුනකට පෙර ගෙනැවිත් පාර අයින දිගේ සිටැවූ ඒවාය. ඉතිං මම මෙසේ කීවෙමි.

"පොප්ලර් කොළ වලින් පිණි බේරෙනවා..."

"ඒ පිණි නොවේ ෆේද්‍යා, ඒවා කඳුළු" අක්රෙම් සීයා පැහැදිළි කළේය.

මම සීයා දෙස නෙත් හයා බැලුවෙමි.

"ඒ කොහොමද කියලා නුඹට පෙනේවි ෆේද්‍යා. ඊයේ රෑ ඉස් ඉස්සෙල්ලම මේ අවුරුද්දට හිම වැටුණා. බලාපන් කොහොමද ගස්වල කොළ කළු ගැහිලා තියෙන්නේ කියලා..."

"මට පේනවා"

"මේ කොළ මිදිලායි තිබුණේ. ඒවා කොහෙත්ම මෘදු හිම නෙවෙයි සණ අයිස්. ඊට පස්සේ ඉර දිස්නේ දීලා අයිස් දියවුණා..."

"එතකොට ගස් අඬනවා" යි නොකියා සිටින්නට මට බැරිවිය.

"ඔව්, ගස් වැළපෙන්න අරන්"

"ඒවා හුඟ කාලයක් වැළපේවිද?"

"දැන් තව හුඟ කාලයක් නෑ" සීයා සුසුම් ලෑවේය. "බොහෝම ඉක්මණට කොළ කහපාට වෙලා හැළේවි. ඊට පස්සේ හිමෙන් ඒවා වැහිලා යාවි"

පොප්ලර් ගස ළඟට ගිය සීයා එහි තෙත් කොළ අතින්



ස්පර්ශ කළේය. එවිට මා දුටුවේ අක්රෙම් සීයා තවදුරටත් සිනා පාමින් සිටියේ නැති බවය. මා සිතන්නේ සරත් සමය එතරම් ඉක්මණින් අවසන් වීම ගැන ඔහුද ඉතා කණගාටු වූ බවය.

ඩයර් ස්ලාව්කොවිච්

තැපැල් පෙට්ටියට මල් මිටක්

නාස්ත්‍යාට ගේට්ටුව අසළදී පත්තර සහ ලියුම් ගෙන එන නැන්දා මුණ ගැසිනි. ඇය නැන්දා අතින් පත්තරය ගත්තාය.

"මරීනා නැන්දේ ඔච්චර බර මල්ලක් අරන් යන එක අමාරුයි කියලා දැනෙන්නෙ නැද්ද?"

"ඒ කොහොමද! ඔයාම කරලා බලන්නකෝ"

"ඔයාට ඔච්චර පත්තර ගොඩක් මොකටද?"

"මිනිස්සු හුඟක් ඉල්ලලා තියෙන හින්දා. හුඟක් දේවල් දැන ගන්න ඒ අය හුඟක් කියවනවා"

"මං ඔයාට උදව් කරන්නද?"

"ඔයා කොහොමද පුංචි පැංචියේ මට උදව් කරන්නේ? මේ මල්ල ඔයාගෙ කරට හුඟක් බර වැඩියි"

"මං ඔයාත් එක්ක පාර දිගේ ඇවිදගෙන එන්නං. ඔයා එක පත්තරයක් එක ගේකට දෙන්න. මං තව පත්තරයක් තව ගේකට දෙන්නං. අපිට එතකොට වැඩේ වේගෙන් කරන්නා පුළුවන්. ඔයාට ඒක ලේසියක් වෙයි"

"අනේ ඔයා කරදරේ වැටෙන්න එපා. ඒකෙන් ඔයාගෙ කකුල් රිදෙන්න ගනී"

"ඒකෙ දෙයක් නෑ"

ඉතිං ඔවුහු දෙදෙන එකට ඇවිද ගියහ. මරීනා නැන්දා එක ගෙයකට ගියාය. නාස්ත්‍යා තව එකකට ගියාය.

මුළු කුඩා නගරය වටාම ඔවුහු පැය භාගයක් තුළ ඇවිද අවසන් කළහ. එය වේගවත් හා ඵලදායි එකක් විය. එකම එක ප්‍රශ්නයක් පමණක් තිබිණි. නාස්ත්‍යා ගිය ගෙවල් තුනක පමණක් තැපැල් පෙට්ටි තිබුණේ ඇයට අත දිගු කොට ගත නොහැකි තරම් උසිනි.

"ඔයා මට කළේ ලොකුම උදව්වක්" වෙන් වී යන අතර මරීනා නැන්දා කීවාය. "ඔයාගෙ උදව්වට ස්තූතියි"

එදා සිට දවස ගානේම නාස්ත්‍යා නගරයේ අනෙක් කෙළවර දක්වා ගියාය. ඇ මරීනා නැන්දා පාළම ළඟදී මුණ ගැසෙන්නීය.

මිනිස්සු නාස්ත්‍යාට තැපැල් දුව යැයි කියන්නට ගත්හ. ඇ එයට බොහෝ සේ කැමතිය.

"අද මට එක පත්තරේද තියෙන්නේ?" එක් ගෙයකින් අයෙක් ඇසූහ.

"එකම එක පත්තරයයි. ඒත් ඒක හුඟක් වැදගත් සිත් ගන්නා එකක්" ඇ පිළිතුරු දුන්නාය.

"ලියුම් මොකවත් තියේද නාස්ත්‍යා?" තවත් නිවෙසක අයෙක් අසති.

"තාම ඒවා ලියනවා" නාස්ත්‍යා මරීනා නැන්දා සේ විහිළු කළාය.

මහළු ගුරුතුමිය ඇයව ඉතා උණුසුමින් පිළිගත්තාය. ඇගේ නිවෙස අසළ නැවතී යෑමෙන් තැපැල් දුව මහත් සතුටට පත් වූවාය.

එහෙත් සඳුදා දවසේ මහළු ගුරුතුමිය වෙත බෙදන්නට කිසිවක් තිබුණේ නැත.

"මරීනා නැන්දේ ඇයි අපි අද ගුරුතුමීට මොකවත් ගෙනියන්නෙ නැත්තේ?"

"එයාගෙ පත්තර සඳුදට එන්නෙ නෑ. එයාට අද ලියුම්වත්, සඟරාවත් නෑ"

නාස්ත්‍යාට මහළු ගුරුතුමිය කෙරේ ඇතිවූයේ කණගාටුවකි.

"එයා සමහරවිට ඉඳගෙන මෙහෙම කල්පනා කරනවා ඇති. 'තැපැල් දුව අද ඇවිත් නෑ. එයාට කම්මැලි කමක් හිතෙන්න ඇති'.... එක්කෝ...." ඈ අනපේක්ෂිතව යමක් ගැන සිතන්නට ගත්තාය.

තැපැල් බෙදීම අවසන් වූ විට මරීනා නැන්දා ආපසු ගියාය. නාස්ත්‍යා නගරයෙන් පිටතට දිව්වාය. ඈ දිව්වේ ලස්සන කහ පැහැ හණ මල් සහ තිරිඟු වැවී තිබුණු කෙතටය.

එහි බොහෝ මල්ය. ඇයට තිබුණේ කඩා ගැනීම පමණය.

ගුරුතුමියට එදින තමන්ගේ තැපැල් පෙට්ටියේ තිබී හමුවූයේ වන මල් පොකුරකි. ගුරුවරිය ඉතා ප්‍රවේශමෙන් මල් මිටිය ගෙන මුහුණට ළං කළාය. ඇගේ මුහුණේ වූ රැළි වියැකී ගියේය. ඇගේ පෙනුම තරුණ කරවමින් ප්‍රීතිමත් සිනාවක් එහි ඇඳී ගියේය.

අලෙස් ශෂ්කොව්

නික් නූඩ්ල් ජනරාල් කෙනෙක් වූ හැටි

අපි සිව් දෙනෙක් සිටියෙමු. ලෙන් ග්‍රෝම්, පීට් ග්රුැක්, මම- එනම් ඩිමා වෙරෙස් සහ නික් නූඩ්ල්. නික් නූඩ්ල්ගේ සැබෑ නම වාස්යා රැඩ්කෙවිච්ය. එහෙත් අපි නිතරම වාස්යාට එක් එක් නම් වලින් කතා කළෙමු. ඒ ඔහු ඉවසා දරාගත් ලෙසින් ඇසිපිය හෙළන, විශාල ඇඳිරි ඇස් වලින් යුතු, ඉතා නිහඬ අයෙකු වීම නිසාය.

ඔහු විරෝධය පෑවේ නැත. ඒ එසේ කළේ නම් ඔහුට තවත් අමතර දවස් දහයක රාජකාරී කිරීමට ඔහුට ලැබෙන බව ඔහු දන සිටි නිසාය.

එසේම නික් නූඩ්ල් තිලතල නොදරූ අයෙක් විය. ජනරාල් ලෙන් ග්‍රෝම් පිටුපසින් පෙළට වැද බලකොටුවකට පසු බලකොටුවකට කඩා වදිමින් ප්‍රහාරයේ යෙදුණේ ඔහුය. ඔහු පිටුපසින් ගමන් ගත්තේ පීට් ග්රුැක්ය. අපේ මාණ්ඩලික ප්‍රධානියා වූ ඔහු බරතිව හති ලමින් යුද්ද ටැංකියක් සේ ඉදිරියට පෙරළෙයි. ඉන් පසුව පැමිණෙන මම ඩිවිෂනයේ කොමිසාර්ය. අපි සතුරු යුද අගල් වලට කෙළින්ම කඩා

වදින්නේ ප්ලාස්ටික් වතුර බෝතල් දමා ගසමින්, අපේ එම අත් බෝම්බවලින් සතුරු සෙබළු මැරී වැටෙතැයි සිතා ගනිමිනි.

සෑම සටනකටම පසු අපි මූල කඳවුරට පැමිණ පෙළ ගැසෙමු.

ඉන්පසු ලෙන් ග්‍රෝම්ගේ නිළධාරී පපුව මත යුද පදක්කම්- විවිධ පාටැති ලාංඡන- පළඳවමු.

නිළතල නැති නූඩ්ල් ගොළුව සිටගෙන සිටියි. ඔහු ලබන්නේ ප්ලාස්ටික් බොත්තමක හැඩයෙන් යුතු සුළු පදක්කමක් පමණකි. එවිට ඔහු "ආයෙත් ඒකමද?"යි කියමින් අඩු තරමේ කෝප්‍රල් තනතුරට තරම්වත් හරියන සම්මානයක් නැතිදැයි අසයි.

සිදුවූ එක් සිද්ධියක් නිසා නොවේ නම් මෙය මේ ලෙසින් දිගටම සිදුවන්නට ඉඩ තිබිණි.

හොඳින් හිරු පායා තිබූ එදින අපි ගඟ අනෙක් පැත්තේ සතුරු කොටු පවුරකට පහර දෙමින් සිටියෙමු. නික් නූඩ්ල් සිටියේ පියාට වහල සෙවිල්ලන්නට උදව් දෙමිනි.

ඒ නිසා අපේ අණ පිළිපදින්නට කිසිවෙක් නොවූහ. ඒ නිසා ලෙන් ග්‍රෝම් තදින් සුසුමක් හෙළා මෙසේ ප්‍රකාශ කළේය.

"මමම ඔත්තු සේවා සංචාරෙක යෙදෙනවා. තුඹලාට බකමූණු හූවක් ඇහුනාම කෙළින්ම ගඟ අනිත් පැත්තට පීනාපල්ලා..."

මනාපයෙන් තොරව ඇඳුම් ලෙහූ ලෙන් හිස පහත්ව නමාගෙන දියට පැන්නේය.

කෙතරම් දිය කඳක් විසිරී ගියේදැයි යත් සතුරු ඉවුරේ වූ තාරාවෝ බියපත්ව හඬා තැලූහ.

පීට් සහ මම තණ අතරෙහි වැතිර අණ දෙන නිළධාරියා දෙස බලා හුනිමු. එහෙත් අපට දැක ගත හැකි වූයේ රන්වන් දිය විසිරුම අතරෙහි ඔහුගේ දෑත් පමණෙකි.

එක් වරම ලෙන්ගේ දෑත් දියට ගැසීම නතර විය. ඔහු හරියටම අලුත් නියෝගයක් දෙන්නට මෙන් ගෙල දිගුකොට

ඉක්බිති දිය තුළට නොපෙනී ගියේය.

"එයා වතුරේ ගැඹුර කොච්චරද බලනවා" පීට් දැනුමැත්තෙකු සේ කීය.

ඉන්පසු ලෙන් යළි මතු වී දැත් වැනීය. අපට පැහැදිළිවම ඔහුගේ භයානක කෑ ගැසුම ඇසුනි.

"උදව් දියෝ....!"

භීතියට පත් අපි ඔහුට හඬ ගසමින් ඉවුරට දිව්වෙමු. ලෙන් තව දුරටත් උදව් ඉල්ලා කෑ ගැසුවේ නැත. ඔහු මොහොතකට උඩට මතු වී යළි ගිලී ගියේය.

අපි නූඩ්ල්ව දුටුවේ ඒ මොහොතේදීය. වේගයෙන් දිව ආ ඔහු ඇඳුම් පිටින්ම දියට පැන්නේය. කඩිසරවත්, නිසැකවත් ඔහු අපේ අණ දෙන නිළධාරියාගේ හිස අපි අන්තිමට දුටු තැන දක්වා පිහිනීය.

නික් ද විනාශ වනු ඇතැයි භීතියට පත් පීට් සහ මම එතැනින් පැන දිව්වෙමු.

එයින් පසු සිදු වූයේ කුමක්දැයි අපට දැන ගන්නට ලැබුණේ ලෙන්ගේ නිවෙසේදීය.

නූඩ්ල් ලෙන්ව බේරාගෙන තිබුණි. ලෙන් ඉතා ඉක්මණින් අපේ මූල කඳවුරේ පෙනී සිටියේය.

ඔහු දොම්නස් ලෙසින් අණ දුනි.

"පිහිටුම් වලට යනු! ගමන් කරනු!"

දෑස් පහත් කොට ගත් අපි උද්යෝගයෙන් තොරව අපේ අණ දෙන නිළධාරියා අනුගමනය කළෙමු. මගේ දෙකන් ලැජ්ජාවෙන් දැවිණි.

ඒ අතරෙහි පීට් තහයෙන් හුස්ම අදිමින් දූවිල්ලෙන් වැසුණු සපත්තු දෙස බලා හුනි.

දුරින් සිට අප දෙස බලමින් දිව ආ නූඩ්ල් පෙරසේම සීරුවෙන් සිටගති.

"පහසුවෙන් සිටින්!" යි කී ලෙන් අත වනමින් අප දෙසට හැරී සැර පරුෂ ලෙසින් හඬ නැගීය.

"දැන් අපේ අණ දෙන නායකයා වාස්යා රැඩ්කෙවිච්. අපි ඔහුගේ සෙබළු. ඒක පැහැදිළිද? හරි එහෙනං!"

යළිත් වරක් අපි සතුරු බලකොටුවලට කඩා වැද බෙහෙත් පෙට්ටි සහ මැෂින් තුවක්කුද අල්ලා ගෙන ගංගා තරණය කළෙමු.

එහෙත් අපට අණ දෙන්නේ අපේ නව ජනරාල් තික් නූඩ්ල් විසිනි. ඔහු අපේ පපු මත පදක්කම් පැළැඳවීය. අපි ඔහුට ස්තුති කළෙමු.

කෝප්රල් තනතුරක්වත් ඉල්ලා සිටින්නට තරම් නිර්භය කමක් අපට නොතිබිණි.

පාවෙල් ටිකවෙච්

උපදෙස්

උදෑසනදී ව්ලැඩිමීර් ලෙනින් කම්කරු හා ආරක්ෂක මණ්ඩලයේ සැසිවාරයක් මෙහෙයැවීය. * එය සිතුවාට වඩා දිගු වේලාවක් ගත්තේය.

සැසිවාරයෙන් පසු ලෙනින් කෙළින්ම ගියේ මොස්කව්හි කම්හලක කම්කරු රැස්වීමකටය. දින ගණනාවකට කලින්ම කම්කරුවෝ ලෙනින්ට තමන් අමතන ලෙස ආරාධනා කොට තිබුණහ.

ඔහු ආපසු පැමිණි විට කාර්යාලය තුළටවත් ළඟාවන්නට කාලය නොදී දුරකතන ක්‍රියාකරු ඔහුට මෙසේ වාර්තා කළේය.

"බටහිර පෙරමුණේ අණදෙන නිළධාරී දුරකතනයේ ඉන්නවා"

ලෙනින් සෑම දෙයක් ගැනම විමැසීය: ඔවුනට අත්‍යාවශ්‍ය ආයුධ සහ පුපුරන ද්‍රව්‍ය තිබේද, ආහාරවල සහ නිළ ඇඳුම් වල තත්ත්වය කෙසේවීද... අන්තිමේදී ඔහු මෙසේ කීය.

"හැමදේටමත් වැඩිය මිනිස්සුන්ව රැක බලාගන්න"

ඉක්බිති රැවුළ පැසුණු මහළු මිනිසෙක් විසින් මෙහෙයැවූ

* මේ කතාව සිදුවූයේ 1918දී රුසියාවේ සිවිල් යුද්ධ සමයේදීය.

ගොවි නියෝජිතයෝ කීප දෙනෙක් පැමිණියහ.

"කරුණාකර ඇතුළට එන්න සහෝදරවරුනි, ඉඳගන්න" ලෙනින් ඔවුනට ආරාධනා කළේය.

"සමාවෙන්න, අපි හිටගෙන ඉන්නම්" රැවුළ පැසුණු ගොවියා පිළිතුරු දුනි.

"ඒ මොකෝ? හිටගෙන ඉඳිල්ලෙන් කිසිම ඥානවන්ත කමක් ඇති කෙරෙන්නෙ නෑ නේද?" ලෙනින් ගොවීන් ඇමතීය.

ඔවුහු සිනාසී පුටුවල හිඳ ගත්හ.

පළමුවෙන් කතා කළේ මහළු මිනිසාය. ඔහුගේ නම ඉවාන් අන්ද්‍රෙයෙවිච් විය.

"අපි ආවේ අපේ ගමේ සෝවියට් සභාව ගැන පැමිණිලි කරන්නයි ව්ලැඩිමීර් ඉලීච්. අපි අලුත් පල්ලියක් හදන්න ගඩොල් සූදානං කළා. ඒ ගොල්ලෝ ඒවා අරගත්තා..."

"ඒවා අරගත්තා? ඔය ගොල්ලන්ට අලුත් පල්ලියක් ඔච්චරටම ඕනැද?"

"මෙහෙමයි... කොහොමද මේක කියන්නෙ කියලා මට තේරෙන්නෙ නෑ..."

"ඔහේ හිතන්නෙ මොකදැයි කියලා විතරක් කියන්න"

"මහළු ගම්මුන්ට යාඥා කරන්ට කොහේට හරි යන්ට සිද්ද වෙනවා. ඒත් තරුණ ඇයො පල්ලි යන්නෙ නෑ. ඒ අයට ඕනෑ පොත්"

"ඕන්න පේනවනේ, ඒ අයට ඕනෑ පොත්. පරණ එකක් වුණත් ඔහේලට පල්ලියක් තියෙනවා. ඒත් කොහෙත්ම ඉස්කෝලයක් හෙම නෑ නේද?"

"ඒක නං ඇත්ත..."

කතා බහ අවසානයේ තීරණයකට එළැඹිනි. ඒ අනුව ලෙනින් ගඩොල් ආපසු දෙන ලෙස සෝවියට් සභාවට නියෝග කරනු ඇත. ඒ අතර ගොවීහු අලුත් පල්ලියක් සහ පාසලක් ගොඩ නගනු ඇත.

ලෙනින් උණුසුම් ලෙස ගොවීනට සමුදුනි.

ඉන්පසු ගොඩ වැදුනේ ක්‍රිෂනොව්ස්කිය. ඒ රට විද්‍යුත්කරණය කිරීමෙහි ප්‍රශ්න සාකච්ඡා කරන්නටය.

ව්ලැඩිමීර් ඉලීච් මේසයට හිඳ ගත්තේ සවස හතර පසුවුණාට පසුව පමණකි. ඔහු එක හා සමාන අත් අකුරින් ලියාගෙන ගියේය.

"අද මම තරුණ කොමියුනිස්ට් සංගමයේ මූලික කාර්යභාරයන් ගැන සාකච්ඡා කරන්නට කැමැත්තෙමි...." ලෙනින් ලිවීම නතර කළේය.

ඔහු දෑස් කඩදාසියෙන් ඉවතට ගෙන සිතන්නට විය. 'තරුණ' යන වදන ඔහුගේ මතකයට තමාගේම ළමා වියත් පාසල් කාලයත් ගෙන ආවේය.

ඔහු මහත් ප්‍රීතියෙන් ගෙය තුළට දිව ගියේය. පියාගේ අධ්‍යයන කාමරයේ දොර හැර තිබිණි. ඉල්යා නිකොලායෙවිච් වැඩ කරමින් හුනි. අධ්‍යයන කාමරය තුළට වන් ව්ලැඩිමීර් ඉක්මන් වාර්තාවක් දුනි.

"ග්‍රීක් භාෂාව- විශිෂ්ඨයි! ජර්මන් භාෂාව- විශිෂ්ඨයි! වීජ ගණිතය- විශිෂ්ඨයි!"

ඔහුගේ පියා මහත් සතුටට පත්ව තිබිණි.

"වීජ ගණිතය- විශිෂ්ඨයි!" ලෙනින් හඬ නඟා පවසා සිනාසුනි. "නෑ මගේ කටහඬ ඒ කාලේ මීට වෙනස්"

පුටුවෙන් නැගී සිටි ඔහු ජනේලය වෙත ගියේය. ජනේලය තුළින් ඔහුට දකගත හැකි වූයේ ක්‍රෙම්ලින් අංගනයේ ත්‍රිත්ව කුළුණය. කුළුණ සාදා තිබුණේ සියවස් ගණනක් පවතින්නටය. ලෙනින් එහි සුන්දරත්වයත්, සරත් දිනයේ සුන්දරත්වයත් අගැයීය.

ඔහුගේ ලේකම්වරිය ඇතුළට පැමිණෙනු ඔහුට ඇසුනේ නැත.

"සමාවෙන්න ව්ලැඩිමීර් ඉලීච්, මෙන්න ලියුම්"

"කරුණාකරලා ඒවා මේසේ උඩින් තියන්න ලීඩියා අලෙක්සැන්ද්‍රොව්නා. මං ඒවා ගැන තව පොඩ්ඩකින් බලන්නං" ලෙනින් කීවේ ජනේලයෙන් ඉවතට නොහැරෙමිනි.

මාහැඟි කුළුණ මගින් වශීව ලෙනින්ට සියල්ල අමතකව ගියාක් සේ පෙනිනි. එහෙත් එය එසේ නොවීය. කුළුණ

දෙස බලා සිටිමින් ඔහු සිතමින් සිටියේ වැඩ අරඹා තිබූ තරුණ කොමියුනිස්ට් සංගමය වෙත කිරීමට ඇති ඔහුගේ කතාව ගැනය. එය තරුණ කොමියුනිස්ට්වරුන් මුහුණ දෙන කාර්යභාරයන් පිළිබඳවය.

එදා 1917 දී වැඩිහිටියන් අරඹා තිබූ වැඩ කටයුතු සම්පූර්ණ කිරීමත්, කොමියුනිස්ට්වාදය ගොඩනැගීමත් බාර වී ඇත්තේ අද පිරිමි හා ගැහැණු ළමුන්ටය. සාර්ථකත්වය රැඳී ඇත්තේ ඒ මතය....

දොරට තට්ටු කිරීමකි. ලේකම්වරිය යළිත් ඇතුළට ආවාය.

"ව්ලැඩිමීර් ඉල්යිච්, නදේශ්දා කොන්ස්තන්තිනෝවා කතා කරනවා. රෑ කෑම ලෑස්තියි"

"රෑ කෑම?" ලෙනින් විමතියට පත්ව සාක්කු ඔරලෝසුව ගෙන බැලීය.

වෙලාව සවස හතර පසුවී තිබිණි. ඔහු ලීඩියා අලෙක්සැන්ද්‍රොව්නාට මෙසේ කීය.

"එයාට කියන්න මං ඉක්මණට එනවා කියලා. මං දැන් එනවා"

ලියන මේසය ළඟ නතර වෙමින් ලෙනින් ලියුම් දෙස බැල්මක් හෙළීය. ලොකු අළුපාට ලියුම් කවරයක් ඔහුගේ අවධානය ඇද ගත්තේය.

"මොස්කව් වල ව්ලැඩිමීර් ඉලීච් ලෙනින් සීයාට" යන්න ළමා අතකින් ලියනු ලැබ තිබිණි.

ඊට මඳක් පහතින් මෙසේ විය. "මොගිලෙව් ගුබේර්නියාවේ වසිල් ඇඩම්චික් ගෙනි"

සිනා පෑ ලෙනින් ලියුම් කවරයද, ප්‍රව්දා පුවත් පතද අතට ගති.

"මොනවා හරි දෙයක් තිබුණොත් මට ගෙදරට කතා කරන්න" ඔහු ලීඩියා ඇලෙක්සැන්ද්‍රොව්නාට කීය.

රාත්‍රී කෑමෙන් පසු විනාඩි කීපයක විවේකයක් තිබිණි. පුවත් පත දිග හැර ගත් ලෙනින් ජනේලය අසළට පුටුව ගෙන ගියේය. කාමරය තුළ තරමක් අඳුරුය. එහෙත් එවිට

ඔහුට ලිපිය සිහිපත් වී පුවත්පත පසෙකට කළේය. කතුරකින් ප්‍රවේශමෙන් ලියුම් කවරය කෙළවර කැපූ ලෙනින් එතුළින් ලිපියක් හා චිත්‍රයක් එළියට ගත්තේය. එහි වූයේ අසිපත ලෙලවමින් වේගයෙන් ඇදෙන අසරුවෙකි. සතුරෝ ඔහු වෙතින් පළා යමින් සිටිති. ඔවුනට කිසිදු බේරීමක් නැත.

චිත්‍රය යටින් මෙසේ ලියැවිණි. "වේගයෙන් කඩා වදින ලෙනින් නයට්වරයා"

"නාද්‍යා"ලෙනින් නදේශ්දා කොන්සතන්තිනෝවාට අඬ ගැසීය. "බලන්නකෝ! මං දන් නයිට් කෙනෙක්!"

ලෙනින් මහ හඬින් සිනාසුනි. නදේශ්දා කොන්ස්තන්තිනෝවා ද චිත්‍රය දෙස බලා සිනාසුනාය. ඉන්පසු ඇ "මේ කලාකාරයාට හැකියාව තියෙනවා. එයා ඉගෙන ගන්න ඕනෑ!" යි කීවාය.

"ඔව්, ඉගෙන ගන්න ඕනෑ...."

"එයා කොහේ කෙනෙක්ද?" නදේශ්දා ලියුම් කවරය ගත්තාය. "ඒකෙ තියෙන්නෙ දිස්ත්‍රික්කෙ විතරයි. සම්පූර්ණ ලිපිනයම නෑ"

"සමහරවිට එයා එයාගෙ ලියුමේ එයාගෙ ලිපිනය ලියලා ඇතිවත්ද?"

ලියුම දිග හැරි ලෙනින් කියවන්නට විය.

"ආදරණීය ලෙනින් සීයේ! මේ ලිපිය ලියන්නේ මොගිලෙව් ගුබේර්නියාවේ වසිල් ඇඩම්චික් විසින්. ඔක්කෝටම පළමුවෙන් මගේ අම්මා අන්නාටත්, අපේ ගමේ ගැමියන් හැමෝටමත්, මටත් ඕනෑ කරන්නේ ඔබට අපේ සුභ පැතුම් එවීමටයි.

මං පින්තූරෙකුත් එවලා ඇති. මගේ අම්මා කියනවා ඒක හොඳයි කියලා. ගමේ සෝවියට් සභාවේ සභාපති ස්තෙපාන් මාමාත්, එයාගේ බිරිඳ අව්දොත්‍යා නැන්දාත් පින්තූරෙට කැමතියි. ස්තෙපාන් මාමා මට ප්‍රශංසාත් කළා. එයා මෙහෙම කිව්වා. 'බොහෝම හොඳයි වසිල්. ඔයා ලෙනින් හරියටම පින්තූරෙට අරන් තියෙනවා'

ස්තෙපාන් මාමා දන්නවා. මොකද එයා ඔයාව දැකලා තියෙනවානේ. ඒ පේත්‍රෝග්‍රාද් වලදී. ඔයා සන්නද්ධ රථයක් උඩ ඉඳලා කතා කළාලු.

මට ඕන වුණේ ඒ වගේ චිත්‍රයක් අඳින්නයි. ඒත් මං කවදාවත් සන්නද්ධ රථයක් දැකලා නෑ.

ආදරණීය ලෙනින් සීයේ, ස්තෙපාන් මාමාට ලියුමක් එවන්න මාව රතු හමුදාවට බන්දවා ගන්න කියලා. මට ඕනෑ පෝසතුන්ට විරුද්ධව සටන් කරන්න.

ගමේ කට කතාවක් තියෙනවා ගමේ හිටපු ඉඩං අයිතිකාර ලිස්නියාන්ස්කි බොහෝම ඉක්මණට ආපහු ඒවි කියලා. එයා ඔක්කෝම අපේ ඉඩං අරගෙන මගේ පොත්, පැන්සල් පුච්චලා දාවි. මාව එයාගෙ ඌරු කොටුව බලාගන්න දමාවි.

මං ස්තෙපාන් මාමාගෙන් ඇහුවා. එයා කියනවා 'ඔයා මුලින් ලොකු මහත් වෙන්න ඕනෑ. දන් තියෙන්නේ ඔය ගොල්ලන්ට ඉගෙන ගන්න වෙලාව. අපි ඉක්මණට ගමේ ඉස්කෝලයක් අරිනවා. ඔයාට පුළුවනි එහේදි පොත්පත් එක්ක සටන් වදින්න' කියලා. කරුණාකරලා අපේ සභාපති ස්තෙපාන් මාමාට ලියන්න මාව රතු හමුදාවට බන්දා ගන්න කියලා.

ලෙනින් සීයේ ඔබට සුභ පැතුම්!

වසිල් ඇඩම්චික්"

ලියුම කියවීම අවසන් කළ ලෙනින් මෙසේ කීය.

"සභාපති ස්තෙපාන් හරි. මේක තරුණ ජනයාට පොත් පත් එක්ක සටන් වදින්න වෙලාව. ලිපිනයක් නැති එක තමා ලැජ්ජාව. නාද්‍යා, මං යන්න ඕනෑ"

අධ්‍යයන කාමරයේ ලියන මේසයට හිඳගත් ලෙනින් තවදුරටත් ලියාගෙන ගියේය.

ලෙනින්ගේ අධ්‍යයන කාමරයේ ආලෝකය දිගු වේලාවක් තිස්සේ දැල්විණි.

ලෙනින් සිටියේ බෙලොරුසියානු වසිල් දරුවාට, ඔහු වැනි වූ දස ලක්ෂ ගණනක් දරුවන්ට දැරියන්ට, ඔවුන්ගේ වැඩිමහල් සහෝදර සහෝදරියන්ට, මුළුමහත් අනාගත පරපුරුවලට උපදෙස් සූදානම් කරමිනි.

"පොදුවේ තරුණ ජනයාගේත්, විශේෂයෙන් තරුණ කොමියුනිස්ට් සංගමයේත්, සියළු සංවිධානවලත් කාර්යභාරය එක් තනි වදනකින් ප්‍රකාශ කළ හැකි වනු ඇත: හදාරන්න!"

අපේ ආඩම්බරය හා ප්‍රීතිය වන්නේ ළමුන් ය. ඔවුන් අපේ බලාපොරොත්තුව හා අනාගතය ය. අපි ඔවුන්ට අපට දිය හැකි හොඳ ම දේ දෙන්නෙමු. අපි ඔවුන්ගෙන් ආපසු බලාපොරොත්තු වන්නේ රටට ආඩම්බරයක් වන සේ වැඩීම ය. බෙලෝරුසියාවේ විවිධ වකවානුවල ජීවත් වූ ලේඛකයින් විසින් මෙහි එන සියලු කතා ලියා ඇත්තේ ඒ අරමුණ ඇතිව ය. ඒවා සිංහලට පරිවර්තනය කොට ප්‍රකාශයට පත් කරන්නේ ද ඒ දැක්ම ම හා අරමුණ ම ඇතිව ය.

සිතුවම් සැලසුම්
මිහායිල් ක්‍රකොව්ස්කි

මිල රු.250/-

සයුරි ප්‍රකාශන
ISBN -978-955-1889-19-7
102/176, නිවාස සංකීර්ණය පාර,
මත්තෙගොඩ.
දුරකථන : 0715 181421 ෆැක්ස් : 0112-844961
0115-676483